

R. L. STINE ගේ

wanted the haunted mask

කතාවේ සිංහල පරිවර්තනය

# සොහොන් බිමේ ශාපය

පරිවර්තනය

## තත්සරණී සතරසිංහ

නිපුන් පොතක්

Scanned by CamScanner

R. L. STINE ගේ
wanted the haunted mask
කතාවේ සිංහල පරිවර්තනය

# සොහොන් බිමේ ශාපය

Scanned by CamScanner

## කර්තෘගේ වෙනත් කෘති

අපේ ජනකවි සහ එන්නම් දහ අට
ඇඹුම මිහිර සාමාන්‍ය දැනීම
මෙලු භාෂා පුහුණුව
දෙමළ උගනිමු - 1
දෙමළ උගනිමු - 2
දෙමළ උගනිමු - 3
සූප ශාස්ත්‍ර සංග්‍රහය
මිස්ටර් මෙඩිල්ගේ මිදුම් සවාරිය
කරදරකාර මිස්ටර් මෙඩිල්
මිස්ටර් මෙඩිල්ට වැරදීමක්
මිස්ටර් පින්ක් විස්ල්ගේ සාදය
ඇවිදින සෙල්ලම් බඩු
පීටර් පැටර්ගේ නැටුම
එන රෝදේ ඔරලෝසුව
රතු පාට පුංචි හූනයා
අරුම පුදුම මැජික් බේසම
අපූරු සාදය
බින්කල් සහ ෆ්ලිප්
අදෘශ්‍යමාන මිස්ටර් පින්ක් විස්ල්
හිම කලාපේ අපූරු නිවසක්
හොලි ගස යට සැඟවූ රහස
ගස උඩ නවාතැනේදී
කඳු මුදුනක ගරා වැටුණු නිවසේදී
අපූරු ප්‍රහේලිකාවක්
මාර්ස් ගබඩාවේ රහස් කල්ලිය
වැලි පතලේදී හමුවූ ආගන්තුකයා
බාටිලට් මන්දිරයේ උද්‍යාන පාලකයා
වෙස් වළාගත් පාසල් දැරිය
හුදෙකලා කන්දේ වයලින් වාදකයා
පඹයාගේ අභිරහස
ගරා වැටුණු මන්දිරයේ අභිරහස
ටොලිගේ පුරතල් අශ්වයා
ජෙනරාල්ගේ වීර පදක්කම්
වාසනාවන්ත මුවුනි
ප්‍රතිමාව තුළ සැඟවුණු සොර කල්ලිය
මුහුදු කොල්ලකාර නෞකාවේ අභිරහස
හොලිවුඩ් පුරයේ අභිරහස
පැසි පන්දු පිටියේ අභිරහස
හොල්මන් මන්දිරයේ අභිරහස
ගිම්හාන කඳවුරේ අභිරහස
ෆර්නෝ හෙවත් ගිනි මකරා
ආක්වා හෙවත් කඳුකර යෝධයා
සර්ප්‍රොන් හෙවත් මුහුදු සර්පයා
කේමොන් හෙවත් බලු අවතාරය
නාගා හෙවත් මුහුදු අවතාරය
ටස්ක් හෙවත් මැමත් අවතාරය
ස්ටින්ග් හෙවත් ගෝනුසු අවතාරය
නැනුක් හෙවත් හිම අවතාරය
නිර්භීත රමෝනා
ඩොක්ටර් ඩූලිටිල් සහ ඕලොසම්ගේ සර්කස්
ඩොක්ටර් ඩූලිටිල් සහ පාවෙන දූපත
ඩොක්ටර් ඩූලිටිල් සහ තවත් කතා
හරිතාගාර සොරකම
පාළු දූපතේ ප්‍රදීපාගාරය
රුක්ස ගස උඩ රහස් කාමරය
නින්දෙන් ඇවිදින පාසල් දැරිය
අතුරුදහන් වූ කබා බොත්තම
අලුත් පාසලේ අපූරු කතාවක්
සැඟව සිටි වීරයා
දඟකාර කැන්ගරු පැටියා
කීකරු ගොපළු දරුවා
මිටියාවතේ පුංචි නිවස
ගංතෙරේ නවාතැන
ශූකා හෙවත් වෘක අවතාරය
ටෙටුක්ස් හෙවත් මඩවගුරේ කිඹුලා
බියකරු අයිස් අශ්වයා

Scanned by CamScanner

# පෙරවදන

"සොහොන් බිමේ ශාපය" නමැති මෙම කතාව R.L.Stine ගේ 'Wanted the haunted mask' කතාවේ සිංහල පරිවර්තනයයි.

සියලු ශාන්තුවරයින්ගේ.සැදෑ සාදයකට සහභාගි වන්නට යන දැරියකට භයානක වෙස් මුහුණක් හමු වේ. වෙස් මුහුණ පැළඳගත් පසු වෙස් මුහුණේ යක්ෂ බලයට යටත් වන දැරිය කුරිරු ක්‍රියාවන් රැසක් සිදු කරයි. මේ අතර ඇයගේ මිතුරා වගා බිමක පදිංචියට යයි. වගා බිම වසර කිහිපයකට පෙර තිබූ සොහොන් බිමක් මත තැනූවකි. සොහොන් බිමේ ශාපලත් ක්‍රියාවන් හා වෙස් මුහුණේ යක්ෂ බලය එකිනෙක ගැටෙන ත්‍රාසජනක සිදුවීම් රැසකින් සමන්විත මෙම කතා පුවත පාඨක ඔබගේ සිත් ගනු නොඅනුමාන ය.

මෙම පොත එළිදක්වන මේ මොහොතේ මගේ නිර්මාණකරණයේදී මට නිබඳවම උදව් උපකාර කරන ආදරණීය අප්පච්චි, අම්මා, කාවින්ද මල්ලි සහ පමෝදා නංගීව සෙනෙහසින් සිහිපත් කරන අතර මෙම පොත මනා නිමාවකින් යුතුව මුද්‍රණය කළ පියසිරි ප්‍රින්ට් සිස්ටම් ආයතනයට මෙන්ම, මෙය ප්‍රකාශනය කළ නිපුන් ප්‍රකාශන අධිපතිතුමා ඇතුළු කාර්ය මණ්ඩලයට ද මගේ ස්තුතිය පිරිනමමි. එමෙන්ම මා ධෛර්යමත් කරමින් මා වෙත ලිපි යොමු කරන පාඨක ඔබට ද මගේ ස්තුතිය.

තත්සරණී සතරසිංහ

"සඳ සෙවන",
උඩගම,
අටබාගේ

Scanned by CamScanner

# 01

වෙළඳසැලේ දොරට ඉහළින් වූ සීනුව නාද විය. අනතුරුව දොර විවර කර ගත් කාන්තාවක් සහ කුඩා දැරියක් වෙළඳසැල තුළට ඇතුළු වූහ. ඔවුන්ගේ දෑස් වෙළඳසැල තුළ වූ වෙස්මුහුණු රඳවා ඇති රාක්ක මත එහා මෙහා දිව ගියේය.

විලියම් පිහාටුවලින් සැකසූ දූහුවිලි පිසිනය පහත් කර වෙළඳසැලේ ඉදිරිපස වෙත හැරුණේය. ඔහු සිටියේ කුමාරිකාවන්ගේ වෙස් මුහුණු සහිත රාක්කයේ දූහුවිලි පිස දමමිනි. ඒවා ඉතා අගනා හෙයින් දිනපතාම දූහුවිලි පිස දැමිය යුතුම විය.

කුමරියන්ගේ වෙස් මුහුණු පමණක් නොව සෑම වෙස් මුහුණක්ම ඔහුට ඉතා අගනේ ය. එම නිසා ඔහු ඒවා බලා කියා ගත්තේ ඔහුගේම දරුවන් මෙනි.

කාන්තාව සහ දැරිය වෙළඳසැලට ඇතුළු වන විට හැන්සල් හිස ඔසවා බලා අවට ඉව කළේය. ජර්මන් ෂෙපර්ඩ් වර්ගයේ බල්ලෙකු වූ හැන්සල් තම නින්දට සිදු වූ බාධාවට නොකැමති විය. නමුත් පාරිභෝගිකයන්ගේ පැමිණීම විලියම් තුළ ඇති කළේ සතුටකි.

''එන්න.'' ඔහු කතා කළේය. වයස අවුරුදු හැත්තෑවක් වුවද තවමත් ඔහුගේ කටහඬ තරුණ ජවයෙන් යුතු විය. ඔහුගේ උඩු රැවුල මෙන්ම ඝන කෙස් වැටිය ද තැනින් තැන සුදු පැහැ වී තිබිණ. නමුත් ඔහුට වූයේ තියුණු දෑසකි. ඔහුට තරුණයෙකුට මෙන් ශක්තිය තිබිණ.

ඔහු පිහාටු දූහුවිලි පිසිනය පසෙකින් තබා අභිරහස් බැල්මක් හෙළුවේය. ''විලියම්ගේ වෙස්මුහුණු රාජධානියට පිළිග න්නවා.'' ඔහු කුඩා දැරියට සිනාවක් පෑවේය.

Scanned by CamScanner

ගැහැනු ළමයා කළු පැහැ වරලසක් හිමි සුන්දර දැරියකි. ඇය රෝස පැහැ සායකින් සහ එයටම ගැළපෙන රෝස පැහැ ස්විටරයකින් සැරසී සිටියාය. "ඔයා ආවේ වෙස් මුහුණක් ගන්නද...?"

"ඔලිවියාට වෙස් වළාගත්ත සාදයකට යන්න ඕන." දැරියගේ මව කීවාය. "නගරයේ හොඳම වෙස් මුහුණු වෙළඳසැල තියෙන්නේ ඔයාට කියලා අපට අහන්න ලැබුණා."

විලියම් හිස නැමුවේය. "මමත් එහෙම හිතනවා. ඒ වගේම මෙතන හරිම පරණ තැනක්. මේ වෙළඳසැල මගේ පවුලට අයිති වෙලා තියෙන්නේ පරම්පරා තුනක් තිස්සේ."

ඔලිවියාගේ දෑස පළමු රාක්කය මතම වූ රවුම් ඌරු මුහුණකින් යුත් වෙස් මුහුණක් වෙත යොමුව තිබිණ. එහි වර්ණය ඇයගේ සායට සහ ස්විටරයට හොඳින් ගැළපිණ. "ඒක ඇත්ත මළුවක්ද...?" ඇය වෙව්ලන හඬින් ඇසුවාය.

විලියම් සිනාසුණේය. "නැහැ. ඒක රබර්වලින් හදලා තියෙන්නේ... ඔයා ඒකට කැමතිද ඔලිවියා...? මමයි ඒක හැදුවේ."

ඔලිවියා හිස සෙලෙව්වාය. "නැහැ... මට ඕන නැහැ ඌරෙක් වෙන්න."

ඇයගේ මව කුමාරිකාවන්ගේ වෙස් මුහුණු සහිත රාක්කය වෙත ගියාය. "මේවා හරිම ලස්සනයි ඔලිවියා. මේ බලන්න."

ඔලිවියා බල්ලාගේ වටෙන් මව ළඟට ගියාය. "මොකක්ද ඔයාගේ බල්ලාගේ නම...?"

"හැන්සල්..." විලියම් කීවේය. "එයා හොඳ බල්ලෙක්. ඒත් එයා කැමති නැහැ වෙස් මුහුණුවලට. ඒ නිසා එයා කරන්නේ දවස තිස්සේම නිදා ගන්න එක." විලියම් කුමරියකගේ වෙස් මුහුණක් ඇය අතට දුන්නේය. "මේක දාලා බලන්න. ඔයාගේ අඳුරු පාට කොණ්ඩෙට මේක හොඳට ගැළපෙයි."

ඔලිවියා කුමරියන්ගේ වෙස් මුහුණු හතරක් පැළඳ බැලුවාය. ඉන්පසු ඔවුහු මුලින්ම විලියම් අතට දුන් කුමරියකගේ වෙස් මුහුණ මිලදී ගත්හ. විලියම් එය දුඹුරු කඩදාසියක ඔතා

Scanned by CamScanner

දුන්නේය. "හොඳට විනෝද වෙන්න." ඔහු කීවේය.

ඔවුන් පිටව ගිය පසු විලියම් විදුලි පහන් නිවා දැමුවේය. "යමු හැන්සල්... ගෙදර යන්න වෙලාව හරි."

හැන්සල් හිස එසවූවද නැගිට්ටේ නැත. විලියම් බල්ලාගේ සිරුර වටා දැත යොමා බල්ලා නැගිටවූයේය. "ගෙදරට පොඩි දුරක් තියෙන්නේ... අපි ගෙදරට ගියාම ඔයාට හොඳට නිදා ගන්න පුළුවන්."

ඔහු විශාල බල්ලා පිටතට ඇදගෙන ගොස් වෙළඳසැල අගුලු දැමුවේය. ඒ වනවිට කළුවර වැටී තිබිණ. අහස වැහි වළාකුළුවලින් බරව ඇති බවක් දැකිය හැකි විය. මීදුමක් සිරුර වෙළාගනිද්දී ඔහු නිවස බලා ගමන් ඇරඹුවේය.

විලියම් වෙව්ලමින් ඇඳ සිටි කළු පැහැ ලෝගුව සිරුර වටා හොඳින් තද කර ගත්තේය. හැන්සල් ද ඔහු සමගම පැමිණියේය.

"පුදුම මීදුමක්නෙ." ඔහු බල්ලාට කීවේය. "මට යන පාරවත් පේන්නේ නැහැ. වාසනාවට ඔයාට කකුල් හතරක් තියෙන්නේ... ඒකෙන් ඇවිදින්න ලේසියි."

මීදුම ඝන තිරයක් ඇද්දාක් මෙන් විය. පාර පුරා වූයේ දැඩි නිහඬතාවයකි. නිවාස කිහිපයක් පසු කළ බල්ලා එක්වරම නතර වූයේය. හැන්සල්ගේ උගුරෙන් පහත් ගෙරවිමක් නැගෙන්නට විය. බල්ලාගේ පිට මත ලොම් ඍජු වී ඇති බව විලියම්ට පෙනිණ. ඔහු පහත් වී හැන්සල්ගේ හිස අත ගෑවේය. "ඇයි දරුවා...? මොක්ටද ඔයා බය වුණේ...?"

බල්ලා පෙරට වඩා බිහිසුණු ලෙස ගෙරවූයේය. එවිටම තමාට පිටුපසින් අඩි ශබ්දයක් විලියම්ට ඇසිණ. හැරී බැලුවද සුදු පැහැ මීදුම නිසා ඔහුට කිසිවක්ම පෙනුණේ නැත. බල්ලා ගෙරවූයේය. අඩි ශබ්දය නතර විය.

"කවුද ඔතන...?" විලියම් කතා කළේය. "කවුද ඔය...?"

Scanned by CamScanner

# 02

පිළිතුරක් ලැබුණේ නැත.

එක් අතක් බල්ලාගේ හිස මත තබාගෙනම විලියම් හොඳින් සවන් දුන්නේය. නමුත් ඔහුට ඇසුණේ මීදුම අතරින් හමා යන සුළඟේ නාදය පමණි.

"කවුරුවත් නැහැ හැන්සල්..." නමුත් බල්ලා අනතුරු ඇඟවූයේය.

විලියම් නැවතත් ඇවිද යන්නට වූයේය. යළිත් තමා පිටුපසින් එන අඩි ශබ්දයක් ඔහුට ඇසිණ. හැන්සල් ගොරවන්නට විය.

විලියම් හැරී බැලුවේය. "කවුරුහරි ඉන්නවද...? මීදුම නිසා මට ඔයාව පේන්නේ නැහැ."

නිශ්ශබ්දතාවයකි.

මහලු මිනිසාට බියක් දැනිණ. "කවුරුහරි ඉන්නවද...? අනේ එහෙනම් කතා කරන්න."

පිළිතුරක් නොලැබිණ.

නිවසට ළඟා වී දොර විවර කරගෙන නිවසට ඇතුළු වූ පසු ඔහුට සතුටක් ලැබිණ. හැන්සල් සිරුරේ තැවරී ඇති මීදුම ඉවත් කිරීමට මෙන් තම සිරුර ගැසුවේය. විලියම් දොර වසා අගුලු දැමුවේය.

ඔහු බල්ලාට කෑම දී තමා ද ආහාර ගත්තේය. ඉන්පසු ඔහු වෙස් මුහුණු සැකසීම ආරම්භ කළේය. හැන්සල් ඔහුගේ සුවපහසු මුල්ල වෙත ගියේය.

"අද රෑ අපි මොකද කරන්නේ...?" විලියම් මිමිණුවේය. "හැන්සල්... මට අලුත් දුඹුරු ලොම් ටිකක් ලැබුණා. මට පුළුවන් ඒකෙන් ලස්සන වඳුරු වෙස් මුහුණු ටිකක් හදලා විකුණන්න."

විලියම් සතුව ඒ වනවිටත් කලින් සකසන ලද වඳුරු හිස්

Scanned by CamScanner

හැඩයේ සුදු පැහැති වෙස් මුහුණු කිහිපයක්ම තිබිණ. මෙම රැයේ ඔහුට කිරීමට තිබුණේ ඒවාගේ ගම් තවරා ලොම් ඇලවීම පමණි.

ඔහු තමාටම මුහුණම්න් වැඩ පටන් ගත්තේය. හැන්සල් මුල්ලට වී නිහඬව සිටියේය.

එක්වරම දොරට ගසන හඬ ඇසිණ.

බල්ලා වහා හිස එසවූයේය. කිසිවෙකු ඉදිරිපස දොර වෙත පැමිණ ඇති බව විලියම්ට වැටහිණ.

ඔහු කරමින් සිටි වැඩ නතර කර දෑත පිසදා ගත්තේය.

දොරට ගසන හඬ තවත් වේගවත් විය.

"හරි... හරි... මම එනවා."

"මේ වගේ මීදුම පිරුණ සීතල රෑක කවුද එන්නේ...?" විලියම් සිතුවේය.

ඔහු දොර විවර කරන්නට පෙරම දොරට ගසන ශබ්දය නතර විය. දොරෙන් එහා පස සුළඟ වේගයෙන් හමා යන හඬ පමණක් ඇසෙමින් තිබිණ.

විලියම් දොරේ හැඩලය අල්ලා කැරකුවේය. දොර විවර විය. පැමිණ සිටි අමුත්තාව ඔහු දුටු සැනින් හඳුනා ගත්තේය. පුදුම වූ ඔහු කෑ ගැසුවේය.

"ඔයා මොනවද මෙහෙ කරන්නේ...?"

## 03

විලියම් ඉදිරියේ සිටගෙන සිටියේ තරුණයෙකි. "ඔහොමද ඔයා සහෝදරයාව පිළිගන්නේ...? මට ඇතුළට එන්න දෙන්නේ නැද්ද...?"

විලියම් පහ නොවූ පුදුමයෙන් යුතුවම සොහොයුරාට නිවසට ඇතුළු වීමට ඉඩ දී පසෙකට වූයේය. "රැන්ඩොල්ප්... මම ඔයාව අවුරුදු ගාණකින් දැක්කේ නැහැ."

"මම මේ මීදුමේම ඔයාගේ පිටිපස්සෙන් ආවා විලියම්...

Scanned by CamScanner

මගේ සහෝදරයා ජීවත් වෙන්නේ කොහෙද කියලාවත් මම දැනගෙන හිටියේ නැහැ.''

විලියම් රවා බැලුවේය. ''ගිය වතාවේ අපිට හොඳ මිත්‍රශීලී සම්බන්ධතාවක් තිබුණේ නැහැ. ඔයාට ඒක මතක ඇතිනෙ.''

''අතීතය අතීතයට ගිහින් ඉවරයි.'' රැන්ඩොල්ෆ් පිළිතුරු දුන්නේ ඉදිරිපස කාමරය තුළ වටපිට බලමිනි. ඔහු විලියම්ට වඩා උසැති අයෙක් විය. ඔහුගේ කෙස් වැටිය මෙන්ම උඩු රැවුල ද කළු පැහැති ය. ඔහු බරැති අළු පැහැ උඩුකය ඇඳුමක් පැළඳ සිටියේය. ඔහුගේ අතේ ද වෛද්‍යවරුන් භාවිත කරන අන්දමේ කළු පැහැ හම් බෑගයක් විය.

හැන්සල් සිටියේ ගොරවමිනි. ඔහු පහර දීමකට සූදානමින් හිස පහත් කරගෙන සිටියේය.

''මේ සතා තවම පණ පිටින් ඉන්නවා කියලා මට නම් විශ්වාස කරන්නත් බැහැ.'' රැන්ඩොල්ෆ් කීවේ පලිහක් මෙන් බෑගය තමා ඉදිරියට අල්ලා ගනිමිනි. ඔයාට පුළුවන්ද එයාගේ කෑ ගෙරවීම නවත්තන්න...?''

''හැන්සල් හොඳට මිනිස්සුන්ව අඳුන ගන්නවා.'' විලියම් කීවේය. ඔහුගේ දෑස සොහොයුරා වෙත යොමු විය.

''මම ඔයාට කිව්වානෙ විලියම්. අතීතය අතීතයට එකතු වෙලා ඉවරයි.'' රැන්ඩොල්ෆ් කීවේය. ''අපි සහෝදරයෝ... අපි අන්තිමට හමුවුණාට පස්සේ ලෝකේ ගොඩක් දේවල් වෙනස් වෙලා. සමහරවිට මගේ ගතිගුණත් වෙනස් වෙන්න ඇති.''

''සමහරවිට.'' විලියම් පිළිතුරු දුන්නේය. ඔහු හැන්සල්ට සන්සුන් වෙන්නට සංඥා කළේය.

බල්ලා ගෙරවීම නතර කළද තම දුඹුරු පැහැ ලොකු දෑසින් අමුත්තා අධ්‍යනය කරන්නට වූයේය.

රැන්ඩොල්ෆ් තම බෑගය විලියම්ගේ කුඩා කෑම මේසය මත තැබුවේය. ඉන්පසු බර කබාය ගලවා පුටුව පිටුපස එල්ලුවේය.

සොහොයුරාගේ ඇඳුම් ඉරී ඇති බව විලියම්ට දැකගත හැකි විය. ඔහුගේ ඇඳුමේ එක් සාක්කුවක් ඉරී තිබූ අතර කමිසය

ද අණ්ඩ දමා තිබිණ.

"එයාට සල්ලි ඕන වෙලා ඇති. එයා එන්න ඇත්තේ සල්ලි ඉල්ලන්න."

"රැන්ඩොල්ප්... ඔයා මෙහෙ ආවෙ ඇයි..?"

විලියම් ගේ සොහොයුරා දෑත එකිනෙක පිරිමැද ගනිමින් ඒවා උණුසුම් කර ගන්නට විය. ඔහු උරහිස් හැකිලුවේය. "එළියේ සීතලයි."

"ඔව්... ඔයා මෙහෙ ආවේ මට කාලගුණ වාර්තාව අරගෙ නද...?"

"ඔයා නපුරු වචන පාවිච්චි කරන්නේ සහෝදරයා... මම මෙහෙට ආවේ ඔයාට උදව් කරන්න... මම ආවේ ඔයාට ජනප්‍රිය වෙන්න උදව් කරන්න. ජනප්‍රිය වගේම ධනවත් වෙන්න." රැන්ඩොල්ප් පැවසුවේය.

විලියම් දෑස රවුම් කළේය. "හිනායන කතාවක්... ඔයා ආවේ මට උදව් කරන්න...? මේ පළවෙනි වතාව නෙවෙයි."

"කාලය වෙනස් වෙලා..." රැන්ඩොල්ප් මිමිණුවේය. "විලියම්... මම ඔයාට ගෙනාව දේ දැක්කම ඔයාගේ කතාව වෙනස් වෙයි."

විලියම් සොහොයුරා අසලට ගොස් ඔහුගේ බෑගය වෙත නෙත් හෙලුවේය. රැන්ඩොල්ප් විශ්වාස කළ හැකි අයෙකු නොවේ. රැන්ඩොල්ප් අපරාධකාරී අයෙකි. ඔහු මෙතෙක් කල් සිටියේ සිරගෙදර බව විලියම්ට විශ්වාස ය.

රැන්ඩොල්ප් බෑගයේ පතුලට අත දමා කොළ සහ නිල් පැහැ කිසිවක් පිටතට ගත්තේය. ඔහු එය දිග හැරියේය. එය වෙස් මුහුණකි. දැතින්ම එය අල්ලා ගත් ඔහු ඉදිරියට එසෙව්වේය.

විලියම්ට කෑ ගැසීමක් ඇසිණ. හැරී බැලූ ඔහුට දක්නට ලැබුණේ හැන්සල්ගේ බියපත් මුහුණ ය. එදින රැයේ දෙවන වතාවට බල්ලාගේ සිරුරේ ලොම් සෘජු වී තිබිණ. විශාල බල්ලා කෙඳිරි ගාමින් කාමරයෙන් පැන දිව්වේය.

Scanned by CamScanner

# 04

රැන්ඩොල්ප් සිනාසුණේය. "ඔයාගේ බල්ලා වෙස් මුහුණට බය වුණා."

විලියම් තම සොහොයුරාගේ අතේ වූ වෙස් මුහුණ දෙස බැලුවේය. එය ඉත්තන් පිරුණු කැතම කැත මුහුණකි. එහි මුවෙන් පහළට නිල් පැහැ මහත දිවක් එල්ලෙමින් තිබිණ. දිව ද වැසී තිබුණේ ඉත්තන් ගෙනි. එහි කන් දෙකෙන් කහ පැහැ සැරව වැස්සෙමින් තිබිණ.

"ඒක හරිම කැතයි." විලියම් කීවේය. "මටත් ඕනේ ඒකෙන් පැනලා දුවන්න."

රැඩොල්ප්ට එය ප්‍රමාණවත් විය. ඔහු බෑගයට අත දමා තවත් වෙස් මුහුණක් පිටතට ගත්තේය. එය ද එවැනිම කැත මුහුණකි. තුන්වෙනි වෙස් මුහුණ ද මෙසේ පිටතට ආවේය.

එය කෘමියෙකුගේ හිසක හැඩයේ කොළ පැහැති මුහුණකි. එහි උල් දත් දෙපළක් විය. කන් ද උල් වූ ඒවා ය. එය හරියටම යක්ෂයාගේ මුහුණ වැනි විය.

"ඒවා පැත්තකට දාන්න." විලියම් කීවේය. "වෙස් මුහුණු ඊට වඩා ලස්සන ඒවා වෙන්න ඕන. මම කැමති නැහැ මේ කැත වෙස් මුහුණුවලට."

"ඔයාට තේරෙන්නේ නැහැ." රැන්ඩොල්ප් කීවේය. "මේවා නිසා ඔයා ජනප්‍රිය වෙයි. ඔයාගේ වෙළඳසැල ගැන මුළු ලෝකයම දැන ගනියි."

විලියම් වෙව්ලා ගියේය. ඔහු කැත කොළ පැහැ වෙස් මුහුණෙන් දෑස ඉවතට ගත්තේය. "ඔයා මේවා මෙහෙට ගෙනාවේ මට විකුණන්නද...?"

ඔහුගේ සොහොයුරා හිස වැනුවේය. "මම ඔයාට දෙන්නේ ගොඩක් වටින දෙයක්... මට... මට පොඩි මුදලක් තිබුණම ඇති."

Scanned by CamScanner

''ඒත් මට මේවා ඕන නැහැ.'' විලියම් පැවසුවේය. ''ඒවා හරිම කැතයි. ඒවාට ළමයි බය වෙයි. මම වෙස් මුහුණු හදන්නේ ළමයින්ට රැන්ඩොල්ප්.... මට මේවා මගේ වෙළඳසැලේ තියාගන්න බැහැ.''

''මෝඩයා.'' රැන්ඩොල්ප් කෝපයෙන් කෑ ගැසුවේය. ඔහු මේසය මත වූ වෙස් මුහුණු ගොඩ මතට කොළ පැහැ වෙස් මුහුණ දැමුවේය. ''ඔයාට පේන්නේ නැද්ද...? මම ඔයාට ගෙනාවේ සාමාන්‍ය වෙස් මුහුණු නෙවෙයි.... ඔයාට ඇස් නැද්ද...? මේවා වෙස් මුහුණු නෙවෙයි.''

''වෙස් මුහුණු නෙවෙයි... එහෙනම් මේ මොනවද...?'' විලියම් ඇසුවේය.

''ඒවා ඇත්ත මුහුණු.... මිනිස් මුහුණු.''

විලියම් පුදුමයෙන් කෑ ගැසුවේය. එපමණක් ද නොව ඔහු වහා මේසය අසලින් පසුපසට පැන ගත්තේය. ''මොකක්ද ඔයා කිව්වේ...? මොකක්ද ඒ කතාවේ තේරුම...?''

''මේ බලන්න සහෝදරයා... මේ බලන්න.'' රැන්ඩොල්ප් බෑගය අනිත් පිට හරවා තවත් මුහුණු කිහිපයක් මේසය මතට හැලුවේය. එහි මුහුණු දොළහක් පමණ තිබෙන බව විලියම්ට දැකගත හැකි විය.

''ඒත්...'' විලියම් ට කතා කර ගත නොහැකි විය. හදවත පපුව තුළ වේගයෙන් ගැහෙන බව ඔහුටම දැනිණ.

''මේවා කාටවත්ම ඕන නැති මුහුණු.'' රැන්ඩොල්ප් කීවේය. ''හරිම කැතයි. හරිම ලෙඩ පාටයි. හැකිලිලා. කාටවත්ම මේවා ඕන නැහැ. කාටවත් ඒවා බලන්නවත් ඕන නැහැ. කාටවත්ම ඕන නැති ඒවා. ලෝකයේ කාටවත්ම උවමනා නැති මුහුණු.''

විලියම් මුහුණු දෙස බලා සිටියේය. සොහොයුරා පවසන්නේ ඇත්තක්ද...?

''මේවා අරගෙන යන්න... රැන්ඩොල්ප්... මම මේවට කැමති නැහැ.''

''නැහැ.'' රැන්ඩොල්ප්, විලියම්ගේ අතකින් අල්ලා

Scanned by CamScanner

ගත්තේය. ''ඒවා අල්ලලා බලන්න. එකක් අල්ලන්න.''

''එපා...''

රැන්ඩොල්ප් තම සොහොයුරාගේ අත ගෙන මේසය මත තැබීය. ''එකක් අල්ලන්න...''

විලියම් තදින් කෙළ ගිල්ලේය. ඔහුට අසනීප ගතියක් දැනෙමින් තිබිණ.

''එකම එකක් අල්ලලා බලන්න.''

විලියම් වෙස් මුහුණක් වෙත අත යොමු කළේය. එක් වෙස් මුහුණක කම්මුල ඔහු සෙමින් පිරිමැද්දේය.

''ඔහ්... දෙවියනේ... ඔහ්... නැහැ... නැහැ...''

# 05

රැන්ඩොල්ප් සිනාසුණේය.

විලියම් නැවතත් පුදුමයට පත්ව සිටියේය. ඔහු වහා අත ඉවතට ගත්තේය. ''ඒක... ඒක... හමක්.... මිනිස් හමක්... උණුසුම තවම තියෙනවා.''

රැන්ඩොල්ප් හිස වැනුවේය. ඔහුගේ අඳුරු දෑස බබළමින් තිබිණ. ''මම ඔයාට කිව්වේ ඇත්ත විලියම්.... ඔයාට පේන්නේ නැද්ද...? ඔයා මේවා ඔයාගේ වෙළඳසැලේ තිබ්බොත් මිනිස්සු මේවා ගැන කතා කරයි. මිනිස්සු...''

''නැහැ.'' විලියම් කෑ ගැසුවේය. ''එපා... මම කියන දේ අහන්න. මම දන්නේ නැහැ ඔයා මේ මුහුණු ගෙනාවේ කොහෙන්ද කියලා.... ඔයා ඒවා කොහෙන් ගෙනාවත් මට කමක් නැහැ. ඒවා දැන්ම මගේ ගෙදරින් අරගෙන යන්න. මම ඒවා මගේ වෙළඳසැලේ තියන්නෙත් නැහැ. මට ඒවාවත්... ඔයාවවත් ඕන නැහැ.''

කෝපයට පත්ව සිටි විලියම් උල් කන් සහ උල් දත්

Scanned by CamScanner

දෙපළක් සහිත කොළ පැහැ මුහුණ අතට ගත්තේය. ඔහු එය හම් බෑගය වෙත විසි කරන්නට සැරසුණේය. නමුත් එය ඔහුගේ අතට ඇලී තිබිණ.

ඔහු එය අනිත් පස හරවා එහි බියකරු, කැත මුහුණ පරීක්ෂා කළේය. ''මේක...''

''ඒක පරිස්සමින් විලියම්.''

''ඒකත් තව කැතම කැත එකක් විතරයි.'' විලියම් කීවේය. එය බිම නොවැටෙන්නේ කුමක් නිසාද...?

''පරිස්සමින් සහෝදරයා... ඒක දඬයම් මුහුණක්.''

විලියම්ගේ හුස්ම සිර වූවාක් මෙන් විය. ''දඬයම්...?''

රැන්ඩොල්ෆ් හිස වැනුවේය. ''ශතවර්ෂ ගණනාවක් යක්ෂයා එක්ක දඬයම් කළ එකක්...'' ඔහු විලියම්ගේ අත ඉවතට තල්ලු කළේය. ''දාගන්න... ඒක දාගන්න... ඔයාට ඒක හරි යයි. සමහරවිට එහෙම වුණොත් ඔයා මේ අපූරු මුහුණු මගෙන් ගයි.''

''එ... එපා...'' විලියම් කීවේය. ''ඒක පැත්තකට ගන්න. මට ඒකෙන් දැනෙන්නේ යක්ෂ ගතියක්. ඒක එහාට ගන්න.''

විලියම් පුදුමයට පත් කරමින් ඔහුට සිනාවක් ඇසිණ. එය මෘදු සිහින් සිනාවකි. නමුත් එය නැගෙන්නේ කොහෙන්ද...?

ඔහු පසුපසට පැන ගත්තේත, මේසය සෙලවෙන්නට පටන් ගත්තේත් එක්වරම ය. නැත. ඔහුගේ දෑස ඔහුව රවටනවා විය යුතුය.

මේසය සෙලවුණේ නැත. සිදු වූයේ මුහුණු එකින් එක මත නැගීම ය. සිනහව කාමරය පුරෙන තුරු නැගිණ.

සිනහව නැගුණේ උඩ පතින දඟලන මුහුණුවලිනි.

විලියම් පුදුමයට පත් කරමින් මුහුණු මේසය මත උඩ පනින්නට විය. එපමණක් නොව එම මුහුණුවල විවරවන මුවවල්වලින් සිනාවන් නැගිණ.

''කට වහනවා... කට වහනවා...'' බියට පත් මිනිසා දෑතින්ම කන් වසා ගත්තේය. එම සිනහව නිසා ඔහුගේ පිට දිගේ හිරියක් පැතිර ගියේය.

Scanned by CamScanner

"කට වහනවා... සිනාව නවත්තා ගන්නවා."

විලියම අත් මිට මොලවා ගනිමින් එම වෙස් මුහුණු පරදවන්නට උත්සහ කළේය. ඔහු උඩ පනින මුහුණු පරදවන්නට උත්සහ දැරීය. ඔහු ඒවා අල්ලා ගන්නට හදන හැම අවස්ථාවකම ඒවා ඔහුගේ අත නොගැටෙන තරම් දුරකට පැන්නේය.

ඔහු මුහුණු අල්ලා ගන්නට උත්සහ දරන වාරයක් පාසා එම මුහුණු තව තවත් සිනාසෙන්නට විය. කැතම කැත මුහුණු ඔහුට විහිළු කරන්නාක් මෙන් ය.

විලියම් ඔහුගේ සොහොයුරා පැත්තට හැරුණේය. රැන්ඩොල්ෆ් දෑත පපුව මත බැඳගෙන ඔහු ඉදිරියේ සිටියේය. ඔහුගේ මුහුණේ වූයේ කෝපාන්විත රැවීමකි.

ඔහු විලියම්ගේ වැලමිටෙන් අල්ලාගෙන තමා දෙසට හරවා ගත්තේය. "මම දැනගෙන හිටියේ ඔයා මගේ මුහුණු මිලට ගත්තේ නැහැ කියලා..." ඔහු කෑ ගැසීය. "මම කරන හැමදේම වැරදියි. ඔයා හැමවෙලාවෙම රඟපාන්නේ මට වඩා ඔයා හොඳයි වගේ... මට ඔයා සලකන්නේ ඔයාගේ ඇඟිලිවල තියෙන දූහුවිල්ලකට වගේ."

රැන්ඩොල්ෆ් කෝපයෙන් කෑ ගැසුවේය.

"ඔයා නිතරම දක්ෂ කෙනෙක්... හොඳ වෙස් මුහුණු සාදන්නෙක්. මම හොරෙක්... මංකොල්ලකාරයෙක්..."

උඩපනින, දඟලන වෙස් මුහුණු මහ හඬින් සිනාසුණහ.

"හොඳයි... මේ වතාවේ මම දිනුවා විලියම්... මේ වතාවේ මම ඔයාව පැරැද්දුවා."

විලියම් පසුපසට යන්නට උත්සහ කළේය. නමුත් උඩ පනින දඟලන වෙස් මුහුණු ඔහුගේ ගමන් මඟ අවහිර කළේය.

රැන්ඩොල්ෆ් කොළ පැහැති දඩයම් වෙස් මුහුණ උදුරා ගත්තේය. ඔහු එය දෑතින්ම අල්ලාගෙන විලියම්ගේ මුහුණට පැළැන්දුවේය.

Scanned by CamScanner

"කට වහනවා... සිනාව නවත්තා ගන්නවා."

විලියම් අත් මිට මොලවා ගනිමින් එම වෙස් මුහුණු පරදවන්නට උත්සහ කළේය. ඔහු උඩ පනින මුහුණු පරදවන්නට උත්සහ දැරීය. ඔහු ඒවා අල්ලා ගන්නට හදන හැම අවස්ථාවකම ඒවා ඔහුගේ අත නොගැටෙන තරම් දුරකට පැන්නේය.

ඔහු මුහුණු අල්ලා ගන්නට උත්සහ දරන වාරයක් පාසා එම මුහුණු තව තවත් සිනාසෙන්නට විය. කැතම කැත මුහුණු ඔහුට විහිළු කරන්නාක් මෙන් ය.

විලියම් ඔහුගේ සොහොයුරා පැත්තට හැරුණේය. රැන්ඩොල්ෆ් දෑත පපුව මත බැඳගෙන ඔහු ඉදිරියේ සිටියේය. ඔහුගේ මුහුණේ වූයේ කෝපාන්විත රැවීමකි.

ඔහු විලියම්ගේ වැලමිටෙන් අල්ලාගෙන තමා දෙසට හරවා ගත්තේය. "මම දැනගෙන හිටියේ ඔයා මගේ මුහුණු මිලට ගත්තේ නැහැ කියලා..." ඔහු කෑ ගැසීය. "මම කරන හැමදේම වැරදියි. ඔයා හැමවෙලාවෙම රඟපාන්නේ මට වඩා ඔයා හොඳයි වගේ... මට ඔයා සලකන්නේ ඔයාගේ ඇඟිලිවල තියෙන දුහුවිල්ලකට වගේ."

රැන්ඩොල්ෆ් කෝපයෙන් කෑ ගැසුවේය.

"ඔයා නිතරම දක්ෂ කෙනෙක්... හොඳ වෙස් මුහුණු සාදන්නෙක්. මම හොරෙක්... මංකොල්ලකාරයෙක්..."

උඩපනින, දඟලන වෙස් මුහුණු මහ හඬින් සිනාසුණහ.

"හොඳයි... මේ වතාවේ මම දිනුවා විලියම්... මේ වතාවේ මම ඔයාව පැරැද්දුවා."

විලියම් පසුපසට යන්නට උත්සහ කළේය. නමුත් උඩ පනින දඟලන වෙස් මුහුණු ඔහුගේ ගමන් මඟ අවහිර කළේය.

රැන්ඩොල්ෆ් කොළ පැහැති දඩයම් වෙස් මුහුණ උදුරා ගත්තේය. ඔහු එය දෑතින්ම අල්ලාගෙන විලියම්ගේ මුහුණට පැළැන්දුවේය.

Scanned by CamScanner

# 06

විලියම් විලාප නැගුවේය. ඔහුගේ කෑ ගැසීම වෙස් මුහුණ තුළම වියැකිණ.

වෙස් මුහුණ තම මුහුණට තද වන අන්දම ඔහුට දැනිණ. එය උණුසුම්, වියළි එකකි. නමුත් එහි කිසියම් සජීවී බවක් ද තිබිණ.

''එපා...'' ඔහු කෑ ගැසුවේය. වෙස් මුහුණ ගලවන්නට ඔහු උත්සහ කළද වෙස් මුහුණ ඔහුගේ මුහුණටම ඇලී තිබිණ.

''ඒක ගලවන්න රැන්ඩොල්ප්... මට උදව් කරන්න... ඒක ගලවන්න.''

විලියම් වෙස් මුහුණෙන් අල්ලා තදින් ඇද්දේය. එය මේ තරම් මුහුණට ඇලවී තිබෙන්නේ කුමක් නිසා ද...? එය ඔහුගේ සමටම ඇලී තිබිණ. ඔහු වෙස් මුහුණේ ඇස් කුහර තුළින් පිටත බැලුවේය. නමුත් මීදුමකින් දෑස වැසී ඇති විටක මෙන් ඔහුගේ දර්ශනය බොඳ වී තිබිණ.

ඔහු වෙස් මුහුණේ පහත කෙළවර වෙත ඇඟිලි ගෙන ගියේය. නමුත් ඔහුට එහි කෙළවරක් සොයා ගත නොහැකි විය. වෙස් මුහුණ ඔහුගේ සමටම යාවී තිබුණු ලෙසකි.

මේ වනවිට අනිත් වෙස් මුහුණුවල සිනාවන් නැගෙමින් තිබුණේ ඇතිනි. ඔහුගේම කෑ ගැසීම පවා ඔහුට ඇසුණේ ඈතින් නැගෙන සෙයකි.

ඔහු රත් පැහැ වූයේ පපුව තුළින් කෝපයක් නැගෙන්නට වූ බැවිනි.

''ඇයි මට මෙහෙම තරහා යන්නේ...? ඒ මේ වෙස් මුහුණ නිසාද...?''

ඔහු දිගින් දිගටම වෙස් මුහුණ ගලවන්නට උත්සහ කළේය. ''රැන්ඩොල්ප්... මට උදව් කරන්න... මේක ගලවන්න.'' ඔහු කීවේය.

Scanned by CamScanner

"රැන්ඩොල්ප්... ඔයා දිනුවා... මේක ගලවන්න."

අතිත් වෙස් මුහුණු මුවවල් විවර කරමින් වසමින් ඔහුව වට කරන්නට විය. ඔහුගේ සොහොයුරා පෙනෙන තෙක් මානයක නොවිණ.

අනතුරුව සිදු වූයේ ඔහුව බියපත් කරවන දෙයකි. වෙස් මුහුණු ඔහු අසලින් ඉවත් වෙන්නට විය. ඒවා උඩ පනිමින්, සිනාසෙමින් විවර කර තිබූ ඉදිරිපස දොර වෙත ගියේය.

ඊළඟ මොහොතේ ඒවා දොරෙන් පිට වී රාත්‍රී අන්ධ කාරයේ අතුරුදහන් විය. ඒවාගේ සිනහව ඔහුට තිවසට පිටතින් ඇසෙන්නට විය.

"රැන්ඩොල්ප්...?"

ඔහු විවර කර තිබූ දොර වෙත හැරුණේය.

"රැන්ඩොල්ප්....?"

ඔහුගේ සොහොයුරා ද අතුරුදහන් වී සිටියේය.

# 07

විලියම් හිස පසුපසට කර සතෙකු මෙන් කෑ ගැසුවේය. පපුව පුපුරා යන තරමේ කෝපයක් ඔහු තුළ ඇති විය.

ඔහු මුහුණට ඇලවී ඇති වෙස් මුහුණේ ගැටිය සොයන්නට විය. නමුත් ඔහුට එය සොයා ගත හැකි වූයේ නැත. වෙස් මුහුණ ඔහුගේ සැබෑ මුහුණට තදින් ඇලී ගොසිනි. දැන් එය ඔහුගේ සැබෑ සම මෙන් වී ඇත.

වෙස් මුහුණේ යක්ෂයා ඔහුගේ සිත කෝපයෙන් මෙන්ම කිසියම් ශක්තියකින් ද පිරවීය. තවදුරටත් ඔහු ඔහුගේ සිතට අවනත වූයේ නැත.

කෝපයෙන් යුතුවම විලියම් ඉදිරිපස දොර වසා දැමුවේ

Scanned by CamScanner

අකුණක් ගසන හඬකිනි. අනතුරුව ඔහු මේසය මත වූ මල් බඳුනක් බිමට පෙරළා දැමුවේය. ඉන්පසු දැතින්ම මේසය ඔසවා ගිනි උදුන වෙත දමා ගැසුවේය.

කෑම මේසය ඔසවා ගත් ඔහු ඉන් කැබිනට්ටුවේ වීදුරු වෙත පහර දුන්නේය. අනතුරුව විසිත්ත කාමරයට පැන රාක්කවල වූ පොත් බිමට විසි කරන්නට විය.

ඔහුගේ දැතට අසු වුණු ලාම්පු විසි වී ගොස් බිත්තිවල වැදී සුණුවිසුණු විය.

වේගයෙන් ආශ්වාස ප්‍රශ්වාස කරමින් සිටි ඔහු හැන්සසල් කාමරයට පැමිණෙන තුරුම හැසිරුණේ වියරුවෙන් මෙනි. බියට පත් බල්ලාගේ කන් කඩා වැටී තිබූ අතර වලිගය දෙපා අතර රුවාගෙන සිටියේය.

''හැන්සල්...'' විලියම් කෑ ගැසීය. ''හැන්සල්.'' බල්ලාගේ දසුන ඔහුට මඳ සහනයක් ගෙන දුන්නේය. බල්ලා ඔහු දෙස බලා සිටියද ඔහු අසලටවත් පැමිණියේ නැත.

''හැන්සල්................. බලන්න එයා මට කරපු දේ......... රැන්ඩොල්ප් මට කරපු දේ....''ඔහු බල්ලා අසලට යන්නට විය. නමුත් හැන්සල් කෙඳිරිගාමින් පසු පසට ගියේය.

''ඔයාට මාව අඳුන ගන්න බැරිද...?''

විලියම් කෑ ගැසුවේය.

''ඔයාට මාව අඳුන ගන්න බැරි මේ යක්ෂ වෙස් මුහුණ හින්දා...'' ඔහු නැවත වරක් වෙස් මුහුණෙන් අදිමින් එය ගලවා ගන්නට උත්සාහ කළේය.

''ගැලවෙන්න.......ගැලවෙන්න.....අනේ ගැලවෙන්න.....''

බොහෝ වෙලාවක් වෙහෙස වී උත්සාහ කළද වෙස් මුහුණ ගලවා ගැනීමට ඔහුට හැකි වූයේ නැත. විලියම් වේදනාවෙන් කෑ ගැසුවේය.

වෙස් මුහුණ තම සමට කා වැදී ඇති අන්දම ඔහුට දැකගත හැකි විය. කළ යුතු දේ ඔහු සිතා ගත්තේය.

කළ හැකි එකම දේ ගැන ඔහු දැන සිටියේය.

Scanned by CamScanner

''මම වෙස් මුහුණත් එක්කම මුළු මුහුණම ඉරලා දානවා...''

අනතුරුව ඔහු දණින් වැටුණේය. වේදනාව දැඩිව දැනෙමින් තිබිණ. ඔහුට දෙපයින් නැගී සිටීම පවා ඉතා අසීරු විය.

''මම මගේ මූණ ඉරලා දානවා. ඒක තමා වෙස් මුහුණ ගලවා ගන්න තියෙන එකම විදිහ..''

''ඊට පස්සේ මම මැරෙනකල් බලා ගෙන ඉන්නවා...''

විලියම් වෙස් මුහුණට පහර දෙන්නට වූයේය. එම වේගවත් පහරවල් වැදුණේ ඔහුගේම මුහුණටය. ඔහුගේ මුහුණෙන් රුධිරය ගලන්නට විය.

''මේ යක්ෂ අධයම් මුහුණ නිසා තව කෙනෙකුට කරදරයක් වෙන්න දෙන්න බැහැ. ''

''මම ඒක හංගන්න ඕන. කාටවත්ම කවදාවත් හොයා ගන්න බැරි විදිහට මම ඒක හංගන්න ඕන...''

ඔහු දෙපයින් නැගිට සිටියේය. ඔහුගේ හිස ගිනි ගෙන දැවෙන්නාක් බඳු වේදනාවකින් පිරී තිබිණ.

හැන්සල් සෙමින් කෙඳිරිගාමින් මුල්ලකට වී ගුලිව සිටින අන්දම ඔහුට දිස් විය.

''සේරම හරි හැන්සල් කවුරු හරි .....කරුණාවන්ත කවුරුහරි ඔයාව රැක බලා ගනියි...''

හැන්සල් තනිකර යාම ගැන සිතීමම ඔහුගේ හදවත බිඳ දමන්නාක් විය. නමුත් ඔහුට වෙනත් තෝරා ගැනීමක් නොමැති බව විලියම් දැන සිටියේය. මෙම වෙස් මුහුණේ ශාපයෙන් ඔහු අනිත් අයව ආරක්ෂා කළ යුතු විය.

ඔහු වෙස් මුහුණ තදින් අල්ලා ගෙනම අට්ටාලය වෙත ඇති පඩිපෙළ නැග්ගේය. ඔහුගේ නළලතින් රුධිරය ගලමින් තිබිණ. ගලා ආ රුධිරයෙන් ඔහුගේ ඇස් වැසී ගිය නිසා ඔහුට අවට දැකීමද දුෂ්කර විය. තමාට වැඩි වෙලාවක් ඉතිරි වී නැති බව ඔහු දැන සිටියේය.

ඔහු නැවතත් දණින් වැටුණේය. ඒ අට්ටාලයේ බිත්තියකට

Scanned by CamScanner

සවි කර තිබූ පරණ ට්‍රන්ක පෙට්ටියක් අසලය. එය රත්තරන් අගුලක් සහිත කළු පැහැයෙන් සහ රනින් වැඩ දැමූ ට්‍රන්ක පෙට්ටියකි.

විලියම් එහි පියන විවර කළේය. ඔහු පෙට්ටිය තුළට එබී බැලුවේය. එම විශාල පෙට්ටිය පිරී තිබුණේ පරණ ඇඳුම් වලිනි. ඇඳුම් සහ වෙස් මුහුණු වලිති.

''වෙස් මුහුණ සඟවන්න.....''සිරුර දුර්වල වෙමින් යන අතර ඔහු මිමණුවේය.

ඉන්පසු ඔහු සැත වෙස් මුහුණ ට්‍රන්ක පෙට්ටිය තුළට දැමුවේය. එය ට්‍රන්ක පෙට්ටිය පතුලේ වූ පරණ ඇඳුම් ගොඩක් යට සැඟවීමට ඔහු සමත් විය. එය කිසිදු දිනක කිසිවෙකුටවත් හමු නොවනු ඇත.

අනතුරුව විලියම් එහි පියන වසා දැමුවේය. අනතුරුව රත්තරන් අගුල දැමුවේය. අගුල වැටෙන හඬ ඔහුට ඇසිණ. ඔහු ඉතිරිව තිබූ සියලු ශක්තිය යොදා ට්‍රන්ක පෙට්ටිය බිත්තියේ තිබූ ස්ථානයටම තල්ලු කර දැමුවේය.

ට්‍රන්ක පෙට්ටිය බිත්තියට සවිව ගිය විට ඔහු ඉදිරියේ වූයේ රහසිගත කාමරය පමණි. එය අට්ටාලයේ සිට අඩියක් පමණ නුදුරින් විය.

ඔහු රහසිගත කාමරයට පය තැබුවේය. අන්ධකාරය විසින් ඔහුව ගිල ගන්නා ලදි.

''මම මැරෙයි ඒත් මට පුළුවන් ට්‍රන්ක පෙට්ටිය මුර කරන්න. මම මෙතැන ඉදන් දඩයම් වෙස් මුහුණ මුර කරනවා.

මම මැරුණට පස්සේ වුණත් මට පුලුවන් ඒ දිහා බලාගෙන ඉන්න. මරණයට මාව නතර කරන්න බැහැ. මම මේ රහසිගත කාමරයට වෙලා ඉදන් දඩයම් වෙස් මුහුණේ යක්ෂයා ගෙන් අනිත් අයව ආරක්ෂා කරනවා...''

විලියම්ට ඇසුණු අවසන් ශබ්දය වූයේ දොරෙන් එපිට සිට හැන්සල් නගන කෙඳිරිය යි...

Scanned by CamScanner

# ලූ ඇන්ගේ කතාව

## (හතළිස් වසරකට පසු)

## 01

"මට ඕන නැහැ පොලී මාටින්ගේ සියලු ශාන්තුවරයින්ගේ සැදෑවේ සාදයට යන්න." මම පැවසුවෙමි. "මට අවුරුදු දොළහයි. ඒ නිසා මට පුළුවන් මම යන්න ඕන සාද මොනවද කියලා තීරණය කරන්න."

මම කුෂන් කොට්ටයට පහරක් ගැසුවෙමි. "පොලී තමයි මේ ලෝකේ නරකම සාද පවත්වන්නේ... නැහැ. මුළු විශ්වයේම. එයාගේ සාද හරිම නරකයි. ඒවාට නරකයි කියනවාටත් වඩා නරක නමක් දෙන්න වටින්නේ."

මගේ මිතුරා ඩේවින් බැනන් සිනාසුණේය. "ඔයා නම් හරිම විහිළුකාරියක් ලූ ඈන්..."

" මම විහිළුකාරියක් නෙවෙයි..." මම කෑ ගැසුවෙමි. මම කියන්නේ ඇත්තටම. ඇයි සියලු ශාන්තුවරයින්ගේ සැදෑවත් විනාශ කරන්නේ..."

"ඔයයි පොලියි බාලාංශ පංතියේ ඉඳන්ම හොඳ යාළුවෝ..." ඩෙවින් කීවේය. ඒ අතරම ඔහු පොප්කෝන් අහුරක් මුවට ඔබා ගත්තේය.

"ඔයා කතා කරන්නෙත් අපේ අම්මා කතා කරන විදිහට." මම මැසිවිලි නැගුවෙමි. "අපි යාළුවෝ වෙලා හිටියා නෙවෙයි.

Scanned by CamScanner

අපි දෙන්නා එකිනෙකාව අඳුනගෙන හිටියා විතරයි.''

ඩෙවින් කිසිවක් පැවසුවද ඔහුගේ මුව පොප්කෝන්වලින් පිරී තිබූ නිසා ඔහු පැවසූ කිසිවක්ම මට වැටහුණේ නැත. මා දන්නේ එකම එක දෙයකි. එනම් මගේ සියලුම මිතුරු මිතුරියන් විහිළුකාරයින් සහ අද්භූතයන් බව ය.

ඩෙවින් සහ මා වාඩි වී සිටියේ සෝපාවක දෙකළවර ය. අපි දෙදෙනාම අපේ දෙපා කෝපි මේසය මත තබාගෙන සිටියෙමු. ඩෙවින් මගේ මව සකසන ලද පොප්කෝන් බඳුනකින් පොප්කෝන් අහුරු අහුරු කමින් සිටියේය. පොප්කෝන් අහුරුවලින් භාගයක් ඔහුගේ මුව තුළට ගිය අතර ඉතිරි භාගය බිම සහ සෝපාව මත වැටිණ.

සෝපාවේ මා සිටි කොටස ඉතා පිරිසිදු විය. මම පොප්කෝන්වලට නොකැමැත්තෙමි. මා කැමති පැණි රස කෑම්වලට පමණි. ශීතකරණයේ අයිස් ක්‍රීම් ඇති බව මම දැන සිටියෙමි. නමුත් නැගිට ගොස් එය රැගෙන ඒමට මා තුළ වූයේ උදාසීන බවකි. උදාසීන බවක් මෙන්ම කණස්සල්ලක් ද මා තුළ විය.

''ඔයා දන්නවද මම පොලීගේ සාදවලට අකැමති අනිත් හේතුව මොකක්ද කියලා...?'' මම ඇසුවෙමි.

ඔහු සිනාසුණේය. ''හැමදේකටම අකැමති ඇති...?''

''එයා එක පුද්ගලයෙකුට ඩොලර් පහ ගානේ අය කරනවා.'' මම කීවෙමි. ''සතුටු සාමිචියේ යෙදෙන්න ඇයි අපි සල්ලි ගෙවන්නේ... මට මෙතන වාඩි වෙලා ඔයා එක්ක කතා කර කර ඉන්න එකම සතුටක්.''

''ස්තූතියි... ලූ ඈන්... ඔයා හොඳ යාළුවෙක්.''

ඩෙවින්ට මා නිතරම සරදම් කළද මම ඔහුට බොහෝ සේ ප්‍රිය කළෙමි.

''ඩොලර් පහක්.'' මම මිමිණුවෙමි.

''හොඳයි... ඔයා දන්නවනේ පොලීව. එයා කවදාවත් අකැමැත්තෙන් නම් ඩොලර් බිල්පතක් දකින්නේ නෑ.''

Scanned by CamScanner

"පොලිගේ අදහස සාදයේ හොඳ සෙල්ලමක් තියන්න."

මම මැසිවිලි නැගුවෙමි.

"බෝතල් කරකවන එකද...?"

"නැහැ. කට වහගන්න... ඒක උද්යෝගිමත් දෙයක්... එයාගේ අදහස බැලුමක් පුම්බලා ඒක ඇලෙනකම් නළලේ අතුල්ලන එක. ඊට පස්සේ කාටද බැලුම මුණේ ගොඩ වෙලාවක් තියාගෙන ඉන්න පුළුවන් කියලා බලනවා."

ඩෙවින් නැවතත් සිනාසුණේය. "බැලූන් තියෙනවද ඔයා ගාව...? අපිට පුහුණුවීම් කරන්න පුළුවන්."

මම ඔහු දෙස රවා බැලුවෙමි. "ඇයි ඔයා හිනාවෙන්නේ...? ඒක විහිළුවක් නෙවෙයි."

මම බඳුනෙන් පොප්කෝන් අහුරක් ගෙන ඔහුගේ රතු පැහැ කැරලි හිස කෙස් මතට හැලුවෙමි. ඔහු ඒවා ඉවත් කරන්නට හිස වේගයෙන් සෙලවූ අතර පොප්කෝන් බිම හැමතැනම විසිරිණ.

මා මුලින් කීවා සේම මම ඩෙවින්ව ප්‍රිය කළෙමි. ඔහු පොලි මාර්ටින් මෙන් නොවේ.

පොලී සුන්දර මෙන්ම හොඳ දැරියකි. ඇයගේ කොළ පැහැ විසල් දෑස මෙන්ම සුන්දර සිනහව ද සිත් ඇද ගන්නා සුළු ය. සැබවින්ම ඇය දත්බෙහෙත් දැන්වීමක් වැනි දෙයකට වඩාත් හොඳින් ගැළපේ.

නමුත් ඇයගේ ගැටලුව වූයේ ඇය බොහෝ බරපතල ලෙස සිතීම ය. සෑම මොහොතකම ඇය එසේ හැසිරිණ. ඇය සිනාසුණද ඇය විනෝදයෙන් සිනාසෙනවා මා දැක නැත. ඇය විහිළු කරනවා මා දැක නැත. ඔබ ඇයට විහිළුවක් කළ ද ඇය එය වටහා නොගනු ඇත.

මගේ අනිත් යහළුවන් සියලු දෙනාම විහිළුකාරයින් වූ නිසා ඇය වැනි කෙනෙකු සමග ළඟ මිතුරුකමක් ඇති කර ගැනීම ඉතා අසීරු විය.

"ඇයි ඔයා හිතන්නේ පොලීගේ සියලු ශාන්තුවරයින්ගේ

සැදෑ සාදය විනෝදයක් වෙයි කියලා....?'' මම ඩෙවින් ගෙන් ඇසුවෙමි. ''ඔයත් යනවද ඒකට...?''

''නැහැ. මම යන්නේ නැහැ.''

''මොනවා...? ඇයි ඔයා යන්නේ නැත්තේ...?''

ඔහුගේ සිනහව වියැකිණ. ඔහු දෑස බිත්තියේ වූ රූපවාහිනිය වෙත යොමු කළේය. අප එය ක්‍රියාත්මක කර තිබුණේ ශබ්දය අඩු කර ය. මගේ නිවසේ රූපවාහිනී ක්‍රියාත්මක කළේ එසේ ය. ඒ කුමක් නිසාදැයි මගෙන් නොවිමසනවා නම් හොඳ ය. කිසියම් ආහාර පිසින වැඩසටහනක් රූපවාහිනියේ විකාශනය වෙමින් තිබිණ. කණ්ඩායම් කිහිපයක් හැකි තරම් වේගයෙන් තරගයට කප් කේක් සාදමින් සිටියහ.

''ලූ ඈන්... ඔයා හිතන්නේ ඔයා තමයි මේ විශ්වයේම ඉන්න අවාසනාවන්ත කෙනා කියලා.'' ඩෙවින් කීවේය. ''ඒත් ඒ කෙනා මම. මට පොලීගේ සියලු ශාන්තුවරයින්ගේ සැදෑ සාදය මඟ ඇරෙනවා.''

''ඔයා විහිළුවක් නේද කරන්නේ...?''

''ඒක විහිළුවක් නම් කොච්චර හොඳද...?'' ඔහු සුසුමක් හෙලුවේය. ''මගේ සියලු ශාන්තුවරයින්ගේ සැදෑව ඔයා ගෙවනවාටත් වඩා නරක විදිහටයි ගෙවන්න වෙන්නේ.''

ඔහු හේතු පවසන තුරු මම බලා සිටියෙමි.

ඔහු හිසකෙස්වල දැවටී තිබූ පොප්කෝන් පිසදැමුවේය. ''ලූ ඈන්... මගේ සියලු ශාන්තුවරයින්ගේ සැදෑවම ශෝකාන්තයක්.''

''මගේ කුතුහලය වැඩි කරන්න එපා.'' මම පැවසුවෙමි. ''මට කියන්න ඇයි එහෙම වෙන්නේ කියලා.''

''මගේ තාත්තා මාව වට්ටක්කා ගොවිපළකට ගෙනියන්න හදන්නේ.'' ඔහු පැවසුවේය.

''ඔයාගේ තාත්තා ගොවියෙක් නෙවෙයිනේ... එයා වැඩ කරන්නේ රක්ෂණ සමාගමකනේ. ඔහ්... මම දන්නවා එයා වෙන ඊකියාවක් හොයනවා කියලා... ඒත් වට්ටක්කා...''

ඩෙවින් තම දුඹුරු පැහැ දෑස රවුම් කළේය. ''ඉන්නකෝ

Scanned by CamScanner

මම කියනකම. එයා ඒ වගා බිම අරගෙන... ඉතින් මට යන්න වෙනවා එහෙට. වට්ටක්කා ගෙඩි වැල්වලින් කඩා ගන්න එකත් අපූරු අත්දැකීමක්. එහෙම නේද...?''

''මට අවුරුදු පහේදී අපිත් වට්ටක්කා වගා බිමකට ගියා.'' මම කීවෙමි. ''ඒවා දිගම දිග වට්ටක්කා වැල්. මිව්ට අවුරුදු දෙකයි එතකොට. එයා අඬන්න පටන් ගත්ත නිසා අපි එහෙත් ආවා.''

''මමත් අඬන්න හැදුවේ.'' ඩෙවින් කිවේය. ''ඒත් තාත්තා හිතන්නේ වට්ටක්කා විකුණලා සල්ලි හොයන්න. සියලු ශාන්තුවරයින්ගේ සැදෑවට තියෙන්නෙත් එකම එක සතියයි. එයාට කොච්චර වට්ටක්කා විකුණ ගන්න පුළුවන් වෙයිද...?''

මම හිස සෙලෙව්වෙමි. ''ඔහ්... නියමයි.''

''ඉන්න...'' ඩෙවින් නෙපලුවේය. ''මේ ටික තමයි දුක්බරම කොටස... එයා ඉස්කෝලෙන් අවසර අරන් මට ගොවිපළේ වැඩවලට උදව් වෙන්න දෙන්න කියලා.''

''ඔහ්...'' මම කෙඳිරුවෙමි.

''ඔව්... ඉතින් සියලු සාන්තුවරයින්ගේ සැදෑව මට කොහෙද ගෙවන්න වෙන්නේ...? වට්ටක්කා වගා බිමක.''

''නැහැ... නැහැ...''

''පොලීගේ සාදය හොඳයි කියලා ඔයාට හිතෙයි.'' ඩෙවින් කීවේය.

ඔහුගේ අත පොප්කෝන් බඳුනේ අඩියේ ගැටිණ. ''හේයි... මේකේ තිබුණ පොප්කෝන්වලට මොකද වුණේ...?''

''හරිම විහිළුවක් තමයි... ඒවා ඔයාගේ දත්වල ඇලිලා ඇති.''

විහිළු කළද මම ඔහු ගැන දුක් වූයෙමි. ඔහු ගොවිපළක ඇති දැඩි වූවෙකු නොවේ. ඔහු ජීවිත කාලයම ගෙව්වේ නගරවල ය.

''ඔයාට වට්ටක්කා එක්කයි දවස ගෙවන්න වෙන්නේ...'' මම දුක්බරව කීවෙමි.

ඔහු සුසුමක් හෙලුවේය. මගේ දෑස ඔරලෝසුව වෙත යෙ-

Scanned by CamScanner

ාමු විය. වෙලාව දුටු මට ඉබේටම නැගිට්ටිණ.

"දැන් ඔයාට යන්න වෙලාව හරි." මම තෙපලුවෙමි.

ඔහු නැගිට්ටේය. "හූ ඇත්... ඔයා කොහෙද යන්නේ...?" ඔහුව ඉදිරිපස දොර වෙත මා තල්ලු කරන විට ඔහු ඇසුවේය.

"මම යනවා දැන් මගේ මල්ලිව බය කරන්න.

# 02

මම මගේ සොහොයුරා වූ මිච්ට දිනපතාම රාත්‍රී නින්දට පෙර බය ගිතෙන කතන්දරයක් පවසන්නට පුරුදු වී සිටිමි. ඒ සියල්ලම මා ගෙතූ කතා ය.

මිච් මගේ කතාවලට කැමති ය. ඇතැම් කතාවලට ඔහු අකැමති විය. ඔහු ඇතැම් කතාවලට බිය වූයේය. නමුත් ඔහු දැත් මිට මොලවාගෙන, දත් සපාගෙන සිය නිර්භීත බව පෙන්වූයේය.

අසරණ ළමයා බිය කිරීමට මට අවශ්‍ය වූයේ නැත. නමුත් මා දැන සිටියේ බියජනක කතා ගෙතීමට පමණි. මට මවාගත හැකි වූ එකම කතා වර්ගය ඒවා ය.

මිච් සහ මා මඳක් පෙනුමින් සමාන විය. අප දෙදෙනාටම කළු පැහැ සෘජු කෙස් හිමි වූ අතර කළු පැහැ දැස් ද රවුම් මුහුණු ද විය. මා කෙසඟ සිරුරකින් යුතු වූ අතර ඔහු හුරුබුහුටි මහතකින් යුතු විය.

මිච් නිහඬ ළමයෙකි. ඔහුගේ වයස අවුරුදු හතරක් වුවද රාජධානි, මකරු සහ යුද්ධ ගැන ඇති කතා සියල්ලම වාගේ ඔහු කියවා තිබිණ.

අප දෙදෙනා කෙතරම් වෙනස් ද යත් උදේ කෑමට පවා අප තුළ වූයේ එකිනෙකාට වෙනස් රුචියකි. මම මිච්ව මුළුතැන්ගෙයට රැගෙන ගොස් ඔහුට සුළු ආහාරයක් ලබා දුන්නෙමි. ඉන් පසු අපි ඉහළ මාලයට ගියෙමු. මිච් ඔහුගේ පහත් ඇඳට නැග පොරවනයෙන් සිරුර වසා ගත්තේය.

Scanned by CamScanner

පියා ඔහු වෙනුවෙන් පොළව මට්ටමටම පහත් ඇඳක් සකසා දී තිබිණ. නිතරම රෑ නින්දෙන් පෙරළෙන ඔහු පරණ ඇඳෙන් කිහිප වරක්ම බිම වැටී තුවාල සිදු කර ගත්තේය.

"කතාව මොකක් ගැනද...?" ඔහු ඇසුවේය. "ඒකත් බය හිතෙන එකක්ද...?"

"හරි... ගොඩක් බය හිතෙන එකක් නෙවෙයි." මම කීවෙමි. එය අසත්‍යයක් විය.

"අද රෑ මම කියන්න යන්නේ වයසක යක්ෂ මිනිහෙක් ගැන. එයා හරිම යක්ෂයෙක්. හරියට අවතාරයක් වගේ...."

"මොකක්ද එයාගේ නම...?"

"එයාගේ නම මිච්..." මම පැවසුවෙමි. "බාධා කරන්න එපා කතාවට."

"නැහැ... ඇත්තටම මොකක්ද එයාගේ නම...?"

"එයාගේ නම යක්ෂ බොරිස්... ඒක් එයාට මිනිස්සු කතා කළේ යක්ෂයා කියලා. හැමෝම එයාට බයයි. හැම රෑකම යක්ෂ බොරිස් නගරය වටේ රවුමක් ඇවිදලා මොනවාහරි යක්ෂ වැඩක් කරනවා."

"මොන වගේ ඒවද...?"

මම නිදන කාමරයේ විදුලි පහනේ ආලෝකය අඩු කළෙමි. මඳ ආලෝකය තුළ මිච්ගේ බියෙන් විසල් වූ අඳුරු පැහැ දෑස දිලිසෙන්නට විය. ඔහු දෑතින්ම පොරවනය අල්ලා ගෙන සිටියේය. මම බිය වැඩි වන ලෙස කොඳුරමින් කතාව කියන්නට වීමි.

"යක්ෂ බොරිස් බළල්ලුන්ව පාගලා දානවා. සමහර දවස්වලට රෑට එයා මිනිස්සුන්ගේ කාර් ඇතුළට කුණු කසළ ගිහින් දානවා. එයාගේ අත්වලින් කුරුල්ලන්ව මරලා දානවා. එයා කැමතිම දේ තමයි ගෙවල්වල ජනෙල් වීදුරු බිඳලා ඒ වීදුරු කුඩු වෙන සද්දේ අහන්න... දන්නවද තව දෙයක්...?"

"මොකක්ද...?" මිච් සෙමින් ඇසුවේය.

"එක සතියක එයා කෙනෙක්ව කෑවා."

Scanned by CamScanner

"එයා මිනිස්සුන්ව කනවද...?" මිච් ඇසුවේය.

"එයා කන්නේ ළමයින්ව විතරයි. ඒ ඔයාගේ වයසේ ළමයින්ව." මම පැවසුවෙමි.

මට සිනා පහළ විය. මම මෙවැනි කතා ගෙතීමට රුචි කළෙමි.

"එයා මුලින්ම කරන්නේ එයාලාව රස බලන එක. සමහර වෙලාවට එයා ළමයින්ගේ අතක් හපනවා. සමහර වෙලාවට කකුලක් හපලා බලනවා. ඒත් පුදුමාකාර දේ තමයි... යක්ෂ බොරිස් ඔළුව කාලා දන්නේ අන්තිමේට."

මිච් බියෙන් කෙළ පිඬක් ගිල්ලේය.

"ඔයාට මැවිලා පේනවාද...?" මම මිමිණුවෙමි. "ඔයාට මැවිලා පේනවාද යක්ෂ බොරිස් අවතාරයක් වගේ පාවෙලා ඇවිත් ඔයාගේ වයසේ ළමයෙක්ව හපනවා... ගිලිනවා..."

"නවත්තන්න ලූ ඈන්..." මිච් ඉල්ලා සිටියේය. "මට ඕන නැහැ එහෙම පින්තූරයක්... ඔයා කිව්වනේ ඒ කතාව ගොඩක් බය හිතෙන්නේ නැහැ කියලා."

"ඒත් මම තවම ඔයාට බය හිතෙන කොටස කිව්වේ නැහැනෙ." මම කෙඳිරුවෙමි. "ඔයාට කතාවේ බය හිතෙන කො-ටස අහන්න ඕන නැද්ද...?"

"නැහැ." මිච් කෑ ගැසුවේය. "නැහැ. නැහැ."

"බයම හිතෙන කොටස තමයි.... යක්ෂ බෝරිස් ජීවත් වෙන්නේ ඔයාගේ අල්මාරියේ.... ඔයාගේ අල්මාරිය ඇතුළේ මිච්..."

**"නැහැෑෑෑෑෑෑෑෑෑෑෑෑෑෑ."**

පොරවනය වෙව්ලන අන්දම මට පෙනිණ. ඔහුගේ පුළුල් බියපත් දෑසේ දිලිසීම ද මට දැකිය හැකි විය.

"මිච්..." මම සෙමින් කතා කළෙමි. අනතුරුව ඔහුගේ උරහිසට තට්ටු කළෙමි. "ඒක කතන්දරයක්... ඇත්ත එකක් නෙවෙයි." ඔහුගේ ඝනකම් හිස කෙස් අත ගාමින් මම පැවසුවෙමි. "මම හදලා කිව්වේ ඒ කතාව. බය වෙන්න එපා."

"ඒකට බය හිතෙනවා." ඔහු තෙපලුවේය. ඔහුගේ දෑස

නිදන කාමරයේ ඇති අල්මාරිය වෙත යොමුව තිබිණ.

"ගිහින් අල්මාරිය ඇරලා බලන්න." මම කීවෙමි. "බලන්නකෝ අල්මාරිය. ඔයාට පෙනෙයි ඒක හිස් කියලා.... කවුරුවත් ඇතුළේ නැහැ කියලා."

ඔහු අදිමදි කළේය."මට ඕන නැහැ."

"ඒක කතාවක් විතරයි." මම පැවසුවෙමි. "ඉක්මන් කරන්න. අල්මාරිය ඇරලා ඔයාම ඒක ඇත්ත කියලා දැනගන්න. ඊට පස්සේ නිදාගන්න."

ඔහු සෙමින් නැගිට්ටේය. ඔහුගේ දෑස අල්මාරියේ දොර වෙතම යොමුව තිබිණ. ඔහු කාමරය හරහා අල්මාරිය වෙත ගියේය.

"යන්න... ඒක අරින්න." මම කීවෙමි. ඔයාටම පෙනෙයි කවුරුවත් නැහැ කියලා."

මිච් අල්මාරියේ හැඬලය අල්ලා ගත්තේය. ඔහු එය ඇද විවර කළේය. දොර විවර වත්ම පිටතට පැමිණියේ දිගු උල් දත් සහිත වයසක මිනිසෙකි.

මිච් මුව විවර කර විලාපයක් නැගුවේය.

මම දැතින්ම මුහුණ වසා ගත්තෙමි. "මගේ කතාව..." මම කෑ ගැසුවෙමි. "ඒක ඇත්තක් වෙලා."

## 03

මිච් විලාප නගමින් බිම ඇද වැටුණේය.

වයසක මිනිසා එතනම නතර විය. ඔහු දෑත මිට මොලවාගෙන සිංහයෙකු මෙන් ගෙරවූයේය.

මට සිනහව නවතා ගත නොහැකි විය.

ඒ සමගම මගේ මිතුරෙකු වූ බ්‍රැඩ් ඩෙලනි ඔහු පැළඳ සිටි වයසක මිනිසෙකුගේ වෙස් මුහුණ ගලවා ඉවත් කළේය. ඔහු ද මගේ සිනාවට එක් වූයේය.

Scanned by CamScanner

''ඔයාලා දෙන්නා එකතු වෙලාද මේක සැලසුම් කළේ...?'' මිච් ඇසුවේය.

මම හිස වැනුවෙමි. ''ඔයා බිස්කට් කාලා කිරි බොන අතරේ බ්‍රෙඩ් ඇවිත් අල්මාරිය ඇතුළේ හැංගුණා.''

''මම ඔයාව බය කළාද...?'' බ්‍රෙඩ් සිනාසෙමින් මිච් ගෙන් ඇසුවේය.

මිච් දෙපයින් නැගිට ගත්තේය. ඔහු කෝපයෙන් කෑ ගසමින් මා වෙතට පැන මිට මොලවා ගත් දෑතින් පහර පිට පහර දෙන්නට වූයේය.

''නපුරි... නපුරි...''

''හරි... හරි...'' ඔහුගෙන් ගැළවෙන්නට ප්‍රයත්න දරමින් මම කීවෙමි. ''නවත්තන්න. ඒක විහිළුවක්.''

''මෝඩ විහිළුවක්.'' මිච් කීවේ තදින් හුස්ම ගනිමිනි. ''මෝඩ කෙල්ලකගේ මෝඩ විහිළුවක්.''

''මම හිතන්නේ එයා ඒකට කැමතියි.'' බ්‍රැඩ් පැවසුවේය.

බ්‍රැඩ් මිනිසුන්ට මෙවන් විහිළු කිරීමට කැමති අයෙකි. ඔහු ඔවුන්ව බය කළද කිසිම දිනක ඔහුට ඒ ගැන නරක හැඟීමක් ඇති වී නැත.

බ්‍රැඩ් ට මිතුරන් ද බොහෝ ඇත. ඔහුගේ දෙමව්පියෝ ද ඔහුට දැඩිව ආදරය කළහ. මේ නිසාම ඔහු ප්‍රීතිමත් ළමයෙක් විය.

''ඔයා විහිළුකාරයෙක් නෙවෙයි... ඔයා මෝඩයෙක්.'' මිච් කෑ ගැසුවේය. ''මම ඔයාගේ කතාවලට කැමති නැහැ. ඒවත් ඔයා වගේම කුණු ගොඩවල්.''

මම ඔහුගේ උරහිස්වලින් අල්ලා ඉවතට තල්ලු කර දැමුවෙමි.

''සමාවෙන්න...'' මම තෙපලුවෙමි. ''මට ඕන වුණේ ඔයාව සියලු ශාන්තුවරයින්ගේ සැඳෑවට සූදානම් කරන්න. ඒක විහිළුවක් මිච්.''

''ඔයාගේ විහිළු....'' ඔහු කෑ ගැසුවේය. ''ඔයාගේ මෝඩ විහිළු.''

Scanned by CamScanner

"ඔයා මොනවා කිව්වත් මම හෙට රෑ ඔයාට කියන්නේ හිනා යන කතන්දරයක්... බය හිතෙන කතාවක් නෙවෙයි. එහෙම හොඳයි නේද...?"

"මම කැමති නැහැ හිනා යන කතාවලට." ඔහු එරෙව්වේය.

ඔහුට ඇවසි කෝපයෙන්ම සිටීමට බව මට පැහැදිලි විය.

ඒ නිසා මම ඔහුට සුබ රාත්‍රියක් පතා බ්‍රැඩ් සමග මිච්ගේ කාමරයෙන් පිටව පහත මාලයට ගියෙමි. මව සහ පියා විසිත්ත කාමරයට වී වීඩියෝ ක්‍රීඩාවක නියැලී සිටියහ.

මගේ දෙමව්පියෝ වීඩියෝ ක්‍රීඩාවලට බොහෝ සේ ඇලුම් කළහ.

බ්‍රැඩ් කව්ච්චියේ කෙළවරක වූ හිස් පොප්කෝන් බඳුන අතට ගත්තේය. "ඔයා මට ටිකක්වත් ඉතුරු කළේ නැද්ද...?"

"ඔයා දන්නවානේ ඩෙවින් ගැන... එයා ඒ සේරම කාලා. බිමත් හලලා. ඔයාට ඕන නම් ඒවා කන්න පුළුවන්."

"හේයි... මට එපා."

මගේ ජංගම දුරකතනය නාද වෙන්නට විය. මම එහි තිරය දෙස බැලුවෙමි. පොලී ගෙන් කෙටි පණිවිඩයක් පැමිණ තිබිණ.

"මගේ සාදය ගැන කතා කරන්න ඕනද...?"

මම දුරකතනය කෝපි මේසය මත තැබුවෙමි. "පොලිගේ සාදයට අපි මොකද කරන්නේ...?" මම බ්‍රැඩ් ගෙන් ඇසුවෙමි. "අපි ඒක වෙනුවෙන් මැරෙන්න තරම් මහන්සි වෙනවද...?"

ඔහු කව්ච්චිය මත වැටී තිබූ පොප්කෝන් අහුලා කමින් සිටියේය. "අපි මොනවාහරි දෙයක් කරන්න ඕන."

"අපි මොනවාහරි පිස්සු විකාර දෙයක් කරන්න ඕන. ඔයා දන්නවද...? හැමෝම බය වෙන විදිහේ දෙයක් කරන්න ඕන."

ඔහු සිනාසුණේය. "අපි ඒ වැඩේට හොඳ පුරුදු අයනෙ. ඔයාගේ මල්ලී ආයේ මාත් එක්ක කතා කරන එකකුත් නැහැ."

"එයාව අමතක කරන්න." මම පැවසුවේ කල්පනාවට වැටෙමිනි. "අපි පොලීගේ සාදයේ ඉන්න හැමෝම බය වෙන

විදිහේ දෙයක් කරන්නම ඕන."

අපි දෙදෙනා මඳක් නිහඬව සිටියෙමු. බ්‍රැඩ් තමා අත වූ වයසක මිනිසෙකුගේ රබර් වෙස් මුහුණ එසෙව්වේය. ඔහුගේ දෑස දැල්වෙමින් තිබිණ.

"හේයි... මට ආවා හොඳ අදහසක්......... මේක කොහොමද......?"

## 04

බ්‍රැඩ් කැත මහලු වෙස් මුහුණ එසවූයේය. "මේක කොහොමද...? බය හිතෙනවද...?"

"ඔව්..." මම පැවසුවෙමි. "මිච්ච බය කරන්න තරම් ඇති."

"හොඳයි... මේ වගේ කැත වෙස් මුහුණු හොයලා අපි දාගත්තොත් කොහොමද...? ඒවා ඔළුවේ පිටිපස්සට දාගමු." ඔහු වෙස් මුහුණ හිසේ පිටුපසට දාගත්තේය. "ඒකරලා අපි ඇඳුම් ඉස්සරහා පිටිපස්සට මාරු කරලා ඇඳගෙන පොලීගේ ගෙදරට පස්සෙන් පස්සට යමු..."

"ඒකද ඔයා ගාව තියෙන නරකම අදහස...?" මම ඇසුවෙමි. "මම කැමතියි... මම කැමතියි."

"ඇයි...?"

"වෙස් මුහුණ පිටිපස්සට දාගෙන ඇවිදිනකොට කිසිම දෙයක් පේන්නේ නැහැනෙ."

ඔහු හිස වැනුවේය. "ඔහ්... ඔව්... ඒක ඇත්ත."

"එතකොට බය හිතෙන්නේ නැහැ." මම කීවෙමි. "මෝඩ පෙනුමක් එන්නේ."

බ්‍රැඩ් හිස වැනුවේය. "ඔයා හරි."

"එහෙනම් තව ටිකක් හිතමු." මම පැවසුවෙමි.

බ්‍රැඩ් පිළිතුරක් දුන්නේ නැත. ඔහු වෙස් මුහුණ මුහුණ මතට පැළඳ ගත්තේය. අනතුරුව එය ගලවන්නට උත්සහ කරන්නට විය.

Scanned by CamScanner

''මොකක්ද ප්‍රශ්නෙ...?''මම ඇසුවෙමි.

ඔහු කෙඳිරිලි හඬක් නැගුවේය. ''ඒක... ඒක... ගැලවෙන්නේ නැහැ.''

''මොකක්...? හයියෙන් අදින්න...''

ඔහු වෙස් මුහුණ තදින් ඇද්දේය. මට ඔහුගේ දෑස පෙනුණේ නැත. නමුත් ඔහු බිය වී සිටින බව නම් මට දැනිණ. ''බ්‍රැඩ්...?''

''ඒක ඇලිලා...'' ඔහු කීවේය. ''මට උදව් කරන්න... ඒක... ඒක මගේ හමට ඇලිලා... ඒක මට ඇලිලා... ඌ ඇත්... උදව් කරන්න... මේ වෙස් මුහුණ... මාව ගිලගන්න හදන්නේ...''

මගේ හද ගැස්ම වේගවත් විය. බ්‍රැඩ් බියපත්ව සිටියේය.

ඔහු දෙපයින් නැගිට දඟලමින්, උඩ පනිමින් දෑතින්ම වෙස් මුහුණ ගලවා ගන්නට උත්සහ කළේය.

''උදව් කරන්න... අනේ උදව් කරන්න...''

මම කෑ ගසමින් නැගිට වෙස් මුහුණෙන් අල්ලා ගතිමි. අනතුරුව සියලු ශක්තිය යොදා ඉන් ඇද්දෙමි.

වෙස් මුහුණ බ්‍රැඩ්ගේ මුහුණෙන් පහසුවෙන්ම ගැලවී ආවේය.

මම දෑතින්ම වෙස් මුහුණ අල්ලාගෙන විස්මයෙන් බලා සිටියෙමි.

බ්‍රැඩ් නොනවත්වාම සිනාසෙන්නට විය. මුහුණ රතු වනතුරුම ඔහු සිනාසුණේය. ''ඔයාගේ පවුලම ලේසියෙන් බය කරන්න පුළුවන්.'' ඔහු කීවේය. ''ඔයාත් ඔයාගේ මල්ලී වගේම බියගුළු පූසියක්.''

''කට වහනවා.'' මම කීවෙමි. ඉන්පසු ඔහුගේ මුහුණටම වෙස් මුහුණෙන් පහරක් ගැසුවෙමි.

ඔහුගේ සිනහව වැඩි විය. ''මම ඒ විහිළුව කරනවා පොලීගේ සාදයේදී.''

''මම ඒකට බය වුණේ නැහැ.'' මම පැවසුවෙමි. නමුත් එය අසත්‍යයකි.

Scanned by CamScanner

''කවුද ඒ වගේ මෝඩ විහිළුවක් විශ්වාස කරන්නේ...? '' මම කීවෙමි. ''ගෙදර යන්න බ්‍රැඩ්... මම සාදයට විනෝදයක් ගේන්නම්.''

ඔහු වෙස් මුහුණ අතට ගත්තේය. ''අපිට පුළුවන් පොලීව බය කරන්න... මම ඒක දන්නවා.'' ඔහු කීවේය.

''මම තවම හිතනවා.'' මම ඔහුව ඉදිරිපස දොර වෙත රැගෙන ගියෙමි. ඉන්පසු දොර විවර කළෙමි.

ඒ සමගම අපි දෙදෙනාම බියකරු විලාපයක් නැගුවෙමු.

# 05

දොර අසල සිටගෙන සිටියේ යෝධ, කැත ගෝරිල්ලෙකි. ඌ අඩි අටක් පමණ උස විය. දුඹුරු පැහැ ලෝමයෙන් සිරුර වැසී තිබිණ. ඇස් රතු පැහැයෙන් දිලිසිණ.

ඌ මුව විවර කර බිහිසුණු ලෙස ගෙරවූයේය. මා අල්ලා ගන්නට උගේ ලොමින් ගහණ දෑත් දිගු වන විට මම ඉවතට පැන ගතිමි.

මඳ වෙලාවකින් ඒ ගෝරිලි ඇඳුමක් ඇඳ ගත් කිසිවෙකු බව අපට හඳුනාගත හැකි විය. ඒ වනවිටත් අප සිටියේ බොහෝ සේ බියපත්ව ය.

බ්‍රැඩ් සිනාසෙමින් ගෝරිල්ලාගේ හිස ගලවා ගත්තේය. ගෝරිලි ඇඳුම තුළ සිටියේ අපගේ මිතුරෙකු වන මාර්කස් ව්‍රිග් ය. ''හේයි.... මම ඔයාලාව බය කළාද...?''

''නැහැ.'' මම තෙපලුවෙමි.

''මේක නම් අපූරු ඇඳුමක්.'' බ්‍රැඩ් කීවේ ඇඳුමේ ලොම් අතගාමිනි. ''මේවා ඇත්ත ලොම්ද...?''

''මම හිතන්නේ මේක හදලා තියෙන්නේ ඇත්ත ගෝරිල්ලෙක් ගෙන්.'' මාර්කස් පැවසුවේය.

Scanned by CamScanner

"ඔයා විහිළු කරනවා." මම තෙපලුවෙමි.

ඔහු හිස වැනුවේය. "ඔව්... මම විහිළු කරනවා." ඔහු ගෝරිලි අතකින් නළලතේ වූ දහදිය පිසදා ගත්තේය.

"ඔයා මේක ඇඳගෙනද මෙහෙට ඇවිදගෙන ආවේ....?" බ්‍රැඩ් ඇසුවේය.

මාර්කස් නිවසට ඇතුළු වූයේය. ඔහු ගෝරිලි හිස මේසයක් මත තැබුවේය. "කාර් කීපයක්ම මට හෝන් කළා. ඒත් වෙන කවුරුවත් මාව ගණන් ගත්තේ නැහැ."

"කවුද ඔය...?" මව කතා කළාය. සාලයට ආ ඇයට මාර්කස්ව දක්නට ලැබිණි. "මාර්කස්... ඔයා ඩොක්ටර් කෙනෙක් ළඟට ගියොත් හොඳ නැද්ද...? අවුරුදු දොළහක් වයස ළමයෙකුට ඔය තරම් ලොම් තියෙන එක හොඳ දෙයක් නෙවෙයි."

මගේ පවුලේ මිව් හැර අන් සියලු දෙනාම හොඳ විහිළුකාරයෝ ය.

මව සහ මාර්කස් මඳ වෙලාවක් ඇඳුම ගැන එකිනෙකා සමග විහිළු බස් පවසා ගත්හ. මම මුළුතැන්ගෙයට ගොස් මාර්කස්ට සීතල බීමක් ගෙන ආවෙමි.

මව නැවතත් පියා සමග වීඩියෝ ක්‍රීඩා කිරීමට ගියාය. මාර්කස් සෝපාවේ වාඩි වූයේය."ඇයි ඔයා ඔය ඇඳුම ගලවන්නේ නැත්තේ...?" මම ඇසුවෙමි.

ඔහු සිනාසුණේය. "මම මේක ඇතුළේ හිරවෙලා ඉන්නේ..."

"විහිළුවක් නේද...?"

ඔහු හිස වැනුවේය. "විහිළුවක් තමයි. ඔයාලා පොලීගේ සාදයට අඳින්න ඇඳුම් ගත්තද...? ඔයාලාට පුළුවන් ඒවා මගේ තාත්තාගේ කඩෙන් ගන්න. එයාගේ කඩේ නියම ඇඳුම් ටිකකුයි, වෙස් මුහුණුයි තියෙනවා. මේ වගේ ඒවා."

මගේ මුව විවර විය. "ඔයාගේ තාත්තා කඩයක් දැම්මාද.....?"

මාර්කස් හිස වැනුවේය. "ඔයාලා දන්නවානේ දෙවන

Scanned by CamScanner

වීදියේ තියෙන කඩ පේළිය. සියලු ශාන්තුවරයින්ගේ සැදෑව ඉවර වෙනකම් තාත්තා එතන කඩයක් දාගත්තා.''

'' මගේ තාත්තා කිව්වා එතන කලින් තිබුණාලු විලියම්ගේ වෙස් මුහුණු කියලා ප්‍රසිද්ධ කඩයක්. ඒකලු ඒ කාලේ ලෝකේ තිබුණු හොඳම වෙස් මුහුණු කඩය. විලියම් පොඩි කාලේ ඉඳලාම එයාගේ තාත්තා එයාට ඒ වෙළඳාම හුරු කළාලු. විලියම් වෙස් මුහුණුවලට හරිම ආදරෙයිලු.''

මාර්කස් බිම වැටී තිබූ පොප්කෝන් අහුලා කටට දාගන්නට විය. ''මගේ තාත්තා පරණ වෙස් මුහුණු පරීක්ෂා කළා. එතන චීනෙන්, අප්‍රිකාවෙන් වගේම ඈත පෙරදිගින් ගෙනාව වෙස් මුහුණුත් තිබුණලු.''

''ඔයාගේ තාත්තා ගාව බය කරන්න පුළුවන් දෙයක් නැද්ද...?'' බ්‍රැඩ් ඇසුවේය. ''මම කියන්නේ ඇත්තටම බය හිතෙන දෙයක්...? පොලීගේ සාදයම හොලවන්න පුළුවන් විදිහේ.''

මාර්කස් තම හිස සෙලවූයේය. ''ඔයාලා විශ්වාස කරනවද පොලීගේ අම්මා එකෝඩිනය වාදනය කරන අතරේ සින්දු කියන සාදයක ඒ වගේ දෙයක් තියෙන්න පුළුවන් කියලා...?''

අපි තිදෙනාම සුසුම් හෙලුවෙමු.

''මට තියෙනවා හොඳ අදහසක්.'' මාර්කස් පැවසුවේය. ''ඔයා බ්‍රැඩ් එක්ක මුලින්ම සාදයට යන්න. ඒ කරලා ඔයාලා පොලි ගෙන් අහන්න යෝධ ගෝරිල්ලෙක් සත්තු වත්තෙන් පැන්නා කියලා අහන්න ලැබුණද කියලා... එතකොටම මම උඩු මහලේ ජනේලයෙන් ඇතුළට එන්නම්. මට පුළුවන් තරප්පු පෙළ දිගේ මගේ අත් පද්ද පද්දා...''

''බොරු වැඩක්...'' මම බාධා කළෙමි.

''ඇත්තටම...'' බ්‍රැඩ් ද එයට එකඟ විය.

''මගේ තාත්තා ගාව තියෙනවා මිනිස් අත් කකුල්...'' මාර්කස් කීවේය. ''ඒවා ඇත්තම ඒවා වගේ. මට පුළුවන් මිනිස් අතක් මගේ දත්වලින් හපාගෙන එන්න.''

''ඒකත් විකාරයක්...'' මම පැවසුවෙමි. ''ළමයි හිනාවෙයි.''

Scanned by CamScanner

බ්‍රෙඞ් ගෝරිලි හිස මාර්කස්ට පැළඳවූයේය. "තව හිතන්න... බ්‍රෙඩ් ගෝරිලි හිස මාර්කස්ට පැළඳවූයේය."

සාදයම තිගැස්සෙන විදිහේ දෙයක්."

අපි සියලු දෙනාම එයට එකඟ වූයෙමු.

එය එලෙසින්ම සිදු විය. සාදය අප සිතා සිටියාටත් වඩා බියජනක විය.

# 06

සියලු ගාන්තුවරයින්ගේ සැදෑව දා රාත්‍රියේ මා පොලීගේ සාදයට ගියේ වැම්පයරයෙකු සේ වෙස් වලාගෙන ය. තවත් බොහෝ වැම්පයරයන් එහි පැමිණෙන බව මා දැන සිටියද මම ඒ කිසිවක් ගණනකට නොගත්තෙමි.

දැස් සුදු පැහැයෙන් වර්ණ ගැන්වූ මම ඇස් වටා කළු පැහැ රවුම් ඇඳ ගතිමි. මගේ දෙතොල් කළු පැහැ ලිප්ටික් තවරා තිබූ අතර මගේ මුවේ සිට නිකට දක්වා වැගිරෙන රුධිරය රතු පැහැයෙන් වර්ණ ගන්වා ගතිමි. මා ඇඳ සිටියේ මගේ මවගේ කළු පැහැ දිගු සායක් සහ කළු පැහැ දිගු කමිසයකි.

පොලීගේ නිවස මගේ නිවසේ සිට නිවාස පේළි දෙකක් එපිටින් වූවකි. ඒ නිසා මම ඒ වෙත ඇවිද යන්නට වීමි. එය ඔක්තෝබරයේ සීතල රාත්‍රියක් විය. සඳ වළාකුළුවලට වැසී තිබිණ. සුළඟට සෙලවෙන ගස් කොඳුරන්නාක් වැනි හඬක් නිකුත් කළේය.

මට විහිළු තහළු කරමින් ගමන් කරන ළමුන් කණ්ඩායමක් දැක ගත හැකි විය. ඔවුහු තම තමන්ගේ ඇඳුම් එකිනෙකාට පෙන්වමින් රසකැවිලි කමින් විනෝදයෙන් ගමන් කළහ.

මම සුසුම් හෙලුවෙමි. මා අද ගෙවන රැය අත් අයට තරම් මට විනෝදජනක නොවන බව මම දැන සිටියෙමි.

පොලීගේ නිවසේ ඉදිරිපස දොර අසල විශාල ජැක්

ලන්තෑරුම් දෙකක් එල්ලා තිබිණ. දල්වන ලද එම ලන්තෑරුම්වල වූයේ බිහිසුණු සිනාසෙන මුහුණු ය. නිවස තුළ ද සියලුම විදුලි පහන් දල්වා තිබිණ. නිවස තුළින් සංගීත නාදයක් ගලා ආවද මට එය හඳුනාගත හැකි වූයේ නැත.

මම විසිත්ත කාමරයට ඇතුළු වූයෙමි. තවකෙකුගේ සිරුරේ නොහැපී මා බේරුණේ යන්තමිනි. මට තවත් වැම්පයර්වරුන් දෙදෙනෙකු දැකගත හැකි විය. ඔවුන් දෙදෙනාට පියාපත් තිබිණ. මට පියාපත් ගැන මුළුමනින්ම අමතක වී ඇත.

කොළ පැහැ මුහුණින් යුතු අවතාරයක් ද මගේ නෙත ගැටිණ. මම දම් සහ නිල් පැහැයෙන් සැරසුණු සතුන් එහා මෙහා කරමින් ඉදිරියට ගියෙමි. එක් අයෙකුට හිස් දෙකක් තිබිණ. පිරිමි ළමයි තිදෙනෙක් සත්ත්ව හිස් පැළඳ සිටියහ. ඔවුන් එළදෙනුන් දැයි මට සිතාගත නොහැකි විය.

විසිත්ත කාමරය විවිධ ඇඳුමින් වෙස් වලාගත් ළමුන් ගෙන් පිරී තිබූ නිසා මට ඇවිද යාම අසීරු විය. මම මිනිසුන්ගේ හැපෙමින් පොලීව සෙව්වෙමි. පොලී හැම වසරකම හැඩ වූයේ කුමරියක මෙන් සුදු පැහැ ඇඳුමකිනි.

නමුත් මට ඇයව සොයා ගත නොහැකි විය.

ඉන්පසු මම ගෝරිලි ඇඳුමින් සැරසුණු මාර්කස්ව සහ කැත මහලු මිනිස් මුහුණින් සැරසුණු බ්‍රැඩ්ව සෙව්වෙමි. ඔවුන්ගේ ද සලකුණක්වත් නැත.

''ඒයි... සමාවෙන්න...'' මා විසිවී වැටෙන තරමේ වේගයෙන් මගේ සිරුරේ හැපුණු කැරකුණු අඟක් සහිත මෘගයෙක් කීවේය.

සංගීතය ද වෙන වසරවලට වඩා වෙනස් ය. එය සාදයක සංගීතයක් නොවීය. දුක්බර, වැලපෙන සංගීත නාදයකි.

''මේක නම් පොලීගේ වෙනදා සාදවල සංගීත නාදයක් නෙවෙයි.... එයා හැමදාම දාන්නේ බබාලාගේ සංගීතයක්නෙ.''

''ඔයා පොලීව දැක්කද...?'' මම දිග පොරවනයකින් සැරසී සිටි අවතාරයකින් ඇසුවෙමි.

Scanned by CamScanner

අවතාරය පෙරලා මා දෙස බැලුවේය.

"පොලීගේ අම්මා කෝ...?" මම ඇසුවෙමි.

අවතාරය බලා සිටියා මිස පිළිතුරු දුන්නේ නැත.

"හේයි... හැමෝම මෙ අහන්න... දැන් අපි වාදනය කරන්න යන්නේ රවුමට කන සෙල්ලම." ඉදිරිපස කාමරයකින් හඬක් නැගිණ. නමුත් කතා කළ කෙනා මට පෙනුණේ නැත. ඒ කටහඬ පොලීගේ නොවන බව මම හඳුනාගතිමි.

"රවුමට කන්න..."කිසිවෙක් කීවේය. "නියමයි... රවුමට කන්න... රවුමට කන්න..."

එය කුමන ආකාරයේ මෝඩ සෙල්ලමක්ද...? මා කිසිදාක එවන් සෙල්ලමක් අසා නැත.

"පොලී...? ඔයා කොහෙද ඉන්නේ...?"

"මගේ යාළුවෝ කොහේද...?"

අඩි අටක් උස ගෝරිල්ලෙකුට මෙවන් පිරිසක් අතර සැඟව සිටිය නොහැකි ය.

පොලීගේ මව වෙනදා සාදවලදී දොර අසල සිටගෙන ඩොලර් පහ එකතු කරමින් සිටියි. මම දොර දෙස හැරී බැලුවෙමි. කහ සහ කොළ පැහැ කෘමි ඇඳුම්වලින් සැරසුණු ළමයි පිරිසක් දොරෙන් ඇතුළු වෙමින් සිටියහ. නමුත් මාර්ටින් නෝනාගේ සලකුණක්වත් දොර අසල නොවීය.

ගිනි උදුන අසලින් තබා තිබූ සුපුරුදු එකෝඩිනය ද එතන නොවිණ.

ඇය කොහේද...?

"රවුමට කමුද...?" පිරිමි ළමයෙක් මගෙන් ඇසුවේය.

මා කිසිදිනක එවන් සෙල්ලමක් අසා නැත. පොලී කිසියම් අලුත් සෙල්ලමක් සොයාගෙනවත්ද...?

"ඔයා පොලීව දැක්කද...?" මම වැම්පයර් ඇඳුමින් සැරසුණු තවත් ගැහැනු ළමයෙකු ගෙන් ඇසුවෙමි.

ඇය මුව විවර කළ අතර ඇයගේ උල් දත් පිටතට දිස් විය.

"පොලී...?" මම නැවතත් ඇසුවෙමි. "මට පොලීව හොයා

ගන්න බැහැ.''

අනිත් වැම්පයර් කිසිවක් තෙපලුවද එය මට ඇසුණේ නැත.

මුහුදු මංකොල්ලකාරයින් මෙන් සැරසුණු පිරිමි ළමයි දෙදෙනෙක් වාදයක පැටලී සිටියහ. ඔවුන් උස් හඬින් කතා කළද ඔවුන් කතා කළ භාෂාව මට වැටහුණේ නැත. මා පාසලේදී ස්පාඤ්ඤ භාෂාව ඉගෙන ගෙන ඇත. නමුත් ඔවුන් කතා කළේ ස්පාඤ්ඤ භාෂාව නොවේ. එය අමුතුම භාෂාවකි.

ළමයි කණ්ඩායමක් ගීතයක් ගයන්නට වූහ. ඔවුන් ගී ගැයුවේ මා කිසිදා අසා නැති භාෂාවකිනි.

එය විනෝදාත්මක ගීයක් යැයි හැගෙන සේ ළමයි සිනාසුණහ.

මම දෑස වසා ගතිමි. එපමණක් ද නොව දෑතින්ම දෙසවන් වසා ගන්නට උත්සහ කළෙමි.

මෙය සිත කලඹවන දෙයක් විය. පොලී නැත. මිතුරන් නැත. මා හඳුනන කිසිවෙකුත් නැත. සියලු දෙනාම සිටියේ මා නොදන්නා සෙල්ලමක් ගැන කතා කරමින් මෙන්ම මා නොදන්නා අමුතු භාෂාවකින් ගී ගයමිනි.

මා පැමිණ සිටින්නේ වැරදි සාදයකට ද...?

එය එසේ සිදු විය නොහැකි බව මම දැන සිටියෙමි. පොලීගේ නිවස මගේ නිවස මෙන්ම හොඳින් මම දැන සිටියෙමි.

එසේ නම් සිදුව තිබෙන්නේ කුමක්ද...?

කාමරය එක්වරම නිහඬ විය. ගීත ගායනා සහ කතාවන් නැවතිණ. සංගීතය ද නතර විය.

දෑස් විවර කර බැලූ මට දක්නට ලැබුණේ ළමුන් රවුමක් සෑදී සිටින බව ය. වදනක්වත් නොපවසා ඔවුහු මා වටා රවුමක් සැකසී සිටියහ.

ඔවුන් සියලු දෙනාගේම දෑස් යොමුව තිබුණේ මා වෙතට ය. මට ඉවත් වෙන්නට අවස්ථාවක් ලැබුණේ නැත. ඔවුහු මා වටා ශක්තිමත් රවුමක් සකසා ගෙන සිටියහ.

Scanned by CamScanner

රවුම මුලින් මුලින් සෙමින් ද පසුව වේගයෙන් ද කැරකෙන්නට විය. මා පුදුමයෙන් මෙන්ම බියෙන් බලා සිටියදී ළමයි ගායනයක් පටන් ගත්හ.

"පිප්පා පිප්පා වාහ් වාහ් වාහ්
පිප්පා වාහ් පිප්පා වාහ්
පිප්පා පිප්පා වාහ් වාහ්..."

එහි තේරුම කුමක්ද...? ඔවුන් මා වට කර ගායනා කරන්නේ කුමක් නිසාද...? මා දෙස මෙසේ කෝපයෙන් බලා සිටින්නේ කුමක් නිසාද...?

මම හැරි හැරී පලා යන්නට ඉඩක් සෙව්වෙමි. නමුත් ගායනා කරමින් රවුමට යන ළමුන් අතරින් පලා යන්නට කිසිදු ඉඩක් නොවිණ.

"පිප්පා පිප්පා වාහ් වාහ් වාහ්
පිප්පා වාහ් පිප්පා වාහ්
පිප්පා පිප්පා වාහ් වාහ්..."

"අනේ... එපා..." මම වෙව්ලන හඬින් කෑ ගැසුවෙමි. "අනේ... මොනවද ඔයාලාට ඕන...? ඇයි මේ විදිහට කරන්නේ...?"

රවුමේ යාම නතර විය. ගායනය ද නතර විය.

එක්වරම මට කෑ ගැස්සිණ. ඒ ඔවුන් ඔවුන්ගේ හිස් ගලවන්නට වූ බැවිනි.

ඔවුහු ඔවුන්ගේ හිස් ගලවා දැමූහ.

"ඔහ්... එපා..." මම මැසිවිලි නැගුවෙමි. **"එපාාාාාාාාාාාාාාා..."**

ඔවුහු තම හිස් ගලවා ඉහළට එසවූහ.

මම හිස් නොමැති උරහිස් දෙස බලා සිටියෙමි. කාමරයම හිස් රහිත ළමුන් ගෙන් පිරී තිබිණ.

එක්වරම එම හිස් විලාප නගන්නට වූහ.

"එපා... නවත්තන්න... නවත්තන්න..." මම ඇයදුවෙමි. නමුත් ඔවුන්ගේ බියකරු කෑ ගැසීම් මැද මටවත් මගේ කටහඬ

ඇසුණේ නැත.

එවිටම කිසිවෙකු මගේ අතින් අල්ලනු මට දැනිණ.

''හහ්...?''

මම බියෙන් හඬ නැගුවෙමි. මාව අල්ලාගත්තේ කවුරුන්ද...?

පහත බැලූ මට දක්නට ලැබුණේ මගේ සොහොයුරා මිච් ය. ඔහු මගේ අතින් අදිමින් අඬමින් සිටියේය. ඔහුගේ රත් පැහැ මුහුණ දිගේ කඳුළු ගලා බසිමින් තිබිණ.

''මට උදව් කරන්න ලූ ඇන්...'' ඔහු කෑ ගැසුවේය. ''මට උදව් කරන්න.''

ඔහු හිස්වල විලාපය පරයමින් කෑ ගැසීය.

''මට උදව් කරන්න... අනේ ලූ ඇන්... මට උදව් කරන්න.''

# 07

''මට උදව් කරන්න ලූ ඇන්...'' මිච් සිහින් හඬින් කීවේය. ''මට උදව් කරන්න.... මට මගේ දත් බෙහෙත් එක ඇර ගන්න බැහැ.''

හහ්...?

මම ඇසි පිය සැලුවෙමි. මගේ ඇස් පිහාටු බරැති සහ වියළි විය.

මිච් දත් බෙහෙත් ටියුබයක් මගේ මුහුණට අල්ලාගෙන සිටියේය. මම වටපිට බැලුවෙමි. ඒ මගේ නිදන කාමරය යි. අළු පැහැ ආලෝකයක් ජනේලයෙන් කාමරය තුළට ගලා එමින් තිබිණ. පෙරදා මා ඇඳි ඇඳුම් කාමරයේ බිම වැටී තිබිණ.

''සමාවෙන්න මිච්...'' මම දත් බෙහෙත් ටියුබය ඔහු අතින් ගෙන එය විවර කර දුනිමි. ''මම හීනයක් දැක්කා. බය හිතෙන හීනයක්.''

ඔහු සිනාසුණේය. "අල්මාරියේ ජීවත් වෙන මහලු මිනිහෙක් ගැනද...?"

"නැහැ... වෙනස් එකක්.... සියලු ගාන්තුවරයින්ගේ සැඳෑ සාදය ගැන එකක්."

"හා... හා.... ඔයාට එහෙම වෙන්න ඕන. හැමදාම මට ඒ විදිහේ කතා කියනවාට."

ඔහු දත් බෙහෙත් වියුබය මිරිකා ඇඟිල්ලට දත් බෙහෙත් ගෙන මගේ නාසයේ තැවරුවේය.

මම ඔහුව අල්ලා ගන්නට හැදුවෙමි. නමුත් ඔහු මගෙන් මිදී පලා ගියේය.

මම සෙමින් නැගිට දත් බෙහෙත් පිස දා ගතිමි. මගේ සිත තිබුණේම මා දුටු සිහිනයේ ය.

"හොඳයි... ඒක නම් බය හිතෙන හීනයක්."

වාසනාවට මෙන් එය සිහිනයක් මිස සැබෑවක් නොවීය.

**************

සාදය වෙලාවේදී පොලීගේ මව මාව නිවසේ ඉදිරිපස දොර අසලදීම පිළිගත්තාය.

ඇය සෑම වසරකම පාහේ පළඳින මායාකාරියකගේ උස් තොප්පිය පැළඳ සිටියාය. ඇයගේ දිග නියපොතු කළු පැහැයෙන් වර්ණ ගන්වා තිබූ අතර ඇයගේ තොල් ආලේපන ද කළු පැහැ විය.

"හායි... ලූ ඈන්..." ඇය කතා කළාය. "ඉන්න මම ඔයා දිහා හොඳට බලනකම්." ඇය මා ඇඳ සිටි ඇඳුම විපරම් කළාය. "ඔයා ඇඳගෙන ඉන්නේ මායාකාරියක් වගේ නේද...?"

ඇය හැමදෙනා සමගම කතා කළේ ඔවුන් වයස අවුරුදු පහේ අය යැයි සිතා සිටින අන්දමිනි.

"නැහැ. මම වැම්පයර් කෙනෙක්."

ඇය අතක් කම්මුල මත තබා ගත්තාය. "මේ අවුරුද්දේ වැම්පයර්ලා වැඩියි. ඔයා ඇත්ත ලේ බොන්නේ නැහැනේ නේද...?"

ඇය සිනාසුණාය. එය නම් අපූරු විහිළුවකි.

"අතුරුපස වෙලාවට විතරයි." මම කීවෙමි. ඉන්පසු මම ද ඇයගේ සිනාවට එක් වූයෙමි.

ඇය හොඳ මවක සේම යහපත් කාන්තාවකි. ඇය නිවස තුළ පොලීට නිදහස ලබා දී තිබිණ. පොලීට පාසලේ රැය ගත කිරීමට ඇවසි විට ඒ සඳහා පවා ඉඩ ලැබිණ. එමෙන්ම මාටින් නෝනා, පොලීගේ පන්තියේ ළමුන්ට නිතරම සාද පැවැත්වූවාය.

මම ඇයට ඩොලර් පහක ඇතුළු වීමේ ගාස්තුව දුන්නෙමි. ඉන්පසු මම විසිත්ත කාමරයට ගොස් කුමරියක මෙන් සැරසී පිරිස අතර සිටි පොලීට අත වැනුවෙමි.

මට යෝධ ගෝරිලි ඇඳුමෙන් සැරසී කෑම මේසයකට නැඹුරු වී සිටි මාර්කස්ව දැකගත හැකි විය. ඔහු වටා සිටි ළමයි ඔහුගේ හැසිරීමෙන් විනෝද වූහ.

මට විසිත්ත කාමරයේ ඈත කෙළවර වූ ගිනි උදුන දක්වාම දැකිය හැකි විය. කෙළවරක ළමයි කිහිප දෙනෙක් පුටු කිහිපයක් තබාගෙන වාඩි වී සිටියහ. ඔවුන් පටන් ගැන්මේ සිටම සාදයේ උදාසීන බව ගැන මැසිවිලි නගමින් සිටින බව මට සිතාගත හැකි විය.

කෑම මේසය මත වට්ටක්කා හැඩයේ බිස්කට් සහ තැඹිලි පැහැ ද්‍රවයකින් පිරුණු බඳුනක් දැකිය හැකි විය. බ්‍රැඩ් කෝප්පයක් අතැතිව සිටගෙන සිටියේය. ඔහු මහලු මිනිස් වෙස් මුහුණ පැළඳගෙන අසීරුවෙන් එය පානය කරනු ඇතැයි මට සිතිණ.

"කාටහරි ඕනද දඟර නැටුම නටන්න...?" පොලී ඇසුවාය.

"ඔහ්... ඔව්." ඇයගේ මව තෙපලුවාය. "සියලු ශාන්තුවරයින්ගේ සැදෑ ඇඳුම් ඇඳගෙන දඟර නැටුම් නටන එක විනෝදයක් නේද...? ඒක හරිම විනෝදයි..."

ළමයි කිහිප දෙනෙක් කන්කෙඳිරි ගෑහ. ගිය වසරේ අප එම නැටුමම නැටූ අයුරු මට සිහිපත් විය. එය අසීරු දෙයකි. බොහෝ ඇඳුම් ඉරී ගැලවී ගිය අතර අවසානයේ නැටුම සටනක්

Scanned by CamScanner

බවට පත් විය.

"මට තියෙනවා හොඳ අදහසක්." පොලී කෑ ගැසුවාය.

"පොලී කියන දේ අහන්න දරුවනේ." ඇයගේ මව කෑ ගසා කීවාය. "පොලීට තියෙනවා හොඳ අදහසක්."

"අර මුල්ලේ තියෙන තැඹිලි පාටයි, කළු පාටයි බැලූන් පේනවද...?" පොලී ඇසුවාය. "හැමෝම බැලූනයක් අතට ගන්න. මම පෙන්නන්නම් ඔයාලාට කරන්න ඕන දේ."

ඇය තැඹිලි බැලූනයක් ගෙන තළලේ පිරිමදින්නට වූවාය. "දැක්කද...? ඔයාලා බැලූනය තළලේ අතුල්ලන්න ඕන ඒක ඔයාලාගේ මෙස් මුහුණේ ඇලවෙනකම්. ඊට පස්සේ අපි තුනට ගණන් කරනවා. අපි බලමු කාටද වැඩි වෙලාවක් බැලූම තළලේ අලවලා තියාගන්න පුළුවන් කියලා."

"අපි ජයග්‍රහණය කරන කෙනාට හොඳ තෑග්ගක් දෙනවා." ඇයගේ මව වැඩිදුරටත් පැවසුවාය. "ලොකු රසකැවිලි මල්ලක්."

"මට ඒක විශ්වාස කරන්න බැහැ." මම මැසිවිලි නැගුවෙමි.

මම බ්‍රැඩ්ව ගේ අතින් අල්ලා ඔහුව මාර්කස් වෙත ඇදගෙන ගියෙමි. "මට මේක කරන්න බැහැ." මම පැවසුවෙමි. "මට බැහැ."

"ශූ ඇත්... ඔයාට රසකැවිලි මල්ල දිනන්න ඕන නැද්ද...?" මාර්කස් විහිළු කළේය.

"කට වහනවා." මම ඔහුව තල්ලු කළෙමි. "එන්න ළමයි... අපි මෙහෙන් යන්න යමු."

"මෙහෙන් යන්න...? කොහෙටද...?" බ්‍රැඩ් ඇසුවේය.

මම ඔවුන් දෙදෙනාවම තල්ලු කළෙමි. "එන්න... මාත් එක්ක යමු. අපි උඩු මහලට යමු. සමහරවිට එහෙ ඇති උද්යෝගිමත් දෙයක්."

Scanned by CamScanner

# 08

අප යන්නේ කොහේදැයි මා සිතුවේ නැත. මට අවශ්‍ය වූයේ බැලුන් සෙල්ලමෙන් සහ මෙම ළදරු සාදයෙන් ඉවත් වීමටය.

පිරිමි ළමයි දෙදෙනා මා පසුපස පඩිපෙළ වෙත පැමිණියහ. උඩු මහලේ සාලය කෙළවර තවත් පඩිපෙළක් විය.

''අපි යමු...'' අපි පඩිපෙළ දිගේ ඉහළට නැගුණෙමු. එය ලී පඩිපෙළකි.

''අට්ටාලයක්....''මම මිමිණුවෙමි.

විදුලි ස්විචය අත පත ගා සොයා ගන්නට මට හැකි විය. එය ක්‍රියාත්මක කළ විට කහ පැහැ විදුලි බල්බයක් දැල්විණ.

මම මඳ ආලෝකයට මගේ දෑස හුරු වන තුරු බලා සිටියෙමි.

අප පිවිස තිබුණේ දිගු කාමරයකටය. එය තිර රෙදි සහ පරණ පත්තරයේ ගෘහ භාණ්ඩද පත්තර සහ සගරා ගොඩවල් වලින්ද පිරී තිබිණ. කාමරයේ කෙළවරක වූ එකම එක ජනේලය සුළඟට හසුව අබලන් වී තිබිණ.

මාර්කස් තම ගෙරවිලි වෙස් මුහුණ ගලවා දැමුවේය.

''මේක අට්ටාලයක්....'' මම කීවෙමි.

''මෙතැන හරිම රස්නෙයි...''බ්‍රැඩ් පැමිණිලි කළේය.

''රස්නෙයි වගේම කසළ ගොඩක්....''

ඔහුද තමා පැළඳ සිටි මහලු මිනිසාගේ වෙස් මුහුණ ගලවා දහදිය පිසදමා ගත්තේය.

''අඩුම තරමේ මෙතැන බැලුන්වත් නැහැනෙ...''මම කීවෙමි. මගේ කටහඬ කාමරය පුරා පැතිර ගියේය. සිවිලිමේ විදුලි පහනෙන් ප්‍රමාණවත් ආලෝකයක් නික්මුණේ නැත.

මම බිත්තිය අසල වූ පරණ තීන්ත බඳු පෙට්ටියක් වෙත ගියෙමි. අඩිය තබන වාරයක් පාසා බිම වූ ලෑලි තට්ටුව හඬ

Scanned by CamScanner

නැගුවේය. තීන්ත බඩු දූහුවිල්ලෙන් වැසී තිබිණ. ඒ නිසා ඒ උපකරණ වෙන් වෙන්ව හඳුනා ගැනීම පවා මට අපහසු විය.

බ්‍රැඩ් පරණ සඟරා දෙසක් පිරික්සන්නට වූයේය.

''ඊයා මේ බලන්න මේ සඟරා ඇලෙනවා. ඒ වගේම පුංචි පණුවොත් ඉන්නවා.''

''ඔහ්....''මාර්ක්ස් කීවේ පරණ ඇඳ විට්ටමක පය හැපුණු බැවිනි.

''සාදයට වැඩිය මෙතැන කම්මැලියි.'' ඔහු කීවේය.

''අපි ආපහු යමුද...?''

''ඉන්න...'' මම නෙපලුවෙමි. ''මේක බලමු.....''

මගේ දෑස් කළු සහ රන් පැහැ කැටයමින් අලංකාර කරන ලද පරණ පෙට්ටියක් වෙත යොමු විය. එය පෙනුමෙන් මුහුදු මංකොල්ලකාර පෙට්ටියක් මෙන් විය. මා එයට පා පහරක් දුන්නෙමි.

''සමහර විට ඒක පිරිලා තියෙන්නේ දියමන්ති වලිනුයි මැණික් වලිනුයි වෙන්න ඇති....'' මම කීවෙමි.

පිරිමි ළමයි ද මා අසලට පැමිණියහ. අපි තිදෙනාම එක්ව පෙට්ටියේ බරැති පියන එසැවීමට උත්සාහ කළෙමු.

''උහ්...'' පෙට්ටියෙන් පිටතට පුස් ගඳක් විහිදිණ. පෙට්ටියේ පියන විවර වුවද එහි කිසිදු ආභරණයක් තිබුණේ නැත.

''පරණ ඇඳුම් ද තියෙන්නේ.....?'' බ්‍රැඩ් ඇසුවේය. ඔහු අඩියක් පසුපසට ගත්තේය.

''එපා....පරීක්ෂා කරලා බලමු...'' මම කීවෙමි.

මම පෙට්ටිය තුළ වූ රතු පැහැ ඇඳුමක් පිටතට ඇද ගත්තෙමි. එය පිටුපසින් වලිගයක් එල්ලෙන ආකාරයේ ඇඳුමක් විය. මාර්කස් නැමී තවත් යමක් අතට ගෙන බැලුවේය.

''වෙස් මුහුණක් හරිම කැතයි යක්ෂ පාටයි....'' ඔහු එය අල්ලා පෙන්නුවේය.

''පරණ ඇඳුමක් වෙන්න ඕන...'' බ්‍රැඩ් පැවසුවේය.

''මේ බලන්න මේ පෙට්ටිය පිරිලා තියෙන්නේ පරණ

Scanned by CamScanner

වෙස් වළා ගත්ත ඇඳුම් වලින්......''

ඉන්පසු ඔහු පිටතට ඇද ගත්තේ කළු පැහැති දිග ඇඳුමකි.

''ඒයි මේ බලන්න....''මාර්කස් පැවසුවේය.

''මේක ඇත්තම දිවි හමක්ද....? ඔහ්......වාව්...මට නම් මේක විශ්වාස කරන්නත් බැහැ...'' නමුත් එහි රබර් වෙස් මුහුණෙන් නිකුත් වූයේ අප්‍රසන්න ගඳකි. එය දැස් තුනක් සහිත වෙස් මුහුණකි.

''ඊයා... මේක හරිම ගඳයිනෙ...''නාසය වසා ගනිමින් මම කීවෙමි. ''මම ගණන් ගන්නේ නැහැ ඒ ගඳ.......ඒක හරිම සීතලයි.''බ්‍රැඩ් පැවසුවේය.

''අපිට පුලුවන් මේ ඇඳුම් ඇඳගෙන ගිහින් පහළ ඉන්න හැමෝම බය කරන්න....'' ඔහු තමා ඇඳ සිටි ඇඳුම ඉවත් කර කළු ලොම් දිවි ඇඳුම ඇඳ ගත්තේය.

මාර්කස්ද රතු පැහැ යක්ෂ ඇඳුම ඇඳ ගන්නට වූයේය.

''පෙට්ටිය පතුලේ තව මොනවා හරි දෙයක් තියෙනවා..'' මම කීවෙමි. ''මේ ඇඳුම් වලට යට වෙලා...'' මම පෙට්ටිය තුළ වූ ඇඳුම් එකින් එක ඇද පතුලේ වූ කැතම කැත වෙස් මුහුණක් පිටතට ගත්තෙමි.

එය කැත කොළ පැහැයකින් යුතු විය. එහි පෙනුම කෘමියෙකුගේ හිසක් මෙන් වූ අතර එහි උල් කන් සහ විශාල දැස් සිදුරු විය. එමෙන්ම එහි සම ඉතා සිනිඳු විය. එහි මුවේ උල් දත් දෙපෙළක් විය. මම එය මගේ මුහුණ ඉදිරියෙන් අල්ලා ගත්තෙමි.

''ඔයාලා මොකද හිතන්නේ....?''

''මට නම් මූණු දෙකේ වෙනසක් පේන්නේ නැහැ....''මාර්කස් විහිලු කළේය.

''ඇත්තමයි....''බ්‍රැඩ් කීවේය.

''කට වහ ගන්නවා....'' මම කීවෙමි. වෙස් මුහුණටම ගැලපෙන කැත කොළ පැහැ ඇඳුමක් ද පෙට්ටියේ තිබී මට සොයා ගත හැකි විය. මම එය ඇඳ ගන්නට වූයෙමි. බ්‍රැඩ් ද වෙස් මුහුණක් සොයා ගත්තේය. එය මිනිස් මුහුණක් මෙන් විය. එහි

Scanned by CamScanner

මුව විලාප නගන්නට මෙන් විවර වී තිබිණ. එහි හිසේ තුවාලයක් වූ අතර ඉන් ගලා ආ දීප්තිමත් රතු පැහැ රුධිර දහරාවන් දෙකක් මුහුණ දෙපසින් ගලා බසිමින් තිබිණ.

''මම කැමතියි මේකට.'' ඔහු කීවේය. ''මේක හරියට අපේ තාත්තා රැවුල කපද්දී මුහුණ තුවාල කර ගත්තාම වගේ.''

අපි තිදෙනාම සිනාසුණෙමු.

''අපේ පෙනුම දැන් නම් හරිම අපූරුයි.'' මම තෙපලුවෙමි. ''දැන් අපි පහළට ගියාම...''

එක්වරම ඇසුණු කිසියම් ශබ්දයක් නිසා මම කතාව නතර කළෙමි. එය කැස්සක්ද...?

අපි තිදෙනාම ගල් ගැසුණෙමු. අනතුරුව සවන් දෙන්නට වීමු.

මට ආශ්වාස කරන ශබ්දයක් ඇසෙන්නට විය.

අනතුරුව ඇසෙන්නට වූයේ අඩි ශබ්දයකි.

''කවුද ඔතන...?'' මම ඇසුවෙමි. ''කවුරුහරි උඩ ඉන්නවද...?''

පිළිතුරක් ලැබුණේ නැත.

ආශ්වාස හඬ තවත් හොඳින් ඇසෙන්නට විය.

''කවුද ඔතන ඉන්නේ...?'' මම ඇසුවෙමි.

එවිටම විදුලි පහන නිවී ගියේය.

# 09

''කවුද... කවුද ඔතන ඉන්නේ...?'' මගේ හඬ බිඳී තිබිණ.

මගේ හදවත බෙර හඬක් මෙන් ගැහෙන්නට විය.

බැඩි සහ මාර්කස් දෙදෙනා ද සිටි තැන්වලින් සෙලවුණේවත් නැත.

අඩි ශබ්දය සමග බිමට අතුරා තිබූ ලෑලිවලින් නැගෙන

ශබ්දය ද ඇසෙන්නට විය. ආශ්වාස හඬ තවත් ළං වී තිබිණ.

"ඔයා... ඔයාට අපිව බය කරන්න බැහැ." මම කියා ගතිමි. නමුත් එය බොරුවකි.

මම අඩි කිහිපයක් ඉදිරියට ගියෙමි. ඇතැම් විට ආගන්තුකයා පහර දෙන්නට පෙර මට පඩිපෙළ අසලට යාමට හැකිවනු ඇත.

බිම වූ කිසිවක පය හැපුණු බැවින් මට කෑ ගැස්සිණ. එය මෘදු දෙයකි. පණ ඇති දෙයකි.

**"නාඃඃඃඃඃඃඃඃඃඃඃඃඃඃඃඃඃඃඃඃඃඃ"**

මගේ දණහිසක් තදින් බිම ලෑල්ලක හැපිණ. වේදනාවක් මගේ සිරුර පුරාම පැතිර ගියේය.

"මෙ... මෙතන මොකෙක් හරි සතෙක් ඉන්නවා." මම කෙඳිරුවෙමි.

"මට පේන්නේ නැහැ. හරිම කළුවරයිනෙ." මාර්කස් ද පෙරළා කෙඳිරුවේය. "ලයිට් එකට මොකද වුණේ...?"

සතා මේ වන විට ශබ්ද නගා ආශ්වාස කරමින් සිටියේය. ඌ මොකෙක් වුවද අප උගුලකට අසුවී ඇති බව දැන සිටියේය.

මම දෙපයින් නැගිට ගතිමි. මගේ දණහිස රිදුම් දෙමින් පැවතිණ.

මම නැවතත් ඉදිරියට ගියෙමි. එවර ද කිසියම් දෙයක තදින් හැපුණෙමි. එවිටම සුදු පැහැ ආලෝකයක් දැල්විණ.

එය බිම සවිකර තිබූ විදුලි පහනකි. මා එහි හැපීමත් සමග එය දැල්වී තිබිණ.

මා වහා හැරුණේ ආගන්තුක සතාට මුහුණ දීමට ය. එක්වරම මට සිනා නැගිණ.

ඒ බුසී ය. පොලීගේ ලොකු බලු පැටවා ය.

මාර්කස් සහ බ්‍රැඩ් ද සැනසුම් සුසුම් හෙලූහ. ඉන්පසු ඔවුහු බිමට නැඹුරු වූහ. අපි තිදෙනාම බුසීව සුරතල් කරන්නට වීමු.

මගේ දෙනෙත සිවිලිමේ විදුලි පහන වෙත යොමු විය. පරණ විදුලි බල්බය පිළිස්සී ගොසිනි.

Scanned by CamScanner

බුසී අපගේ අවධානය ලබා ගත හැකි වීම ගැන සතුටින් සිටියේය. නමුත් එක්වරම බල්ලාගේ හැසිරීම වෙනස් විය. කන් දෙක කෙලින් විය. පස්සට පැන්නේය. ඔහුගේ පිට මත වූ ලොම් සෘජු වන අන්දම මට දැකගත හැකි විය.

බුසී නැගිට ගත්තේය. ඔහුගේ දුඹුරු පැහැ දෑස කාමරයේ කෙළවර ඇති දෙයක් වෙත යොමුව තිබිණ.

"බලන්කෝ එයා දිහා." මාර්කස් කෙඳිරුවේය. "එයා හරියට මගේ පවුලේ අය ගාව ඉන්න දඩයම් බල්ලෙක් වගේ. එයාලා දඩයමක් හම්බුණාම හැසිරෙන්නේ මේ විදිහට."

"දඩයමක්...? මෙ අට්ටාලේ තියෙන්නේ මොන විදිහේ දඩයමක්ද...?" මම ඇසුවෙමි. මගේ සිරුර නැවතත් බියෙන් වෙව්ලන්නට විය.

බල්ලා බලා සිටියේ බිත්තියේ වූ දොරක් දෙස ය. ඔහු සෙමින් ඒ වෙත ගියේය. ඔහුගේ කන් පහත වැටිණ. ඔහු හිස පහත් කරගෙන කෙඳිරි ගාන්නට වූයේය.

"මොකක්ද ප්‍රශ්නෙ බුසී...?" මම ඇසුවෙමි. "මොනවටද ඔයා බය වුණේ...?" මම ඔහුගේ පිට අතගාන්නට උත්සහ කළ ද ඔහු පිට සොලවා මගේ අත ඉවත් කළේය. ඔහුගේ සිරුර වෙව්ලන අන්දම මට පෙනිණ. ඔහු දොර දෙසම බලාගෙන බබෙකු මෙන් කෙඳිරි ගාන්නට වූයේය.

"ඒ දොරෙන් ඇතුළේ මොනවාහරි තියෙනවා." බ්‍රැඩ් කීවේය. "එයා බය වෙන විදිහේ දෙයක්."

"මොනවා වෙන්න ඇතිද ඒ...?" මම ඇසුවෙමි. සිතට ධෛර්යය ගත් මම දිගු සුසුමක් හෙලමින් දොර වෙත ගියෙමි. ඉන්පසු හැඬලයෙන් ඇද දොර විවර කළෙමි.

## 10

මහලු මිනිසෙක් දොරෙන් පිටතට පැමිණෙන විට අප නැගූ විලාපයෙන් අට්ටාලයම පිරී ගියේය. ඔහු අඬක්

ඇටසැකිල්ලක් ද අඩක් මිනිසෙකු ද විය. ඔහුගේ මුහුණේ සමෙන් වැඩි කොටසක් විනාශ වී ගොසිනි. මුහුණේ වූ කහ පැහැ ඇටකටු පවා මට දැකිය හැකි විය.

ඔහුගේ දෑස ඇස් කුහර තුළම ගිලී ගොසිනි. නාසයක් තිබුණේ නැත. මුව විවර වී තිබිණ.

ඔහු ඇඳ සිටියේ ඉරුණු කළු පැහැ කලිසමකි. පාදවල පාවහන් තිබුණේ නැත. එක් පාදයක සම තිබිණ. අනෙක් පාදය ඇටකටු ය.

ඔහු ඇටකටු දෑත ඉදිරියට විහිදා ගෙන අප වෙත ආවේය.

පලා යන්නට කාලයක් නොවීය. ඔහු මගේ උරහිස්වලින් අල්ලා ගත්තේය.

"වෙස් මුහුණ..." ඔහුගේ කටහඬ උගුර තුළින් නැගෙන්නක් බඳු විය. "ඒක දඩයම්...."

"මට යන්න දෙන්න." මම කෑ ගැසුවෙමි. ඔහුගේ ඇටකටු ඇඟිලි අතරින් ගැලවී පසුපසට පැන ගැනීමට මට හැකි විය. මම බ්‍රැඩ් සහ මාර්කස් ට එක් වූයෙමි.

"දඩයම්... වෙස් මුහුණ." සැඟව සිටි මිනිසා ගෙරවූයේය. ඔහුගේ ගිලුණු ඇස් අපව අධ්‍යනය කරන්නට මෙන් අප වෙත යොමු විය.

"අපිට පාඩුවේ ඉන්න දෙන්න." මම විලාප නැගුවෙමි. "අනේ මෙතනින් යන්න." තවමත් යකඩ බඳු ඇඟිලිවලට අසුවුණු මගේ උරහිස රිදුම් දෙමින් තිබිණ.

ඔහු සෙමින් හිස වැනුවේය. ඔහුගේ හිසේ වූ පැලුම් මට දැකගත හැකි විය. "මහලු අවතාරය කියන දේ අහන්න... තනිවුණ මහලු අවතාරය කියන දේ අහන්න... වෙස් මුහුණ..."

"එපා...." මම කෑ ගැසුවෙමි. ඉන්පසු දොරේ හැඩලයෙන් අල්ලා දොර වසා දැමුවෙමි.

අපි තිදෙනාම ඉදිරියට පැන දොර තද කර අල්ලා ගත්තෙමු. ගැහෙන හදවතින් යුතුව මා බලා සිටියේ මහලු අවතාරය දොර තල්ලු කර දමා අප වෙත එනු ඇතැයි කියා ය.

Scanned by CamScanner

නමුත් එසේ නොවිය. දොර සෙලවුණේවත් නැත. වේගයෙන් ආශ්වාස කරන ශබ්දය පමණක් ඇසිණ.

අපි දොර අසලින් ඉවත් වූයෙමු. ''එයා ගියා...'' මම කීවේ වෙව්ලීම නවතා ගන්නට උත්සහ දරමිනි. ''ඒක... ඒක හරියට මගේ කතාවේ වගේ.'' මම මිමිණුවෙමි.

පිරිමි ළමයි දෙදෙනා මා වෙත හැරුණහ. ''මොන කතාවෙද....?'' මාර්කස් ඇසුවේය.

''අල්මාරියක ජීවත් වෙන යක්ෂ මහලු අවතාරය... ඒක කලින් දවසෙ රෑ මම මිව්ට කීව කතාවක්... ඒත් කොහොමද එහෙම වෙන්නේ...?''

මට ඒ ගැන සිතීමටවත් අවශ්‍ය නොවීය. ''අපි මෙතනින් එළියට යමු.'' මම කීවේ පඩිපෙළ වෙත දුවමිනි. මගේ දෙපා වෙව්ලමින් තිබිණ. ''අපි ගිහින් පොලීට කියමු... අපි... අපි හැමෝටම අනතුරු අඟවමු. අපි එයාලාට කියමු අට්ටාලයේ ඉන්න අවතාරය ගැන.''

මම කොළ පැහැ කැත වෙස් මුහුණ ගෙන පැළඳ ගත්තෙමි. එහි අද්භූත උණුසුමක් විය. එමෙන්ම එහි රබර් ගතියක් තිබුණේ නැත. සැබෑ මිනිස් සමක මෙන් මෘදු බවක් සහ උණුසුම් බවක් එහි විය.

''යමු.'' රතු පැහැ යක්ෂ මුහුණ පැළඳ සිටි මාර්කස් කීවේ ය. ඔහු බ්‍රැඩ්ට ද ලේ ගලන මහලු මිනිස් වෙස් මුහුණ පැළඳ ගැනීමට උපකාර කළේය. ''අපි මේ බය හිතෙන පරණ ඇඳුම් ඇඳගෙන හිටියේ නැත්තම් අට්ටාලයේ ඉන්න අවතාරය ගැන කියන කතාවෙන් එයාලාට බය හිතෙන එකක් නැහැ.''

## 11

මගේ වෙස් මුහුණ මඳ තද ගතියක් මෙන්ම අපහසුතාවයක් ද ගෙනාවේය. පඩිපෙළ බහින

Scanned by CamScanner

අතර එය ඇද සකසා ගන්නට මම උත්සහ කළෙමි. බ්‍රැඩ් සහ මාර්කස් මා පසුපසම පැමිණියහ.

මඳ දුරක් යන විට බැලුන් ක්‍රීඩාව නිමා වී ඇති බව මට දැකගත හැකි විය. පොලී සහ ඇයගේ මව එවර සූදානම්ව සිටියේ අප වයස අවුරුදු පහේදී පමණ කළ ඉටිපන්දම් ක්‍රීඩාවක් සඳහා ය.

මම පඩිපෙළේ පහතම පඩියේ නතර වූයෙමි.

''අහහ...'' ඉහළ මහලේ අවතාරයක් සිටින බව ඔවුන්ට කීමට මම උත්සහ කළෙමි. නමුත් එක්වරම මම නතර වූයෙමි. ඒ කුමක් නිසාදැයි මා දැන සිටියේ නැත. ඒ වෙනුවට මා කළේ කොළ පැහැ ඇඳුමින් වැසුණු මගේ දෑත එසවීමය. ''ඔයාලා හැමෝම විනාශයි...''

මට පිටුපසින් සිටි මාර්කස් සහ බ්‍රැඩ් ද බියජනක චිත්‍රපටයක මෙන් විලාප නැගූහ.

'''විනාශයි...'' මම හැකි තරම් උස් හඬින් කෑ ගැසුවෙමි. කැත කොළ පැහැ වෙස් මුහුණ තුළින් නැගුණු මගේ කටහඬ වෙනස් වී තිබිණ. ''ඔයාලා විනාශයි....''

පොලී තමා අත වූ සෙල්ලම් තුවක්කු බිම දැමුවේය. සියලුම ළමයි පඩිපෙළ වෙත හැරුණහ. ඒ අතරින් කිහිප දෙනෙකු විලාප නගන හඬ මට ඇසිණ.

''කවුද ඔයාලා...?'' පොලීගේ මව කෑ ගැසුවාය. ඇයගේ දෑස ද බියෙන් විසල් වී තිබිණ. ''කොහොමද ඔයාලා උඩු මහලට ගියේ...? ඔයාලා මේ සාදයට ආව අයද...?''

''අපි අට්ටාලයේ දඩයම් කරන්නේ අවුරුදු සිය ගාණක ඉඳලා...'' මාර්කස්, මහලු මිනිසාගේ හඬ අනුකරණය කළේය.

''දැන් අපි දඩයම් කරන්නේ ඔයාලාව.'' බ්‍රැඩ් කෑ ගැසීය.

''ඔයාලා මේ සාදය විනාශ කරනවා නම් මම පොලීසියට කතා කරනවා.'' පොලී ගේ මව අපට රවමින් කීවාය. ''ඔයාලා ගියේ නැත්නම්...''

''අර ඉන්නේ බ්‍රැඩ්...'' පිරිමි ළමයා කීවේය. ''මම එයාගේ කටහඬ අඳුන ගත්තා...''

Scanned by CamScanner

"ඔව්... බ්‍රැඩ් සහ මාර්කස්..." තවත් පිරිමි ළමයෙක් පැවසුවේය.

පොලීගේ අම්මා සැහසීමට පත් බැල්මක් හෙලුවේය. ඇයගේ මුවට සිනාවක් එක් විය. "එහෙනම් අර භයානක දත් තියෙන කොළ පාට වෙස් මුහුණ දාගෙන ඉන්නේ ප්‍රූ ඇන් වෙන්න ඕන....? ඔයාලා තුන්දෙනා අපිව මෝඩයෝ කළා. අපිව හොඳටම බය කරා."

ළමයි සියලු දෙනාම එක්වර කතා කරන්නට වූහ. ඔවුන්ගේ දැස් යොමුව තිබුණේ අප පැළඳ සිටි පරණ වෙස් මුහුණු සහ ඇඳුම් වෙතට ය.

"ඔයාලාගේ වෙස් මුහුණු ගලවන්න. අපිට බලන්න ඕන ඇත්තටම ඔය ඉන්නේ ඔයාලාමද කියලා." පොලි කිව්වාය.

බ්‍රැඩ් දැතින්ම ඔහුගේ වෙස් මුහුණ අල්ලා ගත්තේය. ඔහු එය අදින්නට වූයේය. "ඒයි..." ඔහු කෑ ගැසුවේය.

කාමරයම නිහඬ විය.

බ්‍රැඩ් නැවතත් වෙස් මුහුණෙන් අල්ලා ඇද්දේය. "මට... මට... ඒක ගලවගන්න බැහැ." ඔහු කීවේය.

ඔහුට ඉහළ පඩිය මත සිටි මාර්කස් ද අතු පැහැ යක්ෂ මුහුණ අල්ලා ගත්තේය. "මගේ එකත් ගැලවෙන්නේ නැහැනෙ."

වෙස් මුහුණු ගලවා ගන්නට දඟලන පිරිමි ළමුන් දෙස මම බලා සිටියෙමි.

"ඒක මගේ හමට ඇලිලා..." බ්‍රැඩ් කෑ ගැසීය. "මට උදව් කරන්න... ඒක මගේ ඇඟට ඇලිලා."

"මටත් උදව් කරන්න...." මාර්කස් වැලපුණේය. "මම මේකට හිර වෙලා... ඒක ගැලවෙන්නේ නැහැ. ඒක ගැලවෙන්නේ නැහැ."

මෙය සිදුවිය නොහැකි දෙයකි. මගේ හුස්ම හිර වූවාක් මෙන් විය.

මම හැරී බ්‍රැඩ්ගේ සේ මුහුණෙන් අල්ලා ඇද්දෙමි.

ළමයි කිහිප දෙනෙක් කෑ ගසන්නටත්, විලාප තගන්නටත්

වූහ. බොහෝ අය සිටියේ තිගැස්ම නිසා නිශ්ශබ්දව ය.

අවසානයේදී බ්‍රැඩ් සහ මාර්කස් දෙදෙනාම සිනාසෙන්නට වූහ.

"ඔයාලා අපිව විශ්වාස කළාද...?" මාර්කස් කෑ ගැසුවේය.

බ්‍රැඩ් ද තම වෙස් මුහුණ ගැලවූයේය. ඔහු එය ළමුන් වෙත දමා ගැසුවේය. "ඔයාලා ඉක්මනට මෝඩයෝ වෙනවා."

"ඒක විහිළුවක්." පොලීගේ මව දන්වා සිටියාය. "ඔයාලා හැමෝගෙම අවධානය ගත්තා."

මාර්කස් සහ බ්‍රැඩ් මා දෙස බලා සිනාසුණහ. "හරි..." මාර්කස් හඬ නැගුවේය. "අපි සාදයම තුෂ්නිම්භූත කළා."

"අපි ඔයාලාට කියන්නම් ඇත්තම ඇත්ත අවතාරයක් ගැන." බ්‍රැඩ් කීවේය.

"හරි." කිසිවෙක් පැවසීය. "අපි ඔයාලාව විස්වාස කරන්නම්."

කටහඬවල් සෙමින් මැකී ගියේය. එක්වරම මා බියපත්වන කිසිවක් සිදු විය.

ඒ මගේ වෙස් මුහුණ වෙනස් වන අන්දමක් මට දැනුණු නිසා ය.

නමුත් එය විශ්වාස කිරීමට මට අවශ්‍ය නොවිය. වෙස් මුහුණ කෙමෙන් කෙමෙන් උණුසුම් වෙමින් තිබිණ. එමෙන්ම එය මගේ මුහුණට තෙරපෙන බවක් ද මට දැනිණ.

බ්‍රැඩ් සහ මාර්කස් මේ වනවිටත් ඔවුන්ගේ වෙස් මුහුණු ගලවා තිබිණ. නමුත් මෙය නම් විහිළුවක් නොවේ. සැබවින්ම එය සිදු වූවකි.

මම මගේ දෑත ගෙල වටා යොමා වෙස් මුහුණේ කෙළවර සොයන්නට වීමි. එහි මුදුනින් අල්ලා ගලවා දැමිය නොහැකි බව මම ඒ වනවිටත් දැන සිටියෙමි.

මට වෙස් මුහුණේ කෙළවරක් සොයාගත නොහැකි විය.

වෙස් මුහුණ මගේ සමටම ඇලී තිබිණ.

මගේ දෑත උමතුවෙන් මෙන් වෙව්ලමින් තිබිණ.

Scanned by CamScanner

වෙස් මුහුණ තව තවත් මුහුණට තද වන අන්දම මට දැනිණ. එය සජීවී දෙයකි. පරණ වෙස් මුහුණට පණ ඇත.

එය සෙලවෙනු, උණුසුම් වෙනු මට දැනිණ.

''මට උදව් කරන්න...'' මගේ උගුරෙන් විලාපයක් නැගිණ.

සස තදින්ම වෙස් මුහුණ ඇද්දෙමි. නමුත් තව දුරටත් එය වෙස් මුහුණක් නොවීය. එය මගේ මුහුණටම ඇලී තිබිණ. එය මගේම කොටසකි.

''මට උදව් කරන්න... මට ඇත්තටම උදව් ඕන... මේ වෙස් මුහුණ... මගේ මූණටම ඇලිලා.''

බ්‍රැඩ් සහ මාර්කස් සිනාසෙන්නට වූහ.

අනිත් ළමයි ද සිනාසුණහ. නැමෝම මා දෙස බලා සිටිමෙ- ය් සිනාසෙමින් විහිළු කරමිනි.

''නැහැ... ඇත්තමයි.'' මම වැලපුණෙමි. ''මට ඇත්තටම උදව් ඕන. මේ පරණ වෙස් මුහුණ... ඒකට... ඒකට... පණ තියෙනවා.''

''අනේ ලූ ඈන්...'' පොලිගේ මව කීවේ සිනාසෙමින් හිස සොලවමිනි. ''පිරිමි ළමයි ඒ විහිළුව කරානෙ... ඔයාත් ඕක ගලවලා තියලා අනිත් අයට එකතු වෙන්න.''

''මට බැහැ.'' මම කෑ ගැසුවෙමි. මගේ කටහඬ වෙස් මුහුණ තුළ සිහින්ව නැගිණ. එය මගේ කටහඬ නොවිය. මගේ කටහඬ කෙසේ හෝ අප්‍රසන්න, අවතාර හඬක් බවට පත්ව තිබිණ.

''මට ඒක ගලවගන්න බැහැ.'' මම නැවතත් වැලපුනෙමි. ''අනේ... මේක විහිළුවක් නෙවෙයි. කවුරුහරි මට උදව් කරන්න.''

මම දැතින්ම එය අල්ලා ගලවන්නට හැදුවෙමි.

ළමයි සිනාසුණහ. මාර්කස් සහ බ්‍රෙඩ් ද සිනාසුණහ.

එක්වරම මගේ බිය පහව ගියේය. තවදුරටත් මම බිය නොවූයෙමි.

ඒ වෙනුවට මට ඇති වූයේ කෝපයකි. කෙමෙන් කෙමෙන් එම කෝපය මා වෙලාගත්තේය.

''දැන් මම මොකද කරන්නේ...? කවදාවත් මට මෙහෙම

දෙයක් දැනිලා නැහැ.'' මම සිතුවෙමි.

මගේ දෑත මිට මෙලවිණ. මගේ ආශ්වාසය වේගවත් විය. මගේ සිරුරේ සෑම මස් පිඬුවක්ම දැඩි විය.

කෝපයෙන් යුතුවම මම වෙස් මුහුණ අල්ලා ඇද්දෙමි. එය ඉරන්නට උත්සහ කළෙමි. නියපොතුවලින් සීරුවෙමි. ඇස් කුහර තුළට ඇන්නෙමි.

නමුත් එහි ඇස් කුහර නොවීය. එහි වෙස් මුහුණක් නොවීය. දැන් එය මගේ මුහුණ ය. තියුණු දත් ඇති කොළ පැහැති අප්‍රසන්න පෙනුමැති මුහුණ මගේම මුහුණ ය.

# 12

මට තවදුරටත් මෙය දරාගත නොහැකි විය. එය මා තුළින්ම නැගෙන කෝපයක් විය. හරියටම මට කෝපය වමනය කිරීමට අවශ්‍ය වූවාක් වැනි විය.

එම කෝපයට මම බියපත් වූයෙමි. නමුත් මට එය නවතාගත නොහැකි විය. මට මාවම නැති වී ඇත. ලූ ඇන් ව නැති වී ඇත. කෝපාන්විත මුහුද අභියස මා නොමැත.

මම පොලීගේ විසිත්ත කාමරයෙහි සිටි ළමුන් දෙස දෑස ඔසවා බැලුවෙමි. සියලු දෙනාම සිටියේ සිනාසෙමිනි. මෝඩයෝ... මෝඩ විහිළු... ඔවුන් සිතා සිටින්නේ මා කිසියම් සංදර්ශනයක් ඉදිරිපත් කරන බව ය.

*"එය රඟපෑමක් නොවන බව මම පෙන්වන්නම්."*

මම පහර දෙන්නට වූයෙමි. මම පඩිපෙළේ අත් වැටට ඉහළින් මීයක් මෙන් සැරසුණු පිරිමි ළමයෙකු වෙත පැන්නෙමි. අප දෙදෙනාම බිම පෙරළී ගියේය. මම ඔහුගේ ගෙල මිරිකුවෙමි.

ඉන්පසු මම දෙපයින් නැගිට්ටෙමි. අනතුරුව මා දිව ගියේ ගැහැනු ළමුන් දෙදෙනෙකු වෙත ය. ඔවුහු පසුපසට පැන ගත්

අතර ඒ වේගයට බිත්තියේ හැපුණහ.

මම හිස පසුපසට කර බිහිසුණු ලෙස ගෙරවූයෙමි.

ළමුන් තවදුරටත් සිනාසුණේ නැත. ඔවුහු විලාප නගන්නට වූහ. ඔවුන් පසුපසට වූයේ බියෙනි.

මම උඩ පැන සිවිලිමේ එල්ලා තිබූ සැරසිලි කඩා දැමුවෙමි. මේසයට පැන ලාම්පුවක් ගෙන පොළොවේ ගැසුවෙමි.

"නවත්තන්න... නවත්තන්න... දූ ඇන්... නවත්තන්න..." මාර්ටින් තෝනාගේ කෑ ගැසීම මට ඇසිණ.

මම කෑම මේසය මත වූ වට්ටක්කා පුඩිමක් ගෙන ඉන් ඇයගේ මුහුණට දමා ගැසුවෙමි. ඉන්පසු කෑම එහා මෙහා විසි කර දැමුවෙමි.

සියලුම කෑම බීම බිමට විසි විය. බඳුනක් බිම වැටී කැබලි සිය ගණනකට කැඩී ගියේ තැඹිලි පැහැ බීම බුමුතුරුණ මත විසි කරමිනි. ළමයි බියෙන් විලාප නැගූහ. ගැහැනු ළමුන් දෙදෙනෙකු ඉදිරිපස දොර වෙත දිව යන අන්දම මට පෙනිණ.

පොලී දුරකතනය වෙත ගියාය. ඇය අමතන්නේ පොලිසියට ද...?

මම එය ගණනකට නොගනිමි. මට මාවම පාලනය කර ගත නොහැක. මගේ කෝපය මට පාලනය නොවේ.

මම බිත්තියේ එල්ලා තිබූ පින්තූරයක් ගෙන එහි වීදුරු රාමුව බිඳී යන ලෙස බිම ගැසුවෙමි. ළමයි කෑ ගැසූහ. මට එය විනෝදයක් විය.

පොලීගේ මව සිටියේ මුහුණ පුරා තැවරුණු ආහාර පිස දමමිනි. මම මල් බඳුනකින් බිත්තියට දමා ගැසුවෙමි. ඇය මා අල්ලා ගන්නට උත්සහ කළාය.

මම කෑ ගසමින් ඇය ගෙන් මිදුණෙමි. ඉන්පසු මම දිගු පිම්මක් පැන විසිත්ත කාමරයේ ජනේලයෙන් පිටතට පැන ගතිමි.

වීදුරු බිඳී යන හඬක් නැගිණ.

මා වැටුණේ දණිනි. ඉන්පසු මම වහා දෙපයින් නැගිට ගත්තෙමි. අනතුරුව මම කැලෑ සතෙකු මෙන් හඬ නගමින් පාර

# 13

සීතල රාත්‍රී සුළඟ රත් වී තිබූ මගේ මුහුණේ දැවටිණ. මා සිටියේ තදින් හති දමමිනි. මගේ පපුව වේගයෙන් උස් පහත් වෙමින් තිබිණ.

මම පාර දිගේ දිව ගියෙමි. පොලීලාගේ පාරේ කෙළවර කණුවක් මත රැඳවූ නිවසේ තැපැල් පෙට්ටිය විය. මම එය කණුවෙන් ගලවා අතට ගෙන නිවස දෙසට දමා ගැසුවෙමි.

ඉන්පසු මම ප්‍රධාන පාරේ පදික වේදිකාව දිගේ දිව ගියෙමි. මගේ පාවහන්වල ශබ්දය පමණක් මට ඇසිණ. මා දිවීම නතර කළ යුතු බව මම දැන සිටියෙමි. මම කෝපය මැඩ පවත්වා ගැනීමට සටන් කළ යුතුය.

නමුත් කෝපය වඩා බලවත් විය. එය සටන් කර පැරදවිය නොහැකි තරම් බලවත් විය.

මට දැඩි කෝපයක් දැනෙමින් තිබිණ.

මට වීදියේ අලංකාරව සරසන ලද නිවසක් අසල සිටින කුඩා ළමුන් තිදෙනෙකු දැකිය හැකි විය. ඔවුන් නිවස අසලින් ඉවතට ගමන් කරන තුරු මම බලා සිටියෙමි. අනතුරුව මම ගොරවමින් ඔවුන් හඹා ගියෙමි.

ඔවුන් අත වූ රසකැවිලි මලු උදුරා ගත් මම ඒවා කැබලිවලට කඩා දැමුවෙමි. රසකැවිලි බිම විසිරිණ. ළමයි දෙදෙනෙක් අඬන්නට පටන් ගත්හ.

මට සිනා නැගිණ.

ඉන්පසු මම මුල්ලකට දිව ගොස් බිය වද්දන්නට තවත් අයෙකු පැමිණෙනතුරු බලා සිටියෙමි.

ඊළඟට කවුද...? ඊළඟට කවුද...?

එවිටම මට මා පිටුපසින් ශබ්දයක් ඇසිණ. එය පදික වේදිකාවෙන් නැගුණු අඩි ශබ්දයකි. මට කෑ ගැසීමක්ද ඇසිණ.

Scanned by CamScanner

මා ලුහුබඳින්නේ කවුරුන්ද...?

මම හැරී බැලුවෙමි. මට දක්නට ලැබුණේ මාර්කස් සහ බ්‍රැඩ් ය.

"ලූ ඇන්... ඉන්න... ලූ ඇන්..." මාර්කස් හති දමමින් කීවේය.

"නවතින්න... අපිට ඕනේ ඔයාට උදව් කරන්න." බ්‍රැඩ් ද කෑ ගැසුවේය.

"මට උදව් කරන්න...?" මම මගේ නොවන කටහඬින් ඇසුවෙමි. "ඔයාලාට ඕන මට උදව් කරන්න...? මෙන්න ඔයාලාට උදව්වක්..."

මම බ්‍රැඩ්ව අල්ලාගෙන ඔහුගේ උරහිස හපා කෑවෙමි.

ඔහු වේදනාවටත් වඩා පුදුමයෙන් විලාප නැගුවේය.

ඉන්පසු මම සිනාසෙමින් ඔහුට යන්නට ඉඩ දුන්නෙමි.

"ලූ ඇන්... නවත්තන්න." මාර්කස් කිවේ මාව පිටුපස සිට අල්ලා ගනිමිනි. "ඔයාට උදව් ඕන."

"ඔයාලාට පුළුවන් මට උදව් කරන්න මම ඔයාලාව ඉවරයක් කළාම." මම ගෙරවූයෙමි. මම දැතින්ම ඔවුන්ගේ දෑස් පහුරු ගාන්නට සැරසුණෙමි.

මා මේ සිදු කරන්නේ කුමක්ද...?

මේ මගේ මිතුරන් ය.

"ලූ ඇන්... අපිට ඔයාට උදව් කරන්න ඉඩ දෙන්න." මාර්කස් පැවසුවේය.

බ්‍රැඩ් මා හපා කෑ උරහිස පිරිමදිමින් සිටියේය. "අපි ඔයාව ගෙදර ගෙනියන්නම්..." ඔහු කීවේය. "ඔයාගේ දෙමව්පියෝ එයාව දොස්තර කෙනෙක් ළඟට එක්ක යයි."

මම හිස පසුපසට කර පිළිතුරක් ලෙස ගෙරවූයෙමි.

එහි ශබ්දයට ඔවුහු බිය වූහ. දෙදෙනාම අඩියක් පසුපසට ගියහ.

"ඒ වෙස් මුහුණ නිසාද...?" බ්‍රැඩ් ඇසුවේය. "වෙස් මුහුණ නේද ඔයා ලවා මේ දේවල් කරවන්නේ...?"

Scanned by CamScanner

"අපි ඔයාට උදව් කරන්නම් ඒක ගලවන්න..." මාර්කස් කීවේය. ඔහුගේ කටහඬ වෙව්ලමින් තිබිණ.

"ඒක ගැලවෙන්නේ නැහැ." මම ගෙරවුයෙමි. "දැන් ඒක තමා මගේ මූණ." මම දෑත ඔසවාගෙන ඔවුන් වෙත ගියෙමි. "ඇයි මොකක්ද ප්‍රශ්නේ...? ඒක ලස්සනට පේන්නේ නැද්ද ඔයාලාට...?"

ඔවුහු එකිනෙකා දෙස බැලුවා මිස පිළිතුරක් නොදුන්හ. ඔවුන් බියපත්ව සිටින බව මට දක්නට ලැබිණ.

මම ආපසු ඔවුන්ව සැපිය යුතුද...?

නැත. මෙය උදාසීන දෙයකි. මා ඊට වඩා උද්යෝගිමත් යමක් කළ යුතුය. අනිත් අතට මෙය සියලු ශාන්තුවරයින්ගේ සැදෑව යි. මා තව තවත් කෝප වී විශාල හානියක් සිදු කළ යුතුය.

"ලූ ඇන්... අනේ..." මාර්කස් කීවේය. "අපිට ඔයාව ගෙදර ගෙනියන්න දෙන්න."

මම ඔහු දිගු කළ අතට පහරක් ගසා දුවන්නට වීමි.

බොහෝ දුරක් දිව ගිය මම ආපසු හැරී බැලුවෙමි. ඔවුන් මා පසුපස එන්නේද...? නැත.

ඔවුන් පැරදී ඇත.

"හොඳ යාළුවෝ... මට තිබුණේ දෙන්නාවම හපන්න."

මම වංගුවකින් හැරී ඉදිරියටම දුවන්නට වීමි. මගේ පපුව දැවෙන්නාක් සේ මට දැනිණ. නමුත් මට දිවීම නවතා ගත නොහැකි විය.

මම ගොරවමින් ඉදිරියටම දිව ගියෙමි.

නිවාස අවසන් වූ පසු වීදියේ වූයේ කඩ පේළියකි. ඒ සියල්ලම අන්ධකාරයෙන් වැසී තිබුණේ ඒ වනවිටත් කඩ වසා දමා තිබූ නිසා ය.

මට වෙස් මුහුණු වෙළඳසැලක් දක්නට ලැබිණ.

එහි ඉදිරිපස ජනේලය ආලෝකමත්ව තිබූ අතර ජනේලය අසල රාක්කයක කැත වෙස් මුහුණු පෙළක් ඇති අන්දම මට දැකිය හැකි විය.

එය මාර්කස්ගේ පියාගේ වෙළඳසැල ය. එනම් බ්‍රිග්ට්

Scanned by CamScanner

මහතාගේ වෙළඳසැල ය.

මම ජනේලයෙන් ඇතුළ බැලුවෙමි.

ව්‍රිග්ට් මහතා පරණ වෙස් මුහුණු පිළිබඳව අධ්‍යනය කරන්නෙකි. ඒ සම්බන්ධයෙන් ඔහුට හොඳ දැනුමක් ඇත.

ඇතැම් විට ඔහු මට උදව්වක් වෙනු ඇත. මෙම වෙස් මුහුණ ගැලවීමට ඔහුට හැකි වනු ඇත.

මම දොරේ හැඩලය කරකවා දොර විවර කළෙමි. අනතුරුව පහත් හඬින් ගොරවමින් වෙළඳසැලට ඇතුළු වූයෙමි.

# 14

එය ලෝහ රඳවනවල ඇඳුම් එල්ලූ කුඩා වෙළඳසැලකි. බිත්ති තුනකම බිම සිටි සිවිලිම දක්වාම වෙස් මුහුණු රඳවා තිබිණ. සත්ත්ව වෙස් මුහුණු, අවතාර වෙස් මුහුණු, විකට වෙස් මුහුණු මෙන්ම බය හිතෙන වෙස් මුහුණු ද දුසිම් ගාණක් එහි විය. වීදුරු පෙට්ටියක් තුළ විවිධ වර්ගයේ දිලිසෙන පළඳනා, බඳ පටි ආදිය රඳවා තිබිණ.

වෙළඳ කුටිය තුළ වූයේ මඳ ආලෝකයකි. මලානික ආලෝකය නිසාම හිස් දැස් සහිත වෙස් මුහුණු මත පතිතව තිබුණේ බියකරු සෙවනැලි ය. ව්‍රිග්ට් මහතා පෙනෙන්නට නොවීය.

මම ගෙරවූයෙමි. "කවුරුහරි ඉන්නවද...?"

කෙළවරක වූ ඇඳුම් සෙලවෙන්නට වූයේ ඒවාට පණ ඇති විටක මෙනි. වෙස් මුහුණු මා දෙස බලා සිනාසිණ.

"කවුරුහරි ඉන්නවද...? ව්‍රිග්ට් මහත්තයා...?"

වෙළඳසැලේ පසුපස වූ රතු සහ කළු පැහැ ඇඳුම් ගොඩකට පිටුපස සිට ඔහු පැමිණියේය. ඔහුගේ එක් අතක වෙස් මුහුණක් ද අනිත් අතේ කොකාකෝලා කෑනයක් ද විය.

මා දුටු වහා ඔහු අත වූ කෑනය අත හැරිණ. එය බිම පතිත

Scanned by CamScanner

වී එහි වූ කෝලා ඔහුගේ පාවහන් මත හැලිණ.

බ්‍රිග්ට් මහතා උස මහත මිනිසෙකි. ඔහුගේ නාසය කෙළවර පැළඳ සිටි උපැස් යුවළ ඇදී තිබිණ. ඔහු අඳුරු පැහැ ඩෙනිම කලිසමක් ද දුඹුරු පැහැති පැල්ලම් වැටුණු කබායකට යටින් සුදු පැහැ ස්වීටරයක් ද ඇඳ සිටියේය.

ඔහු නැමී කෝලා කෑනය අතට ගත්තේය. අනතුරුව මා දෙස බැලුවේය. "හලෝ...?"

"බ්‍රිග්ට් මහත්තයා... මේ මම ලුසී ඈන්..." මම කීවෙමි. "මට උදව් කරන්න... මට ඔයාගේ උදව් ඕන."

"කවුද ඔයා...? මොකක්ද ඔයා කිව්වේ...?"

මට ඔහු පසෙක වූ කැඩපතකින් මගේ මුහුණ දැකිය හැකි විය. මගේ මුහුණ කොළ පැහිති ය. එහි කටුස්සෙකුගේ සමක මෙන් ඉරි තැලී තිබිණ. මගේ දෑස විශාල රුධිරය පිරුණු රත් පැහැ දෑසක් විය. මගේ කටේ වූ දත් දෙපළ අතරින් කෙළ ගලා චිත් නිකට දිගේ ගලා බසිමින් තිබිණ.

"මට උදව් කරන්න... අනේ... ඔයාට පුළුවන්ද මට උදව් කරන්න...?"

ඔහු වදනක්වත් පැවසුවේ නැත. ඔහු මා දෙස විමසිලිමත්ව බැලුවේය. මගේ මුහුණ හොඳින් අධ්‍යනය කළේය.

බොහෝ වෙලාවකට පසු ඔහු අතක් දිගු කළේය. "යනවා යන්න." ඔහු කීවේය. "යනවා මෙතනින්... මගේ කඩෙන් දැන්ම යනවා... ඔයා යක්ෂයෙක්... යක්ෂයෙක්..."

"නැහැ... බ්‍රිග්ට් මහත්තයා..." මම මගේ අප්‍රසන්න හඬින් අයදින්නට වීමි. "මේ මම... ලූ ඈන්..."

"යනවා..." ඔහු කෑ ගැසුවේය. අනතුරුව ඔහු මා දෙසට අඩියක් තැබුවේය. "යනවා... මගේ කඩෙන් එළියට යනවා."

"ඒත් මට උදව් ඕන." මම ගෙරවූයෙමි.

මගේ කෝපය නැගෙන්නට විය. මම බිත්තියේ එල්ලා තිබූ වෙස් මුහුණු ගලවා බිමට දමන්නට වීමි. ඇඳුම් රඳවන දෙකක්ම පෙරළා දැමුවෙමි. වීදුරු පෙට්ටියේ වීදුරුව අතින් ගසා

Scanned by CamScanner

බිඳ දැමුවෙමි.

ප්‍රිග්ට් මහතා මා කරා එන්නට විය. ඔහු පැමිණියේ මා අල්ලා ගැනීමට ය. "යනවා... යනවා යන්න."

මට කළ හැකි යමක් නොවීය. මම ඇඳුම්වලට උඩින් පැන වීදියට පැන ගතිමි.

ප්‍රිග්ට් මහතා දොරකඩ ආවරණය වන සේ සිට ගත්තේය. ඔහු මිට මොලවා ගත් අත සෙලවූයේය. "යනවා යන්න... යනවා යන්න... මට ඕන නැහැ යක්ෂයෙක්."

"මේ මම..." මම විලාප නැගුවෙමි. "ලූ ඇන්... අනේ... මම කියන දේ අහන්න. ඔයාගේ පුතා මාර්කස් මගේ හොඳ යාළුවෙක්. ඔයා මාව දන්නවා. මම ලූ ඇන්... ඇත්තමයි. ඔයාට බැරිද මට මේ වෙස් මුහුණ ගලවා ගන්න උදව් කරන්න...?"

මට ඔහුගේ මුහුණ පෙනුණේ නැත. ඔහුගේ විශාල සිරුරට ආලෝකය ආවරණය වී තිබිණ. "සමහරවිට ඔයා ලූ ඇන්ව පාවිච්චි කරනවා ඇති." ඔහු කෑ ගැසුවේය. "ඒත් දැන් ඔයා තමා දඩයම් වෙස් මුහුණ. මම දන්නවා ඔයා ගේන යක්ෂ වඩ ගැන."

"නැහැ... මේ මම.." මම කීවෙමි. "මම තවම ලූ ඇන්... අනේ මට උදව් කරන්න... කොහොමද... කොහොමද මම මේ වෙස් මුහුණ ගලවා ගන්නේ...?"

"ඔයාට ඇත්තටම ඕන දඩයම් වෙස් මුහුණ ගලවා ගන්න විදිහක් දැනගන්නද...? නැත්නම් මේක විහිළුවක්ද...?"

"නැහැ... මේක විහිළුවක් නෙවෙයි." මම තෙපලුවෙමි. "අනේ මට කියන්න." මම තිකට දිගේ ගලා බසින කෙළ පිස දමමින් කීවෙමි. "මොනවද ඔයා මේ වෙස් මුහුණ ගැන දන්නේ...?" මම ඇසුවෙමි. "මට කියන්න ඒක ගලවන විදිහ."

ඔහු දොර ආවරණය වන සේ දෑත බැඳගෙන සිටගෙන බොහෝ වෙලාවක් නිහඬව සිටියේය.

"දඩයම් වෙස් මුහුණ ගලවලා අයින් කරන්න බැහැ." ඔහු තෙපලුවේය.

Scanned by CamScanner

# 15

එය ගලවා ගත නොහැකිද...?

මම ඔහු දෙස දෑස් විසල් කර මොහොතක් බලා සිටියෙමි. ඉන්පසු මම හිසට ඉහළින් දෑත ඔසවා වැලපුණෙමි.

ඔහු ආපසු වෙළඳසැල දෙසට හැරුණේය.

''මම දඩයම් වෙස් මුහුණ ගැන ගොඩක් කියවලා තියෙනවා. ඒක අයිති වෙලා තිබුණේ විලියම් කියන වෙළඳ සැල් හිමිකරුට. දවසක් එයා ඒක දාගත්තට පස්සේ එයයි වෙස් මුහුණයි අතුරුදහන් වෙලා තියෙනවා. කවුරුවත් ආයෙමත් එයාලාව දැකලා නැහැ. පුරාවෘතයේ හැටියට වෙස් මුහුණ ගලවන්න බැහැ. ඒක ගලවන්න පුළුවන් එකම එක විදිහකින් විතරයි...''

''මොකක්ද ඒ...?'' මම ඇසුවෙමි.

''හිතාගන්න බැරි විදිහේ කරුණාවන්තකමකින් ඒක ගලවන්න පුළුවන්.'' ඔහු කීවේය. ''මම දන්නේ එච්චරයි. දැන් යන්න. යක්ෂයාත් එක්ක යන්න.'' ඔහු වෙළඳසැලේ දොර වසා දැමුවේය.

**''කරුණාව...? ඔයාටයි ඕන කරුණාව.''** මම කෑ ගැසුවෙමි. **''මම පෙන්වන්නම් ඔයාට කරුණාව.''**

මම පාරේ තිබූ ලොකු ගලක් අහුලාගෙන ඉන් ඔහුගේ වෙළඳසැලේ දොර වෙත දමා ගැසුවෙමි. ගල හඬක් නගමින් දොරේ වැදී බිම වැටිණ.

ඉන්පසු මම පාර දෙපස වූ වෙළඳසැල්වල ජනෙල් වීදුරු බිඳිමින්, උමතු හයිනාවෙකු මෙන් සිනාසෙමින්, වේගයෙන් දුවමින් ගමන් කරන්නට වීමි.

මම දඩයම් වෙස් මුහුණේ සිරකාරියක වී සිටියෙමි. එහි අරක් ගත් යක්ෂයාගේ සිරකාරියක වී සිටියෙමි.

නමුත් කෙතරම් කෝපයක් නැගුණද මා තවමත් ලූ ඇන් විය. බියපත් ලූ ඇන් විය.

Scanned by CamScanner

ජනේලයට ද ගලක් ගසා එහි වීදුරුව බිඳ දැමුවෙමි. ඈත කොතනකින් හෝ මට සයිරන් නළා හඬක් ඇසෙන්නට විය.

මම පාර පැන කුඩා උයනකට පිවිසියෙමි. ගස් අතරින් දුවන ගමන් මම ලූ ඈත් මෙන් සිතන්නට වූයෙමි.

කරුණාවන්ත ලෙස හැසිරිය යුතුය.

මා කෙසේ හෝ වෙස් මුහුණේ බලය පරදවන්නට කරුණාවන්ත ලෙස හැසිරිය යුතු වේ.

මට නිදහස් විය හැකි එකම මඟ එය ය.

ඒ සිතුවිලි පරදමින් වෙස් මුහුණේ කෝපය නැගෙන්නට විය. මට ඒවා පාලනය කර ගත නොහැක. එවිටම මට පාර අද්දර වාඩි වී සිටින කුඩා ගැහැනු ළමයෙකු දැකගත හැකි විය. බුබුළු දමමින් නැගෙන කෝපය ඇති විට ඇය දැකීම ඇයට ලොකු ප්‍රශ්නයක් ඇති වීමට හේතුවක් බව මට දැනිණ.

ඇය ඇඳ සිටියේ කුමරියක මෙනි. ඇය දැතින්ම හිස අල්ලාගෙන සිටියාය. වීදි ලාම්පුවේ ආලෝකයෙන් ඇයගේ හිස කෙස් සෙලවෙන අන්දම දුටු මට ඇය අඬන බව පැහැදිලි විය.

මම ඇය බිය කරන්නට ගොරවන්නට සූදානම් වීමි. නමුත් කෙසේ හෝ මට එය නවතා ගත හැකි විය. මම ඇය අසල වාඩි වූයෙමි.

ඇය මා දකින්නට මඳ වෙලාවක් ගත විය. අවසානයේදී ඇය හිස ඔසවා මා දෙස බලා කඳුළු පිසදා ගත්තාය.

''මොකක්ද ප්‍රශ්නෙ...?'' මම කෙඳිරුවෙමි.

''මං අතරමංවෙලා.'' ඇය පිළිතුරු දුන්නේ වෙව්ලන හඬිනි.

''අතරමංවෙලා...?''

කඳුළු පිස දමමින්ම ඇය හිස වැනුවාය. ඇයගේ දෑස තවමත් තිබුණේ බිමට බරව ය. ඒ නිසා ඇයට මගේ වෙස් මුහුණ දැකගත නොහැකි විය.

''මම ළමයි ටිකක් එක්ක මේ පැත්තට ආවේ. ඒත් දැන්

මට එයාලාව හොයා ගන්න බැහැ. මම දන්නෙ නැහැ එයාලා කොහෙටද ගියේ කියලා."

"ඔයා ගෙදර යන විදිහ දන්නෙත් නැද්ද...?"

"නැහැ... මම අතරමං වෙලා ඉන්නේ..." ඇයගේ උරහිස් ගැහෙන්නට විය. ඇයගේ කළු පැහැ ලොකු දෑස්වලින් නැවතත් කඳුළු වැගිරෙන්නට විය.

"දුක් වෙන්න එපා. මම ඔයාට උදව් කරන්නම්." මම මෘදු ලෙස පැවසුවෙමි. "මම ඔයාව ගෙදර එක්ක යන්නම්."

ඇයගේ දෑස විසල් විය. "ඔයා...?"

"ඔව්."

එය කරුණාවන්ත රඟපෑමක් විය.

කරුණාවන්ත රඟපෑමකින් මෙම යක්ෂ වෙස් මුහුණ ගලවා ගත හැකි වනු ඇත.

"ස්තූතියි." ඇය සිහින් හඬින් තෙපලුවාය. ඉන්පසු ඇය මා දෙස බැලුවාය.

ඒ ඇය මා දෙස බැලූ පළමු වතාව ය.

ඇයගේ සිනහව වියැකී ගියේය. ඇයගේ මුව වෙව්ලන්නට විය. ඇය බියෙන් විලාප නැගුවාය.

"ඔයා හරිම කැතයි." ඇය කීවාය. වහා නැගිට ගත් ඇය දුවන්නට සැරසුණාය. නමුත් ඇය වේගවත් මදි ය.

මම ඇයගේ කුඩා උරහිස්වලින් අල්ලා ගතිමි. "කොහෙද ඔයා යන්නේ පුංචි කෙල්ල...?" මම ගෙරවූයෙමි. "මම හදන්නේ ඔයාට උදව් කරන්න... ඔයා ගාව තියෙන පැණි රස සේරම කන්න මම උදව් කරන්නම්."

මම ඇයගේ අතේ වූ රසකැවිලි මල්ල උදුරා ගත්තෙමි.

ඉන්පසු එය කැබලිවලට කඩා දැමුවෙමි.

රසකැවිලි හැමතැනම විසිරිණ. මම බිම වැටෙන රස කැවිලි අල්ලා ගත්තෙමි. ඒවා කටට දමා මගේ විශාල උල් දත්වලින් හපා ගිල දැමුවෙමි.

කුඩා දැරිය උස් හඬින් ඉකි බිඳින්නට වූවාය. ඇයගේ

Scanned by CamScanner

මුහුණ බියෙන් පිරී තිබිණ.

එය දුටු මට සිනා පහළ විය.

ඉන්පසු මම සිනාසෙමින් වීදිය දිගේ පහළට දිව යන්නට වීමි. මගේ සිනහව සතෙකු නගන සිනහවක් මෙන් විය. මගේ කැත මුහුණේ සීතල සුළඟ දැවටිණ.

මම දිවීම වේගවත් කළෙමි. කැලෑ සතෙකු මෙන් උස, නිහඬ ගස් සහ අඳුරු නිවාස පසු කරමින් දිවවෙමි.

ඇයගේ දුක්බර හැඩීම තවදුරටත් නොඇසෙන තුරුම දිවවෙමි.

## 16

මා නතර වූයේ මට ආශ්වාස කිරීම අපහසු වූ විට ය. මා සිටින්නේ කොහේද...? මා සිටි පෙදෙසේ වූ නිවාස මට හඳුනාගත නොහැකි විය. සඳ තවමත් තිබුණේ වලාකුළු පසුපස සැඟව ය. අන්ධකාරය වීදිය පුරා පැතිර තිබිණ.

මා කෝපය පාලනය කර ගත යුතුය.

මා සම්පූර්ණයෙන්ම අතුරුදහන් වී යක්ෂයා ඉස්මතු වෙන්නට පෙර මා කරුණාවන්ත ලෙස රඟ පෑ යුතුම ය.

ඉදිරියේ තැනක කාරයක දොරක් වසන හඬ මට ඇසිණ. මම හැරී බැලුවෙමි. හැරී බැලූ මට දක්නට ලැබුණේ කුඩා කාරයක් අසල සිටින තරුණයෙකි. ඔහු හිස සොලවමින් කිසිවක් මුමුණමින් සිටියේය.

මම ඔහු දෙසට අඩි කිහිපයක් ගියෙමි. මා ළං වන විට ඔහු හුළං බැස තිබූ ටයරයක් වෙත නෙත් යොමා සිටින අන්දම මට පෙනිණ. ඔහු කෝපයෙන් කාරයට මිට මොලවා ගත් අතකින් පහරක් ගැසුවේය.

Scanned by CamScanner

මම ඔහුට සමීප වූයෙමි. මා දුටු ඔහු පුදුම විය. මගේ මුහුණට ඔහු ද බිය විය.

"ඒක නම් ඇත්තටම බය හිතෙන වෙස් මුහුණක්." ඔහු පැවසුවේය. "ඔයා මාව බය කළා."

"සුබ සියලු ශාන්තුවරයින්ගේ දිනයක්." මම ගෙරවූයෙමි.

"මට නම් සුබ නැහැ." ඔහු කීවේය. "මම ගෙදරින් මයිල ගාණක් ඈත ඉන්නේ. මේ බලන්නකෝ වෙලා තියෙන දේ." ඔහු පැතලිව තිබූ ටයරය පෙන්වීය.

මම හිස වැනුවෙමි.

ඔහු ජංගම දුරකතනයක් මට පෙන්නුවේය. "මගේ දුරකතනයේ බැටරියත් බැහැලා. ටයරය මාරු කර ගන්න කාටවත් එන්න කියන්න විදිහක් නැහැ." ඔහු මා සමග කීවේය. "ඔයා ගාව දුරකතනයක් තියෙනවා නම් මට දෙනවද...?"

මම උරහිස් හැකිලුවෙමි. "නැහැ."

"ඒයි... ඔයාට වයස කීයද...? ඔයා දැනටමත් ගෙදර යන්න ප්‍රමාදයි නේද...?"

මේ මිනිහා මගෙන් මේ තරම් ප්‍රශ්න අහන්නේ ඇයි...? මා තුළ කෝපයක් නැගෙන්නට විය.

සන්සුන් වෙන්න. කෝපය පාලනය කරන්න.

"මම සාදයකට ගියා." මම කටහඬ පාලනය කරගනිමින් පැවසුවෙමි. "මෙතන ඉඳන් ටික දුරක තියෙන ගෙදරක. මගේ දෙමව්පියෝ දන්නවා මම ඉන්න තැන."

ඔහු මොහොතක් කල්පනා කළේය. "ඔයාට පුළුවන්ද මට ලොකු උදව්වක් කරන්න...?"

"ඔයා කියන්නේ මට කරුණාවන්ත විදිහට රඟපාන්න කියලද...?" මම ඇසුවෙමි.

එය ඇසූ ඔහුට සිනා නැගිණ. "ඔව්. ඒ වගේ දෙයක් තමයි. ඔයාට පුළුවන්ද මෙතනට වෙලා මගේ කාර් එක බලා ගන්න...? කාර් එක ඇතුළේ පෙට්ටියක වටිනා දේවල් ටිකක් තියෙනවා."

"මෙතන ඉඳන්ද...?" මම ඇසුවෙමි.

Scanned by CamScanner

"විනාඩියක් දෙකක් යයි. මම අර ගෙවල්වලට දුවලා ගිහින් බලන්නම් කාගෙහරි දුරකතනයක් පාවිච්චි කරන්න පුළුවන්ද කියලා. මම කාර් එක අගුලු දාලා නැහැ. අගුලු කැඩිලා තියෙන්නේ."

"ප්‍රශ්නයක් නැහැ." මම කීවෙමි. "මම මෙතන ඉන්නම්. ඒක කරුණාවන්ත රඟපෑමක් හරිද...?"

ඔහු හිස වැනුවේය. "ඔව්. ඔයාට ස්තුතියි. මේ වෙස් මුහුණ ඔයාගේ මුහුණට තද වැඩි නැද්ද...?"

"ඇත්තටම." මම පැවසුවෙමි.

"හරි... ඉක්මනින් එන්නම්." ඔහු දුවන්නට වූයේය. මට ඈතින් පෙනෙන නිවසක ආලෝකයක් දැකිය හැකි විය.

මම කාරයට පිටදී දෑස වසා ගත්තෙමි.

"මම කරුණාවන්ත වෙන්නෙමි."

වෙස් මුහුණේ යක්ෂ බලය සමග මට සටන් කළ හැක්කේ එලෙස පමණි. යක්ෂ බලය මගේ මනස පාලනය කරමින් තිබිණ. මට එය දැනෙන්නට විය. කෝපය නැග ඒම හොඳින් දැනෙන්නට විය.

මම දත් සපා ගත්තෙමි. සිරුරේ සෑම මස් පිඬුවක්ම තද කර ගත්තෙමි. යක්ෂ බලය ගෙන එන කෝපාන්විත සිතුවිලි පාලනය කරන්නට වීමි.

නමුත්...

"මෙන්න කරුණාවන්තකම..." මම ගෙරවූයෙමි.

ඉන්පසු නැඹුරු වී හුළං බැස තිබූ ටයරය දැතින්ම ගලවා ගත්තෙමි. කෝපය නිසාම සියලු ශක්තය යොදවා කාරයෙන් ටයරය ගලවා ගන්නට මට හැකි විය.

මම එය වීදියට විසි කර දැමුවෙමි.

ඉන්පසු හිස පසුපසට කර සිනාසුණෙමි. මට එම කුරිරු සිනහව නවතා ගත හැකි වූයේ නැත.

ඉන්පසු කාරයේ තිබූ හොඳ ටයරයක්ද ගලවා පාර දිගේ රෝල් කර දැමුවෙමි.

Scanned by CamScanner

සතෙකු මෙන් හති දමමින් මම කාරයේ අනිත් පසට ගියෙමි. ඒ පැත්තේ වූ ටයර දෙකද ගලවා ගෙන පාර දිගේ රෝල් කළෙමි.

එවිටම තරුණයා ආපසු පැමිණෙන අන්දම මට දැකගත හැකි විය.

මම දැත මගේ ඇඳුමේ පිස දා ගත්තෙමි. ඉන්පසු එතනින් නික්ම යන්නට වීමි.

ඔහු මට කතා කරන්නට වූයේය. නමුත් මම පසුපස හැරී නොබැලුවෙමි. මම අන්ධකාර රාත්‍රියේ දිව යන්නට වීමි. අන්ධකාරය වෙතම දිව යන්නට වීමි.

මා අයිති එතැනට ය.

''වෙස් මුහුණේ යක්ෂයා මා පාලනය කරන විට මම කරුණාවන්ත වන්නේ කෙසේද...?''

දිව ගිය මම වීදියේ වූ හුරුපුරුදු නිවසක් අසල නතර වූයෙමි. ඒ පොලීගේ නිවස ය. එහි විදුලි පහන් තවමත් දල්වා තිබිණ. විසිත්ත කාමරයේ ජනේලයේ වීදුරුව බිඳී ගොසිනි.

**පොලීගේ නිවස.** මගේ බියජනක රාත්‍රිය ආරම්භ වූයේ එතැනිනි.

# 17

''මොනවද ඔයා මෙතන කරන්නේ...?''

පොලීගේ අම්මා ඇසුවේ පිරිසිදු කාරක යන්ත්‍රයේ බටය බිමට අත හැර මා දෙස රවා බලමිනි.

පොලීගේ අතේ ප්ලාස්ටික් කුණු මල්ලක් විය. ඇය

සිටියේ බිම තිබූ කෑම සහ වීදුරු කටු එකතු කරමිනි. ඇය කලිසමක් සහ අළු පැහැ කමිසයක් ඇඳ සිටියාය.

විසිත්ත කාමරය දැඩිව අපිරිසිදු වී තිබිණ. කෑම මේසය තවමත් එහි පසෙක ය. බිමට එලා තිබූ බුමුතුරුණ කෑම සහ බීම විසිරී අපිරිසිදුව තිබිණ. හරිකේන් කුණාටුවකට විසිත්ත කාමරය අසුවූවාක් මෙනි.

ඒ ලූ ඇන්ගේ හරිකේන් කුණාටුවයි.

''යනවා යන්න ලූ ඇන්...'' පොලී කීවේ දත්මිටි කමිනි. ''ඇයි ආපහු ආවේ...? ඔයා මෙහේ එන්න ඕන නැහැ.''

''මම පොලිසියට කතා කරනවා.'' ඇයගේ මව පැවසුවාය. ''එයාලා මෙහෙට එයි. එක ගැහැනු ළමයෙකුට මේ දේවල් කරන්න පුළුවන් කියලා එයාලා විශ්වාස කරන එකකුත් නැහැ.'' ඇය සුසුම් හෙලුවාය. ''රක්ෂණ සමාගමවත් මේක විශ්වාස කරන එකක් නැහැ.''

''ඔයා මගේ සාදය විනාශ කළා.'' පොලි තෙපලුවේ වෙව්ලන හඬිනි. ''අපි හැමෝටම... අපි හැමෝටම ඕන වුණේ විනෝද වෙන්න. ඔයා ඒක විනාශ කළා.''

ඔවුහු දෙදෙනාම මා දෙස රවා බලා සිටියහ.

''මට... මට සමාවෙන්න...'' මම මිමිණුවෙමි. ''මම ආපහු ආවේ සමාව ඉල්ලන්න. මට පුළුවන් ඔයාලාට උදව් කරන්න.''

''අපිට ඔයාගේ උදව් ඕන නැහැ.'' පොලීගේ මව කීවාය.

''ඇයි ඔයා එහෙම කළේ ලූ ඇන්...?'' පොලී ඇසුවාය.

''මම... මම දන්නේ නැහැ.'' මම පිළිතුරු දුන්නෙමි. ''මට ඒක පැහැදිලි කරන්න බැහැ.''

''ඔයා මට වෛර කරනවද...? මම හිතුවේ අපි යාළුවෝ කියලා.''

''මම ඔයාට වෛර කරන්නේ නැහැ පොලී.'' මම පැවසුවෙමි. ''ඒක..''

''ඇයි ඔයා තාම ඔය භයානක වෙස් මුහුණ දාගෙන ඉන්නේ...?'' ඇයගේ මව විමසුවාය. ''ඒක ගලවන්න. ඒක

විනෝදයක් ගේන්නේ නැහැ. ඒක දැක්කම මාව ලෙඩ වෙනවා.''

''මට ඒක ගලවා යන්න බැහැ.'' මට කියැවිණ. ''ඔයාලාට පේන්නේ නැද්ද. ඒක ගැලවෙන්නේ නැහැ.''

''මේක විහිළුවක් නෙවෙයි.'' පොලී පැවසුවාය. ''මම හිතුවේ ඔයා ආපහු ආවේ අපිට උදව් කරන්න කියලා.... ඇයි ඔයා මේ වගේ මෝඩ බොරුවක් කියන්නේ...?''

''ඒක බොරුවක් නෙවෙයි.'' මම කීවේ සන්සුන් වෙන්නට උත්සහ දරමිනි. ''මගේ දිහා බලන්න පොලී... බලන්න.''

ඇයගේ මව දිගු සුසුමක් හෙලුවාය. ''දැන් ගෙදර යන්න ලූ ඈන්... ඔයා එක රැකට ලොකු විනාශයක් කරලා තියෙන්නේ.''

ඇය විසිත්ත කාමරයේ ජනේලය වෙත හැරුණාය. එහි බිඳුණු සිදුරෙන් සීතල සුළඟ නිවස තුළට හමා ආවේය. ''මේ ජනේලය වහගන්න මේ වෙලාවේ හොයා ගන්න කෙනෙකුත් නැහැ. සීතල එනවා මෙතනින් ඇතුළට. බලන්න ඔයා කරපු දේ.''

''මම උදව් කරන්නම්.'' මම කීවෙමි.

ඇය නිවැරදි විය. එය බිහිසුණු දෙයකි. නමුත් ඇය වටහා ගන්නේ නැත. ඇයට මා වෙස් මුහුණ ගැන පවසන දේ විශ්වාස කිරීමට අවශ්‍ය නොවිය. ඇය සිතන්නේ මා බොරුකාරියක බව ය.

බොරුකාරි... බොරුකාරි... බොරුකාරි...

''මම උදව් කරන්නම්...'' මම කීවෙමි. ''බලන්න.''

මම දිග මිටක් සහිත කොස්සක් අතට ගත්තෙමි. එහි මිට මේස ලාම්පුවේ වැද්දුවෙමි. මේස ලාම්පුව බිම වැටී බිඳී ගියේය.

ඉන්පසු මම සිවිලිම සරසා තිබූ කුඩා වටටක්කා ගෙඩි සියල්ල බිමට ඇද දැමුවෙමි. වට්ටක්කා යුෂ බුමුතුරුණ මත ඉහිරෙන සේ වට්ටක්කා ගෙඩි පාගමින් ගමන් කළෙමි.

''පේනවනේ මම උදව් කරන විදිහ...?'' මම කෑ ගැසුවෙමි.

පොලී සහ ඇයගේ මව කෑ ගසමින්, වැලපෙමින් එහා මෙහා දුවමින් සිටියහ.

''ගෙදර යන්න ලූ ඈන්... ගෙදර යන්න... ගෙදර යන්න...'' පොලී කෑ ගැසුවාය. ඇයගේ මුහුණ රත් පැහැ වී තිබූ අතර

Scanned by CamScanner

ඇයගේ දෑස බියෙන් සහ විශ්වාස කරගත නොහැකි දේවල් දැකී-මෙන් විසල් වී තිබිණ.

ඇයගේ මව දුරකතනය වෙත ගියාය. ඇය පොලීසියට කතා කරන බව මම දැන සිටියෙමි.

මට අවශ්‍ය වූයේ ඔවුන් ගෙන් සමාව ගැනීමට සහ ඔවුන-'ට අපිරිසිදු වූ විසිත්ත කාමරය පිරිසිදු කිරීමට උදව් වීමට ය. නමුත් මට මාවම පාලනය කර ගත නොහැකි විය. මා කළ යුතු දේ කීවේ දඩයම් වෙස් මුහුණ ය.

මම කෝපි මේසය පෙරලා දැමුවෙමි. අනතුරුව පිරිසිදු කරන යන්ත්‍රයේ වයරය කඩා දැමුවෙමි.

පොලී මාව පාලනය කරන්නට පෙරට පැන්නේය. නමුත් මම හැරී පඩිපෙළ වෙත දිව ගියෙමි.

තදින් හති දමමින් මම අට්ටාලය වෙත දිව ගියෙමි. එහි විදුලි පහන දල්වා තිබිණ. බිත්තිය අසල විවර කළ ලෙසින්ම කළු සහ රන් පැහැයෙන් වැඩ දැමූ පෙට්ටිය තිබිණ. එහි වූ ඇඳුම් පැළඳුම් බිම විසිර තිබිණ. අමතර කාමරයේ දොර වසා තිබිණ.

එවිටම මට එහි සිටින අවතාරය සිහිපත් විය. මාව ඇතුළට ඇද ගන්නට උත්සහ කළ බිහිසුණු අවතාරය මට මතක් විය.

එක්වරම මට පහළ වූයේ උමතු අදහසකි.

## 18

මම කල්පනා කරමින්ම දොර වෙත ගියෙමි.

සැඟව සිටින පරණ අවතාරය... පොලීට ඔහු ගැන අනතුරු ඇඟවීමට මට යළි අවස්ථාවක් නොලැබෙනු ඇත.

Scanned by CamScanner

ඇතැම්විට මට අවතාරය බය කර පලවා හැරීමට හැකි වනු ඇත. නැතිනම් එම අවතාරය ප්‍රයෝජනයට ගෙන දඩයම් වෙස් මුහුණ ගලවා ගත හැකි වනු ඇත.

එය පොලි සහ ඇයගේ මවට කරුණාවන්ත වීමකි. එය සිතාගත නොහැකි කරුණාවන්ත කමකි. මාර්කස්ගේ පියා පැවසූ අන්දමේ කරුණාවන්ත කමකි.

දොර වෙත ළඟා වන විට මගේ දෑත වෙව්ලමින් තිබිණ. නමුත් දොර විවර කරන්නට පෙර මට ශබ්දයක් ඇසිණ. හැරී බැලූ මට දක්නට ලැබුණේ පොලී ය.

ඇය මා පසුපසම පැමිණ සිටියාය. "ලූ ඈන්... ඇහෙනවද සයිරන් නළා සද්දේ...?" ඇය ඇසුවාය. "ඒ පොලිසිය... ඔයාව අල්ලා ගන්න එන්නේ."

ඔව්. මට එය ඇසිණ. යාන්තමින් ඇසිණ. ඈතින් ඇසිණ. ඉක්මනින්ම ඔවුන් ළඟා වනු ඇත.

මට වැඩි වෙලාවක් නැත. මම දොරේ හැඩලය කැරකුවෙමි.

පොලී මා වෙත ආවාය. "ඔයා මොනවද කරන්නේ...? ලූ ඈන්. මෙතනින් යන්න. පොලිසිය මෙතනට එයි. ඔයාට ඔතන හැංගෙන්න බැහැ."

"මට... මට හැංගෙන්න ඕන නැහැ." මම මිමිණුවෙමි. "මම හදන්නේ ඔයාලාට ලොකු උදව්වක් කරන්න. මේ අවතාරය..."

ඒ සමගම දොර විවර විය.

පොලී මා අසලටම ළං වූවාය. "යනවා යන්න. මෙහෙන් යනවා යන්න."

"ඉන්න." මම කීවෙමි. "මම..."

මට වාක්‍යය අවසන් කිරීමට ඉඩක් නොලැබිණ.

අන්ධකාරයේ සිට දිගු වූ ඇටකටු අතක් විත් පොලීගේ උරහිසකින් අල්ලා ගත්තේය.

"අහ්..." ඇයගේ උගුරෙන් හඬක් පිට විය.

මහලු අවතාරය සෙමින් සෙමින් පිටතට ආවේය. **"හරිම තනියි..."** ඔහු ගෙරවූයේය.

ඔහු පොලිව තදින් අල්ලා ගන්නා අන්දම මට දැකිය හැකි විය. ඇය විලාප නගන තුරු ග්‍රහණය දැඩි විය.

"මට උදව් කරන්න... ඔහ්... උදව් කරන්න... එයා මාව අල්ලා ගන්නා... එයා මාව ඇදගෙන යනවා... එයා මාව කලුවරට ඇදගෙන යනවා."

මා බියෙන් ගල් ගැසී බලා සිටියදී මහලු අවතාරය ඇයව ඩැහැගත්තේය.

පොලී ද අන්ධකාරය කාමරය තුළ නොපෙනී ගියේය.

# 19

"හාාාාාාාාාාාාාාාාාාාාාාාාාාාාාාාාාාා" යක්ෂ සිනාවක් මගේ උගුරෙන් පිට විය. මම හිස පසුපසට හරවා සිනාසුණෙමි.

නැහැ ලූ ඈන්... යක්ෂයා සමග සටන් කරන්න... සටන් කරන්න...

මම දැතින්ම මුව වසාගෙන සිනහව නවතා ගන්නට උත්සහ කළෙමි.

යක්ෂයා සමග සටන් කරන්න ලූ ඈන්...

මම ඉදිරියට ගියෙමි. අන්ධකාර කාමරය තුළට ගියෙමි. මඳ වෙලාවකින් කළුවරට දෑස හුරු වූ විට මට පොලීගේ ඉණ දැතින්ම අල්ලාගෙන ඇයව අන්ධකාරයට ඇදගෙන යාමට උත්සහ කරන මහලු මිනිසාව දැකගත හැකි විය.

"*හරිම පාාාාාාාාාාාාාාාලුයි.*" ඔහු මිමිණුවේය.

"නැහැ..." මම කෑ ගැසුවෙමි.

මම පොලීව අල්ලා ඇද ගත්තෙමි. ඉන්පසු මහලු අවතාරය

Scanned by CamScanner

වෙත පැන්නෙමි.

ඔහුගේ උගුරෙන් හඬක් නිකුත් විය. "**වෙස් මුහුණ... එපා.... වෙස් මුහුණ.**" ඔහු පසුපසට පැන්නේය.

ඇටකටු බිඳෙන හඬ මට ඇසිණ. ඔහුගේ එක් පයක් ගැලවී සිරුරෙන් එල්ලෙමින් තිබිණ.

මම ඔහුට පහර දුන්නෙමි. මේ වතාවේ ඔහුගේ හිස දෙකට කැඩිණ. එය ඔහුගේ ඇටකටු ගෙලෙන් ගැලවී රෝල් විය.

ඔහුට දැන් සෙලවිය නොහැක.

පොලී වෙව්ලමින් බලා සිටියාය. ඇයගේ දෑස විසල් වී තිබිණ.

මම ඇයව අට්ටාලය වෙත රැගෙන ගියෙමි. ''සේරම හරි.'' මම කෙඳිරුවෙමි. ''පොලී... සේරම හරි.''

''ස්තුතියි ශූ ඈන්.'' ඇය තෙපලුවාය.

මම මගේ වෙස් මුහුණ ගලවන්නට උත්සහ කළෙමි. දැන් එය කළ හැකි බව මට විශ්වාස ය. මම පොලීව අවතාරයෙන් බේරා ගෙන කරුණාවන්ත වීමි.

මම වෙස් මුහුණ ගලවන්නට වීමි.

ගැලවෙන්න. ගැලවෙන්න.

මම වෙස් මුහුණේ පහතින් අල්ලා ගත්තෙමි. එය එස-වූවෙමි. නමුත් අත ලිස්සා ගියා පමණි.

නැත.

කිසිවක් සිදු වූයේ නැත.

අනේ... අනේ ගැලවෙන්න....

පොලී බේරා ගැනීම ප්‍රමාණවත් වී නැත. නැතිනම් ව්‍රිග්ට් මහතා පැවසුවේ බොරුවක් ද...? ඔහු මට දුන්නේ වැරදි විසඳුමක් ද...?

නැත. ඔහු එසේ කරන්නේ කුමක් නිසාද...?

ඔහු විවිධ වර්ගයේ වෙස් මුහුණු ගැන විශේෂඥයෙකි. දඩයම් වෙස් මුහුණ ගලවන අන්දමද ඔහු දින සිටිය යුතුම ය.

මම නැවත නැවතත් උත්සහ කළෙමි. එයට තදින් පහර

Scanned by CamScanner

දුනිමි. ඇද්දෙමි.

නැත.

වෙස් මුහුණ මගේ සමටම ඇලී ඇත. මගේම සම වී ඇත.

සයිරන් නළා හඬේ ශබ්දය වැඩි වී තිබිණ. පොලීසිය පොලීගේ නිවස ඇති වීදියට ළඟා වී ඇත.

මම දුවන්නට වීමි. පඩි දෙක දෙක පනිමින් පඩිපෙළ බැස ගත් මම මුළුතැන්ගෙහි දොරෙන් පිටතට පැමිණියෙමි.

මම හැකිතරම් වේගයෙන් දුවන්නට වීමි.

වේගයෙන් වේගයෙන් දිව්වෙමි.

පාර දිගේ දිව්වෙමි. නිවාස සහ ගෙවතු පසුකරමින් දිව්වෙමි.

දිව්වෙමි... දිව්වෙමි...

නමුත් ඒ කොහේටද...?

මා යන්නේ කොහේටද...?

# තුන් වෙනි කොටස

# ඩෙවින්ගේ කතාව

## 01

ලොව මා අඩුවෙන්ම කැමති දේවල් තුනක් විය.

1. පෙඟුණු බිස්කට් කෑම.
2. සතියේ ඕනම දවසක ගෙදර වැඩ කිරීම.
3. රාත්‍රියේ වට්ටක්කා වගා බිමේ ඇවිදීම.

Scanned by CamScanner

මම ඩේවිත් ඕ බැනොන් වෙමි. ඔක්තෝබරයේ සීතල රාත්‍රියක මට කෙළවරක් නොමැති වට්ටක්කා වගා බිමක ඇවිදීමට සිදුව ඇත. අහසේ සඳ පෙනෙන්නට නොවීය. සීතල සුළඟ හමා ගියේ වට්ටක්කා වැල්වල මහත කොළ සොලවමිනි.

මගේ නිවුන් සොයුරියෝ වූ වයස අවුරුදු හයක ඩේල් සහ ඩොලී ද මා සමග වූහ. ඔවුහු මගේ අත්වලින් අදිමින්, වැල් සහ කොළ උඩින් පනිමින්, සිනාසෙමින්, ගී ගයමින් මා සමග, ඇවිද ගියහ.

මා පතමින් සිටියේ නිවසට වී සිටින්නට ලැබුණා නම් කෙතරම් හොඳදැයි කියා ය. එසේ නම් මගේ මිතුරිය ලූ ඇන්ගේ නිවසට වී පොප්කෝන් කමින් ඇය හා විහිළු කරමින් කාලය ගෙවන්නට තිබිණ.

නමුත් මට සිදුව ඇත්තේ මගේ සොයුරියන් සමග වට්ටක්කා වගාවක ඇවිදිමින් සිටින්නට ය. එනම් මා අඩුවෙන්ම කැමති දේවල් ලැයිස්තුවේ තුන්වෙනි දෙය කිරීමට ය.

වට්ටක්කා කොළ විශාල මෙන්ම රවුම් හැඩැති විය. ඒවා මට සිහිපත් කළේ බේස්බෝල් අත් වැසුම් ය. ඒවාගේ පෙනුම ද මාව අල්ලා ඒ තුළට ඇද ගැනීමට උත්සහ දරනවාක් වැනි විය. හරියට කෘමීන් ඩැහැගන්නා ඇතැම් මාංශභක්ෂක ශාක මෙනි.

එම මහත, කැත කොළවල ශබ්දය ද එසේම ය. සුළඟ හමා යන විට ඒවා එකිනෙක හැපුණේ අත්පුඩි ගසනවාක් මෙන් හඬක් නිකුත් කරමිනි.

මුළු වට්ටක්කා වගා බිමම අත්පුඩි ගසනවාක් මෙන් විය.

ඒවා අත්පුඩි ගසන්නේ කුමක් නිසාදැයි ඔබ දන්නවාද...?

ඒ ඔවුන් අසරණ කෘමියෙකු ඔවුන්ගේ වැල් තුළට ඇද ගැනීම නිසා ය.

ඇතැම් විට එය සත්‍යයක් නොවෙන්නට ඇත. මා නිතරම එවැනි විකාර කතා සිතන බව මගේ පියා මට පවසා ඇත.

මම වට්ටක්කා වැල් ගැන තවමත් කතා නොකළෙමි. ඒවා මහත, අත්පුඩි ගසන පත්‍ර යට සැඟව තිබිණ. ඒ නිසාම ඒවාගේ

Scanned by CamScanner

පැටලී වැටෙන්නේ ඉතා පහසුවෙනි.

වට්ටක්කා වැල් ද ඝනකම සහ දිග ඒවා ය. සර්පයින්ට වඩා විශාල වැල් එහි විය. සැබවින්ම එහි පෙනුම සර්පයින්ගේ මෙන් විය. මෙම දිග, ඝනකම් සර්පයින් කෙළවර වට්ටක්කා එල්ලී තිබිණ.

මෙම ගොවිපළේ බිය වීමට තිබුණේ එය පමණක් නොවේ. අප යන හැමතැනම අප පසුපස එන සීයුස් නම් ලොකු බළලෙක් ද ගොවිපළේ සිටියේය. සීයුස්ට තිබුණේම යක්ෂ පෙනුමකි. යක්ෂ ඇසකි.

ඔහු නිහඬව මා පසුපස එයි. නිතරම මා දෙස බලා සිටියි.

අනිත් කෙනා බානස් නෝනා ය. ඇය ගෘහ පාලිකාව මෙන්ම ගොවිපළේ කෝකිවරිය ද වූවා ය. බානස් නෝනා තරබාරු කාන්තාවකි.

ඇයගේ මුහුණ ද ඇයගේ සිරුර මෙන්ම තරබාරු විය. හරියට ඇය වට්ටක්කාවලින් සෑදී ඇත්තාක් මෙනි.

ඇය සැබවින්ම ඉතා යහපත් ය. ඇයට උණුසුම්, මිත්‍රශීලී සිනහවක් මෙන්ම මෘදු හඬක් ද තිබිණ. ඇය අද උදේ ද මට අමතරව පැන් කේක් කිහිපයක්ම ලබා දුන්නා ය.

නමුත් එය ප්‍රමාණවත් නොවිය. සියලු ශාන්තුවරියන්ගේ සැදැවට සතියකට පෙර සීතල ඔක්තෝබරයේ රැයක මම මගේ සොයුරියන් සමග කෙළවරක් නොමැති වට්ටක්කා වගා බිමේ ඇවිදිමින් සිටින්නෙමි.

"මේක නම් අපූරුයි." ඩොලි හඬ නැගුවාය. ඇය නැටුමක් නටන්නට වූවාය.

එවැනි සොයුරියක සිටීම ම කරදරයක් විය.

සොයුරියන් දෙදෙනාම එවැනි අය වීම වඩාත් කරදරයක් විය.

ඔවුහු දෙදෙනාම සුන්දර ඇරියෝ වූහ. තඹ පැහැ වරලසකින් සහ නිල් පැහැ විසල් දෑස්වලින්ද, සිනාවත් ගෙන් ද මඳක් වක් වූ නාසයන් ගෙන් ද, වල ගැසුණු දෙකම්මුලින් ද ඔවුහු

යුතු වූහ.

ඩොලී සහ ඩේල් සියලු ශාන්තුවරයින්ගේ සැඳෑවේදී ගයන ගීතයක් ගයමින් ලොකු වට්ටක්කා ගෙඩියක් වටා නටන්නට වූහ. ඩේල් මාව ද ඔවුන්ගේ නැටුමට එක්තර ගන්නට උත්සහ කළාය.

කිසියම් දෙයක් සිදුවන්නට ආසන්න බව මට දැනිණ.

අවංකවම කියනවා නම් මම මෙම වගා බිමට බිය වූයෙමි. එය ඉතා අන්ධකාර වූවාක් මෙන්ම වට්ටක්කා වැල් අතර ලිස්සා යන සැබෑ සර්පයින් සිටින්නට ද ඉඩ තිබිණ.

එමෙන්ම මෙම වගා බිම නිතරම බිහිසුණු යමක් සිදුවන තුරු මඟ බලන තැනක් මෙන් දිස් විය.

නමුත් ගැහැනු ළමුන් ඉදිරියේ මම නිර්භීත අයෙකු මෙන් රඟපෑවෙමි. මා ඔවුන්ගේ වැඩිමහල් සොහොයුරා මෙන්ම එය මාගේ රාජකාරිය ද විය.

මම ඔවුන් ගෙන් මිදී අඩි කිහිපයක් පසුපසට ගියෙමි. මහත වට්ටක්කා කොළ මගේ කලිසම් පාදවල ගැවිණ. සීතලක් මගේ සිරුර පුරාම පැතිර ගියේය.

අන්ධකාරය තුළ මට දිලිසෙන කොළ පැහැ දෑසක් දැකිය හැකි විය. ඒ බළල් දෑසකි. සියුස් නැවතත් අප පසුපස පැමිණ ඇත.

ගැහැනු ළමයි ලොකු වට්ටක්කා ගෙඩිය වටා නැටීම වේගවත් කරමින් ගී ගැයූහ.

"ජැක්... ජැක්... ජැක් ලන්තෑරුම...

ජැක් ලන්තෑරුමට පණ ඇවිල්ලා...

පණ ඇවිල්ලා... පණ ඇවිල්ලා...

ජැක්... ජැක්... ජැක්... ජැක්..."

"පණ ඇවිල්ලා...? ඔයාලා විහිළු කරනවද...?" මම කෑ ගැසුවෙමි.

ඔවුහු දෙදෙනා සිනාසුණහ.

"කොහෙන්ද ඔයාලා ඒ සින්දුව ඉගෙන ගත්තේ...?" මම

ඇසුවෙමි.

"අපි ඒක හදලා කිව්වේ මෝඩයෝ." ඩොලී පිළිතුරු දුන්නාය.

"ඔව්... අපි හැම වෙලාවෙම සින්දු හදලා තියනවා." ඩේල් තෙපලුවාය. "ඇයි ඔයා අපි එක්ක නටන්න එන්නේ නැත්තේ ඩෙවින්...? කළුවරේ මේ විදිහට නටන එක කොච්චර අපූරු දෙයක්ද...?"

"අපූරු නැහැ." මම පැවසුවෙමි. "කොහෙත්ම අපූරු නැහැ. ආපහු ගෙදර යමු. සීතලයි."

"නැහැ. එහෙම නැහැ."

මා නිතරම වැරදි ය.

"ජැක්... ජැක්... ජැක් ලන්තෑරුම...

ජැක් ලන්තෑරුමට පණ ඇවිල්ලා...

පණ ඇවිල්ලා... පණ ඇවිල්ලා...

ජැක්... ජැක්... ජැක්... ජැක්..."

"ඒ සින්දුව නවත්තන්න." මම කෑ ගැසුවෙමි. ඔවුන්ගේ එම සින්දුව මා තුළ බිය වැඩි කිරීමට සමත් විය. මම සිටියේ වෙව්ලමිනි.

හේයි... මම නගර වැසියෙක්මි. මා හැදුණේ වැඩුණේ නිව්යෝර්ක් නගරයේ ය. මා කවදාවත් ගොවිපළක වාසය කර නැත.

පියා වට්ටක්කා ගොවිපළකට මා ගෙන ඒම මට විශ්වාස කළ නොහැකි තරම් විය. නමුත් පසුගිය වසරේදී ඔහුගේ රැකියාව ඔහුට අහිමි විය. ඒ නිසා මුදල් සෙවීමට වෙනත් මඟක් තෝරා ගැනීමට ඔහුට සිදුව තිබිණ.

එබැවින් මම කිසිදු පැමිණිල්ලක් නොනැගුවෙමි. මා ඔහුට දවසට පස් හය වතාවක්ම කීවේ මා මෙම ප්‍රදේශයට අකැමති බව පමණි.

වේගවත් සුළඟක් ගොවි බිම හරහා හමා යන්නට විය. ගස් පහතටම නැමෙන්නට විය. ඒ මහා ශබ්දයක් නගමිනි. වට්ටක්කා

Scanned by CamScanner

කොළ වේගයෙන් සෙලවිණ.

"මම ගේ ඇතුළට යනවා." මම නිවුන්නුන්ට කීවෙමි. "ඔයාලාත් එනවද...?"

ඔවුන් ගෙන් පිළිතුරක් ලැබෙන තුරු මම බලා නොසිටියෙමි. ආපසු හැරී නිවස වෙත යන්නට වූ මා පැටලුණේ මහත, දිග වට්ටක්කා වැලක ය.

**"ඕඕඕආආආආආආආ."**

මම ඇද වැටෙන්නට වීමි.

මට අල්ලා ගන්නට කිසිවක් නොවීය. මගේ වැටීම නැවතිය හැකි යමක් ද අහළ පහළ නොවිණ.

මා වැටෙන අත්දම දිලිසෙන බළල් දෑස බලා සිටින බව මට දැකිය හැකි විය.

මම හඬ නගා බිම වැටුණෙමි. මගේ හිස තදින් කිසිවක ගැටිණ. ඒ වට්ටක්කා ගෙඩියක ද...? නැතිනම් ගලකද...?

මගේ සිරුර වේදනාවෙන් වෙලිණ.

හැමදෙයක්ම කළු පැහැ විය. රාත්‍රී අහසට වඩා කළු පැහැ විය.

මම අසීරුවෙන් දෑස විවර කළෙමි. තවමත් වේදනාව නිසාම හිස කැරකෙන්නාක් සේ විය.

**"ඕඕඕත්ත්ත්ත්ත්."** සිහින් කෙඳිරියක් මගේ මුවෙන් පිට විය. මම වේදනාව ඉවත් කරන්න මෙන් හිස තදින් සෙලවූයෙමි.

"ඔයා හොඳින්ද...?"

"ඩෙවින්... ඔයාට තුවාලද...?"

මගේ නිවුන් සොයුරියෝ මා වෙත නැමී බලා සිටියේ විසල් කරගත් දෑසිනි.

"නැහැ... හොඳින් නෙවෙයි." මම පැවසුවෙමි. මම දෑත දිගු කර ඔවුන්ට මාව නැගිටවන්නට ඉඩ හැරියෙමි.

"මොකද වුණේ...?" ඩොලී ඇසුවාය.

"ඔයාලා දැක්කේ නැද්ද සිද්ධ වුණ දේ...?" මම කෑ ගැසුවෙමි.

ඔවුහු දෙදෙනාම හිස් සෙලවූහ. ''ඔයා පැටලුණාද...?'' ඩේල් ඇසුවාය.

''නැහැ.'' මම තෙපලුවෙමි. ''ඔයාලා දැක්කේ නැද්ද ඒ වැල සෙලවෙනවා....? අර අතන තියෙන වැල.'' මම එය පෙන්වා කීවෙමි. ''ඒක සෙලවුණා. ඒක මාව අල්ලා ගත්තා. ඇත්තටම මම දැක්කා ඒක සෙලවෙනවා.''

# 02

ගැහැනු ළමයි සිනාසුණහ. ඔවුන් සිතුවේ මා විහිළු කරන බව ය. නමුත් එය එසේ නොවිය.

අන්ධකාරයේ වුවද වට්ටක්කා වැල් එකිනෙක මතඇඹරෙමින් එහා මෙහා ඇදෙන බව මා දුටු බව මට දිවුරා පැවසිය හැකි ය.

මම සිටගෙන හිස පිරිමැද ගත්තෙමි. මා වැටෙන විට මගේ නළල කොහේ හෝ වැදී ඇත. එතැනින් රුධිරය ගලා ආවේ නැත. නමුත් තැලුම් පහරක් තිබිය හැකි බව මට සිතිණ.

සීතල සුළඟ මගේ රත්ව තිබූ මුහුණට ගෙන ආවේ සහනයකි. වට්ටක්කා පත්‍රවල අත්පුඩි ගසන හඬ හැර ගොවි බිම නිහඬව තිබිණ. රාත්‍රී කුරුල්ලන්ගේ හඬක්වත් කොතැනකින්වත් ඇසුණේ නැත.

''යමු... ගේ ඇතුළට.'' මම පැවසුවෙමි. ''මේ රාත්‍රියේ විනෝද වුණා හොඳටම ඇති.''

එවිටම ඉතා දිග සතෙකු ඉහළ නැගී මගේ මුහුණට පහර

Scanned by CamScanner

දෙන්නට සැරසිණ.

"සර්පයෙක්... සර්පයෙක්..." ඩොලි කෑ ගැසුවාය.

මම විලාප නැගුවෙමි.

ගැහැනු ළමයි සිනාසුණහ. ඩේල් මගේ මුහුණ ඉදිරියේ වට්ටක්කා වැලක් වනමින් සිටියේය. ඇය එය දැකින්ම අල්ලා ගෙන සිටියාය.

ඔවුන් සිනාසුණද මා සිටියේ සිනාසිය හැකි තත්ත්වයක නොවේ. මට කණගාටුවක් ඇති විය.

මා සතියක්ම මෙම ගොවිපලේ කාලය ගෙවිය යුතු විය. සතියම වට්ටක්කා බලා කියා ගත යුතුය. එපමණක් නොව ඒවා මිනිසුන්ගේ වාහන වෙත ගෙන යාම ද, අමුත්තන්ට මඟ පෙන්වීමද, පොත්පත් පවත්වාගෙන යාමද ආදී ගොවිපළක සියලු කටයුතු සිදු කළ යුතු විය.

ඒ සතියම මගේ පාසලෙන් සහ මිතුරන් ගෙන් ඈත් වී සිටිය යුතු විය.

නිවස තුළට ආ සැනින් මා කළේ ලූ ඇන්ට දුරකතන ඇමතුමක් ගෙන ඇය ගැනත් අපගේ අසල්වැසියන් ගැනත් විමසීම ය.

"පොලී මාර්ටින්ගේ සාදයට අපිට යන්න වෙලා." ඇය කිව්වාය. "බ්‍රැඩ්, මාර්කස් සහ මම ඒ ගැන හිත හිතා ඉන්නේ... ඒත් ඒ සාදය උද්යෝගිමත් එකක් කරන්න අපිට කිසිම හොඳ අදහසක් එන්නේ නැහැ."

"මං දන්නවා ඔයාලාට කරන්න හොඳ දෙයක්." මම නළල පිරිමදින අතර කිවෙමි. "ඔයාලා මෙහේ එන්න. මෙහේ අමතර කාමර තියෙනවා. ඔයාලාට පුළුවන් මගේ වැඩ ටික කරලා දෙන්න."

ඇය එයට සිනාසුණේ නැත. "ඔයා දන්නවනේ මට ඔහෙට එන්න බැහැ කියලා ඩෙවින්. මගේ දෙමව්පියෝ මට ඉස්කෝලේ යන්නේ නැතිව ඔයාගේ ගොවිපළේ වට්ටක්කා කඩන්න එන්න දෙන එකක් නැහැ."

Scanned by CamScanner

"ඒත් ලූ ඇන්..." මම පැවසුවෙමි. "මේ ගොවිපළ තියෙන්නේ ඔයාගේ ගෙදර ඉඳන් පැයකින් විතර එන්න පුළුවන් දුරකින්. සමහරවිට ඔයාට පුළුවන් වෙයි..."

"ඒක අමතක කරලා දාන්න ඩෙවින්. ඒක වෙන්න විදිහක් නැහැ." ඉන්පසු ඇය මට ගෙන් කිසිවක් කෑ ගසා ඇසුවාය. විනාඩියක පමණ වෙලාවක් ඔවුන් දෙදෙනා අතර කතාබහ සිදු විය.

අනතුරුව ඇය නැවත දුරකතනයට සම්බන්ධ වූවාය. "ඔයා අකැමැත්තෙන්ද ඔහේ ඉන්නේ...?"

"අකැමැත්තෙන් කියන එක නෙවෙයි හොඳම වචනේ." මම පැවසුවෙමි.

"හොඳයි... ඔයාට පටන් ගැන්මම නරකයි නම් ඔයා හිතන්න පොලීගේ සාදය මග ඇරෙන එක මොනතරම් හොඳක්ද කියලා."

මා පිළිතුරක් දෙන්නට සැරසුණද මගේ දෑස මගේ නිදන කාමරයේ ජනේලය වෙත යොමු විය. කිසියම් දීප්තිමත් බිහිසුණු යමක් මට පෙනිණ.

මම හොඳින් ජනේලය දෙස බැලුවෙමි. මොහොතක් ගත වූ පසු එය විශාල ජැක් ලන්තෑරුමක් බව මට පැහැදිලි විය. එය සිනාසෙන මුහුණකින් යුත් ලන්තෑරුමකි. එය මගේ කාමරයේ පාව එමින් තිබිණ.

## 03

මම තිගැස්මෙන් කෑ ගැසුවෙමි.

හැරී බැලුවද මගේ කාමරය තුළ කිසිවක් තිබුණේ නැත. ජැක් ලන්තෑරුමක් ද නැත. පාවෙන වට්ටක්කා ගෙඩියක් ද නැත.

Scanned by CamScanner

මම නැවත ජනේලය දෙස බැලුවෙමි. සිනාසෙන වට්ටක්කා මුහුණක් ජනෙල් වීදුරුව අසල විය. එය දිප්තිමත්ව දැල්වෙමින් තිබිණ.

මම නැවතත් හැරුණෙමි. කාමරය තුළ ජැක් ලන්තෑරුමක් නැත.

ඉන්පසු මම නැවතත් ජනේලය වෙත හැරුණෙමි. අන්ධකාර වීදුරුවෙන් වට්ටක්කා ගෙඩිය සෙමින් මැකී යන අන්දම මට දැකිය හැකි විය. කිසිවක් එහි නොමැති වන තරමට එය මැකී ගියේය. එය මැකී ගිය වහාම මගේ හද ගැස්මද වේගවත් විය.

මෙහි නොමැති දෙයක රූපය ජනෙල් වීදුරුවෙන් පෙනෙන්නේ කෙසේද...?

"ඩෙවින්...? ඩෙවින්...? මොකක්ද ප්‍රශ්නෙ...? ඇයි ඔයා කෑ ගැහුවේ...?"

ලූ ඇන්ගේ බියපත් හඬ මට ඇසිණ.

"මම... මම දැන් යන්න ඕන." මම පැවසුවෙමි. මගේ දෑස ජනේලය වෙතම යොමුව තිබිණ.

"ඔයා හොඳින්ද...?"

"ඔව්... පස්සේ කතා කරන්නම්." මම පැවසුවෙමි. මම ඇමතුම විසන්ධි කර දුරකතනය ඇඳ මතට විසි කළෙමි. ඉන්පසු කාමරයෙන් පිටවූයෙහි. සාලය හරහා දිව ගොස් පිටුපස දොරෙන් පිට වූයෙමි.

සුළඟ වේගයෙන් හමා යමින් තිබිණ. නමුත් මම එය නොතකා නිවසින් පිටත අන්ධකාරයේ දෑස දුවවමින් දැල්වෙන ජැක් ලන්තෑරුමක් සෙව්වෙමි.

නැත. කිසිවක් නොවීය.

මගේ කාමරය තුළ ද එවැන්නක් නැත. පිටත ද නැත. නමුත් මා දුටුවේ මා මවාගත් දෙයක් නොවේ. එවන් දෙයක් මවා ගැනීමට කිසිසේත්ම විදිහක් නැත.

මම හිස වැදුණු තැන පිරිමැද ගත්තෙමි. එය තවමත් රිදුම්

දෙයි.

මා දුටුවේ කුමක්ද...?

"කවුරුහරි එළියේ ඉන්නවද...?" මම ඇසුවෙමි. සීතල සුළඟේ ශබ්දයත් සමග මගේ කටහඬ ඇසුණේ අද්භූත ලෙසිනි.

අවට නිහඬ ය. වට්ටක්කා පත්‍ර එකට ගැටෙන හඬ ඇසිණ. අනතුරුව ඇසුණේ සීරෙන හඬකි. ඒ දිගු වට්ටක්කා වැල් වැල්ලේ ඇදෙන හඬ ය.

නැත.

වට්ටක්කා වැල් එවන් හඬක් නගන්නේ කුමක් නිසාද...? එය සාමාන්‍යයෙන් නැගෙන හඬ නොවේ.

මම උණුසුම ලබා ගැනීම සඳහා දෑත බැඳගෙන නිවස පිටුපසට අඩි කිහිපයක් ගමන් කළෙමි. මගේ නිදන කාමරයේ ආලෝකය එහි ජනේලයෙන් පිටතට පතිත වී තිබිණ. එම ආලෝකයෙන් මම වට්ටක්කා වගා බිම වෙත ගමන් කළෙමි.

මගේ දෑස කළුවරට හුරු වෙන්නට මඳ වෙලාවක් ගත විය. වට්ටක්කා වගා බිම දැඩි අඳුරක ගිලී තිබිණ. අහසේ කෙළවරවත්, පොළොවවත් මට හඳුනාගත නොහැකි තරම් අවට කළුවර විය.

නමුත් වට්ටක්කා වැල් වෙත ළං වන විට මට වැල්වල ලිස්සා යාම වඩාත් හොඳින් ඇසිණ.

වට්ටක්කා වැල් සෙලවෙමින් තිබිණ. දුසිම් ගණනින් එහා මෙහා ඇදෙමින් තිබිණ.

වට්ටක්කා ද සමග නිවස වෙත ගමන් කරමින් තිබිණ.

මට හුස්ම ගැනීම පවා අමතක විය. මම හුස්ම අල්ලා ගත්තෙමි.

මගේ දෑස බිම වූ වට්ටක්කා ගෙඩි වෙත යොමු විය. විශාල, රවුම් වට්ටක්කා ගෙඩි කෙලින්ම මා ඉදිරියේ විය.

මා පුදුමයට පත් වූයේ ඒවා ද එහා මෙහා වන බව දැකීමෙනි. සෙමින් සෙමින් ඒවාගේ දෙපැත්ත සෙලවුණද මට එය දැකගත හැකි විය. එනම් වට්ටක්කා ගෙඩි ආශ්වාස කරන බව ය.

වට්ටක්කා ගෙඩි හුස්ම ගනිමින් තිබිණ.

Scanned by CamScanner

"නෑෑෑෑෑෑෑෑෑෑෑෑෑෑෑෑ." සිහින් කෙඳිරියක් මගේ මුවෙන් පිට විය. මගේ මුළු සිරුරම බියෙන් වෙව්ලමින් තිබිණ.

මම හැරී දුවන්නට වීමි. මගේ පාවහන් වැල්ලේ ලිස්සා ගියේය. මම නිවසට ඇතුළු වී මගේ දෙමව්පියන්ගේ කාමරයට කඩා වැදුණෙමි.

කලබලය නිසාම මට දොරට තට්ටු කිරීම පවා අමතක විය. කිසිවක් මතක තියාගත නොහැකි තරම් මා බියපත්ව සිටියේය.

දෙමව්පියන් සිටියේ නින්දේය. "අම්මා... තාත්තා..." මම ඇඳ වෙත දිව ගොස් ඔවුන්ව අවදි කළෙමි.

"හහ්...? ඇයි....?" මව දෑස් පිසිමින් ඇසුවාය.

"ඩෙවින්... මොකක්ද ප්‍රශ්නෙ...?" පියා නිදිබර තඬින් විමසුවේය.

"ඒ... ඒ වැල්." මම කීවෙමි. හති දමමින් සිටි නිසා මා කතා කළේ අපහසුවෙනි. "ඒවා ලොකු වෙලා. ඇවිදිනවා. මම ඒවා දැක්කා. ඔයාලා මාව විශ්වාස කරන්න ඕන. වට්ටක්කා වැල් සර්පයෝ වගේ එහා මෙහා ඇදෙනවා. ගේ පැත්තට එනවා. වට්ටක්කා ගෙඩි... මම දැක්කා ඒවා හුස්ම ගන්නවා."

"ඔව්... මම දන්නවා." පියා කීවේ කොට්ටයෙන් උඩට හිස ඔසවමිනි. "මම ඔයාට ඒ ගැන කියන්න හිටියේ."

# 04

"හ්...?" මම ගැහෙන හදවතින් යුතුව පියා දෙස බැලුවෙමි.

"ඩෙවින්." පියා කතා කළේය. "අපි වට්ටක්කා ගෙඩි පැනලා යයි කියලා ඒවා බලාගන්න වට්ටක්කා උඩ වඳුරෝ දූසිම දෙකක් විතර ගෙනත් වාඩිකරවලා තියෙන්නේ."

Scanned by CamScanner

අම්මායි, තාත්තායි දෙදෙනාම සිනාසුණහ.

මම කට ඇරගෙන බලා සිටියෙමි. ඔවුන්ගේ සිනහව නතර වන තුරු බලා සිටියෙමි. "උහ්... ඒකේ තේරුම ඔයාලා මාව විශ්වාස කරන්නේ නැහැ කියන එකද...?"

එය ඔවුන්ගේ සිනහව වැඩි කිරීමට හේතු විය.

"නැහැ. අපි ඔයාව විශ්වාස කරන්නේ නැහැ." මව පැවසුවාය. ඇය මගේ අතක් අල්ලා ගත්තාය. ඇයගේ අත උණුසුම් ය. මගේ අත සීතල වී තිබිණ.

"අපි විශ්වාස කරන්නේ නැහැ වට්ටක්කා වැල් ඇවිදිනවා කියලාවත්, වට්ටක්කා ගෙඩි හුස්ම ගන්නවා කියලාවත්." මව තෙපලුවාය. "අපි දන්නවා ඔයාට මෙහේ ඉන්න ඕන නැහැ කියලා දරුවෝ....ඒත් බය හිතෙන කතා හැදුවා කියලා ඔයාට මෙහෙන් යන්න ලැබෙන්නේ නැහැ."

"මම... මම ඒ කතාව හදලා කිව්වේ නැහැ."

ඇය මගේ අත මිරිකුවාය. "ඇඳට යන්න ඩෙවින්... ඔයා නරක හීනයක් දකින්න ඇති."

මම ආපසු හැරී නිදන කාමරයේ දොර වෙත යන්නට වීමි. සමාවෙන්න එයාලාව අවදි කළාට."

එය මා දුටු නරක සිහිනයක් නොවන බව මට විශ්වාස ය. ඒවා සිදු වූයේ සැබවින්ම ය. මා නිදා සිටියේ නැත. ලූ ඈන් සමග දුරකතන සංවාදයේ යෙදී සිටියදී මම මගේම දෑසින් ජැක් ලන්තෑරුම දුටුවෙමි.

අවසානයේදී සාමාන්‍ය පරිදි ආශ්වාස කිරීමට මට හැකි විය. මම මගේ කාමරයට ගියෙමි. අප සිටියේ පරණ ගොවි නිවසක වූ අතර පය තබන සෑම විටම බිම සකසා තිබූ ලෑලිවලින් හඬක් නැගිණ.

එබැවින් සෑම මොහොතකම නිවසෙන් විවිධ හඬ නැගිණ. උණුසුම ලබා දුන් යන්ත්‍රයද වැඩ කළේ පිඟින ශබ්දයක් නිකුත් කරමිනි.

එය හරියටම හොල්මන් නිවසක මෙනි.

එලෙස සිතීම ගැන මම මටම දොස් පවරා ගත්තෙමි. "ඩෙවින්... ඔයා සතියක්ම මෙහේ ජීවත් වෙන්න ඕන. ඒ සතියක කාලයේ මොන මොන දේවල් මෙහේ සිද්ධ වෙයිද...?"

සොයුරියන්ගේ කාමරය දෙසින් සිනා හඬක් ඇසිණ. මැදියම් රැයට ආසන්නව තිබුණද ඔවුන් සිටියේ අවදියෙනි. ඔවුන් සිටියේ මෙවැනි ගොවිපළක සහ පරණ නිවසක වාසය කරන්නට ලැබීම ගැන උද්යෝගයෙනි. ඒ නිසා ඔවුහු හැම මොහොතකම වවටක්කා සෙල්ලම් කරමින්, වට්ටක්කා සින්දු කියමින් සිටියහ.

ඔවුන් මෙන් මට විනෝද විය නොහැක්කේ කුමක් නිසාද...?

වට්ටක්කාවලට ආශ්වාස කළ නොහැක. වට්ටක්කා වැල්වලට සර්පයින්ට මෙන් ලිස්සා ගමන් කළ නොහැක.

මා එවැනි දේ මවා ගන්නේ කුමක් නිසාද...?

"සන්සුන් වෙන්න ඩෙවින්."

**"ඕඕඕහ්හ්හ්."** මඳ ආලෝකයක් සහිත සාලයේදී විශාල රූපයක හැපෙන්නට ගිය මට කෑ ගැස්සිණ.

ඒ බානස් තෝනා බව හඳුනාගන්නට මට මොහොතක් වෙලා ගත විය. ඇය සිනාසෙමින් මා වෙත පැමිණියාය.

"නින්ද යන්නේ නැද්ද ඩෙවින්...?" ඇය ඇසුවේ රිදී පැහැ දෑසින් මා දෙස බලමිනි.

"උහ්... ඒ වගේ." මම තෙපලුවෙමි.

"ඔයා ඉන්නේ උද්යෝගයෙන්. මිනිස්සු හිතනවාට වඩා ගොවිපළක ජීවිතය අපූරුයි."

"අපූරුයි...?" මම ඇසුවෙමි.

ඇය හිස වැනුවාය. "එළියේ එකේක විදිහේ සත්තු ඉන්නවා. හැම තැනම එක එක දේවල් වැවිලා. නගරයේ ජීවිතයට වඩා වෙනස්."

"ඔයා හරි." මම මිමිණුවෙමි.

"මට පුළුවන් ඔයාට බීමක් හදලා දෙන්න." ඇය කීවේ මා ඇය සමග කැඳවාගෙන යමිනි. "රසම රස උණු වට්ටක්කා තේ

කෝප්පයක්.''

මොනවා...?

''වට්ටක්කා තේ...?'' මගේ බඩ දඟලන්නට විය.

''ඒකේ රස නිසා ඔයා සන්සුන් වෙයි.'' ඇයගේ රිදී පැහැ දෑස ඇසි පිය සැලුවේ නැත.

''එපා... ස්තුතියි.'' මම කීවෙමි. ''මම හොඳින්.''

ඇයගේ මුහුණ එල්ලා වැටිණ. ඇය තුළ වූයේ බලාපොරොත්තු සුන් වූ පෙනුමකි. මම ඇයට සුබ රාත්‍රියක් පතා මගේ කාමරයට ගොස් දොර වසා ගත්තෙමි.

''වට්ටක්කා තේ...?''

වැඩි වෙලාවක් ගත වෙන්නට පෙර මම ඇඳට නැග පොරවනය පොරවා ගත්තෙමි. නිදන කාමරයේ ජනේලය සුළඟට සෙලවෙන්නට වූ අතර සීතල සුළඟ කාමරයට හමා ආවේය.

මම දෑස පියාගෙන ගොවිපළ ගැන නොසිතා ඉන්නට උත්සහ කළෙමි. මම පොලී මාර්ටින්ගේ සාදය ගැනත්, ලූ ඇන් සහ මගේ මිතුරන් එහි ඇති කරන්නට යන උද්යෝගය ගැනත් සිතුවෙමි.

මොහොතකින් මම දෑස විවර කර අන්ධකාරය දෙස බැලුවෙමි. අවසානයේදී මම තද නින්දට වැටුණෙමි. මගේ දෑස් පියන් බර විය.

අවසානයේදී මා දුටුවේ නිදන කාමරයේ ජනෙල් වීදුරුවේ තැඹිලි පැහැති ආලෝකයක් පමණි.

::::::::::::::::::::::::::::::

පසුදින උදෑසන දීප්තිමත් හිරු එළිය ජනේලයෙන් කාමරයට ඇතුළු විය. එහි උණුසුම මුහුණ මත පතිත වූ සැණින් මම අවදි වූයෙමි.

රාත්‍රිය පුරාම මා දුටුවේ පඹයන් ගැන නරක සිහිනයකි. පඹයෝ අපේ නිවසට ඇතුළු වී සිටියහ. මගේ අම්මා, තාත්තා සහ සොයුරියෝ දෙදෙනා සිහිනයෙන් මාව ලුහුබඳිමින් සිටියහ. ඔවුහු මාව ගොවිපළ වෙතම පන්නාගෙන ගියහ. ගොවිපළේදී ඔවුහු

මම ශබ්ද නගා ඈනුමක් යැවුවෙමි. ඉන්පසු දෑත දිග හැර හිරි ඇරියෙමි.

හිරු එළිය සනීපවට මගේ මුහුණට දැනිණ. ''අද නම් හොඳ දවසක් වෙයි.'' මම මටම කියා ගතිමි.

''අද මම හොඳින් හැසිරෙන්න ඕන. මගේ සහෝදරියන්ට හොඳට සලකන්න ඕන. හොඳට විනෝද වෙන්න ඕන.''

මම සිනාවකින් මුහුණ සරසා ගෙන පොරවනය ඉවත් කර දෙපා බිම තැබුවෙමි.

**''ජජජජජජජජජජජජජජජජජජජජජජජජයා.''**

මගේ දෙපා බලාපොරොත්තු වූයේ සනකම් ලී පොළොව ය. නමුත් මගේ පය ගැටුණේ කිසියම් උණුසුම්, මිරිකී යන දෙයක ය.

මම පුදුමයෙන් පය එසවූයෙමි. ''ඔන්... ඊයා.''

මගේ පාදවල තැම්ලි සහ කහ පැහැති ඇලෙනසුළු දෙයක් තැවරී තිබිණ.

සෙමින් සෙමින් මම පහත බැලුවෙමි.

''ඔන්...''

මගේ දෙපා අසල බිම තිබුණේ තැම්ලි බැහැ රවුම් යමකි. එහි ගන්ධයෙන් මට එය හඳුනාගත හැකි විය.

වට්ටක්කා ද්‍රවයක්. ඇලෙන සුළු උකු වට්ටක්කා ද්‍රවයකි.

මම වට්ටක්කා ද්‍රවය දෙස බලා සිටියෙමි.

එය මෙතනට ආවේ කෙසේද...?

## 05

කවුරුන් හෝ මගේ ඇඳ අසල වට්ටක්කා ද්‍රවයක් තබා ගොස් ඇත. ඒ කවුරුන්ද...?

එය විහිළුවකි. මා එය මත අඩිය තබන බව කවුරුන් වුවද

Scanned by CamScanner

දැන සිට ඇත.

ඩේල් සහ ඩොලී එය සිදු නොකරන බව මම සිතුවෙමි. එය ඔවුන්ගේ ක්‍රමයේ විහිළුවක් නොවීය. ඔවුන්ගේ විහිළු මෝඩ පහේ විහිළු ය.

කවුරුන් හෝ රාත්‍රියේ මෙහි ඇතුළු වී මෙය තබා ගොස් තිබේ. නිවස තුළ එවන් යමක් කළ හැකි අයෙකුට සිටින්නේ කවුරුන්ද...?

මට සිතාගත නොහැකි විය. මම තැඹිලි පැහැති අඩි සලකුණු තබමින් නාන කාමරය වෙත ගියෙමි. ඉන්පසු විනාඩි පහක් පුරා මගේ පාදය සෝදා ගත්තෙමි.

මුළුතැන්ගෙයට යන අතර ද මා සිතුවේ වට්ටක්කා ද්‍රවය තිබූ කෙනා කවුරුන් විය හැකිද කියාය. නිවසේ මුළුතැන්ගෙය විශාල එකකි. එහි එක් බිත්තියක් අසල ගිනි උදුන ද දිග ලී මේස-යක් ද උදුනක් සහ ශීතකරණයක් ද තිබිණ.

ඩේල් සහ ඩොලී ඒ වනවිටත් මේසයට වාඩි වී සීරියල් දැමූ ලොකු බඳුන්වලට හැඳි දමාගෙන කමින් සිටියහ. බානස් නෝනා සෝදන බේසම අසල සිට මා වෙත හැරී සිනාසුණාය. "ඔයාට නින්ද ගියාද ඩේවින්...?"

මම හිස වැනුවෙමි. "ඔව්... ප්‍රශ්නයක් නැහැ."

"මම ඔයාට උදේ කන්න තම්බපු බිත්තරයි, බේකනුයි ලොකු පිගානක් ලෑස්ති කරලා තියෙන්නේ." ඇය පැවසුවාය. "ඔයා ගොවිපළේ වැඩ ගොඩක් කරනවානෙ."

මම නිවුන්නු දෙස විමසිලිමත්ව බැලුවෙමි. ඔවුහු සිටියේ එකිනෙකා වෙත කිරි ඉස ගනිමිනි.

බිමුතුරුණ මත වට්ටක්කා ද්‍රාවණයක් හැලුවේ ඔවුන් නොවන බව මට විශ්වාස ය.

සීයුස් ගිනි උදුන ඉදිරියේ වාඩි වී අප කත දෙස බලා සිටියේය. ඔහු මෙතෙක් මා දැක තිබූ විශාලම බළලා ය. අපේ හිටපු ස්පැනියල් වර්ගයේ බල්ලාටත් වඩා ඔහු විශාල ය. ඔහු නිහඬව අප දෙස බලා සිටියේය.

Scanned by CamScanner

උදේ කෑමෙන් පසු තාත්තා, ඩේල්, ඩොලී සහ මා වඩු මඩුවට ගෙන ගියේය. ඔහු අපට මිටි බංකුවක් ඉදිරියේ ගොඩ ගසා තිබූ කුඩා වට්ටක්කා රැසක් පෙන්විය.

''මම මේ පුංචි වට්ටක්කා ගෙඩි ටික මෙතනට ගෙනාවේ ඔයාලාට පාට කරන්න.'' ඔහු පැවසුවේය. අනතුරුව ඔහු අපට රතු, කළු සහ සුදු පැහැ තීන්ත පිරුණු බඳුන් සහිත මේසයක් පෙන්නුවේය. ''ඒවාගේ විහිළු මුහුණු අඳින්න. බය හිතෙන ඒවාත් අඳින්න... හිනාවෙන මුහුණුත් අඳින්න. ලස්සන මුහුණුත් අඳින්න.''

මම කුඩා වට්ටක්කා ගෙඩියක් ගෙන එය මගේ අතේ රෝල් කළෙමි. ''ඇයි අපි එහෙම කරන්නේ...?''

''මිනිස්සු කැමතියි හැදපු ජැක් ලන්තෑරුම් මිලදී ගන්න.'' පියා පැවසුවේය.

''මට තේරුණා.'' මම කීවෙමි.

ගැහැනු ළමයි ඒ වනවිටත් බංකුව මත වාඩි වී තීන්ත බඳුන් විවර කරමින් සිටියහ.

''ඔයාලා කැමති කැමති විදිහේ විකාර මුහුණු අඳින්න.'' පියා කීවේය. ''අපිට පුළුවන් ඒවා ඩොලර් දහය ගාණෙ විකුණන්න.''

ඩොලී රතු පැහැ තීන්ත බඳුන විවර කළාය. ඇය තීන්ත බුරුසුව එහි ඔබා ඩේල්ගේ මුහුණ පාට කරන්නට හැදුවාය. ඩේල් පසෙකට පැන්නාය.

''ඔහොම ඉන්න...'' ඩොලී කීවාය. ''මම ඔයාගේ තොල් රතු පාට කරන්නම්.''

''නවත්තගන්න.'' පියා කීවේය. ඔහු ඩොලීගේ වළලුකරින් අල්ලා ඇයව ඩේල් ගෙන් ඉවතට ඇද ගත්තේය. ''ඔයාලාව පාට කරගන්න එපා. ඔයාලාට දැනටමත් තියෙන්නේ විහිළු මුහුණු.''

''හා... හා...'' ඩොලී කීවාය. ''ඔයා විහිළුකාරයෙක්.'' ඇය අත නිදහස් කරගෙන රතු තීන්ත පියාගේ නළලතේ ගෑවාය.

ඔහු සිනාසුණේය. ඔහු සිතන්නේ නිවුන්නුන් කරන සියලුම දේ අපූරු දේවල් බව ය. ''වට්ටක්කා පාට කරන්න.'' ඔහු

Scanned by CamScanner

ඔවුන්ට කීවේය. "හිතට ගන්න. මේක ලොකු වැඩක්. සෙල්ලමක් නෙවෙයි."

ඔහු ආපසු නිවස වෙත ගියේය.

ගැහැනු ළමයි වට්ටක්කා ගෙඩි ඔඩොක්කු මත තබාගෙන පාට කරන්නට වූහ. ඩේල් නම් බුරුසුවෙන් ඇයගේ වට්ටක්කා ගෙඩියේ කළු පැහැති ලොකු රවුම් දෑසක් ඇන්දාය. ඩොලී ඇය අත වූ වට්ටක්කා ගෙඩිය සුදු පැහැයෙන් පාට කළාය. ඉන්පසු එහි රතු දෑසක් අඳින්නට වූවාය.

"නියමයි..." මම කීවෙමි. "ඔයාලා දෙන්නා හොඳ මුහුණු පාට කරන්නෙනෝ."

"මම ඔයාගේ මුහුණ පාට කරන්නද...?" ඩොලී ඇසුවාය. ඇයගේ බුරුසුව මගේ මුහුණට දිගු වී තිබිණ.

මම පසුපසට වීමි. "ඔයාට ඇහුණනේ තාත්තා කිව දේ. අපි මේක හොඳට කරන්න ඕන. මේක වැඩක්."

"මේ බලන්න... මම මගේ වට්ටක්කා ගෙඩිය පාට කරලත් ඉවරයි. ඔයාලා තවම පටන් අරගෙනත් නැහැ." ඩේල් තෙපලුවාය.

"හරි... හරි..." මම කහ පාට කුඩා වට්ටක්කා ගෙඩියක් අතට ගත්තෙමි. "මම මගේ සේරම වට්ටක්කා ගෙඩිවල මුහුණු අඳින්නේ ඔයාලා දෙන්නාගේ මුහුණු වගේ." මම පැවසුවෙමි.

ඩොලී ඇයගේ වට්ටක්කා ගෙඩිය මට පෙන්නුවාය. "මේක ඔයාගේ මුහුණ වගේමයි ඩෙවින්." ඇය පැවසුවාය. "දැක්කද...?"

"එහෙනම් බලමු කවුද විකාරම වට්ටක්කා ගෙඩිය පාට කරන්නේ කියලා...?"

මගේ එක් අතක කුඩා වට්ටක්කා ගෙඩියක් විය. මම අනිත් අතින් තීන්ත බුරුසුව ගත්තෙමි.

"ඒයි..." එක්වරම මට කෑ ගැස්සුණේ මට ශබ්දයක් ඇසුණු බැවිනි. එය ගෙරවීමක් බඳු විය. එය නැගුණේ වට්ටක්කා ගෙඩියෙනි.

වට්ටක්කා ගෙඩියේ සොත්ත මෘදු වන අන්දම මට දැනිණ. එය මිනිස් සමක් මෙන් මෘදු විය.

Scanned by CamScanner

"ඩෙවින්... මොකක්ද ප්‍රශ්නේ...?" තිවුන්නු දෑස් විසල් කරගෙන මදෙස බලා විමසූහ.

"මේ... මේ වට්ටක්කා ගෙඩිය." මම තෙපලුවෙමි. "ඒක... ඒක හරිම මෘදුයි... හරියට මිනිස් මුහුණක් වගේ. මට ඒකෙන් මොනවාහරි සද්දයක් ඇහෙනවා... ඒකට පණ තියෙනවා."

# 06

ගැහැනු ළමයි පුදුමයෙන් මදෙස බලා සිටියහ.

මට එය නැවතත් ඇසිණ. එය මෘදු ගෙරවීමකි.

මම වහා නැගිට්ටෙමි. මා අතින් වට්ටක්කා ගෙඩිය බිම වැටිණ. එපමණක් නොව මම මේසයේද හැපුණෙමි. එය පෙරළී ගියේ තීන්ත බඳුන් බිමට පෙරලා දමමිනි.

රතු, කළු සහ සුදු තීන්ත අපේ දෙපා අසල හැලිණ.

ගැහැනු ළමයින්ද වාඩි වී සිටි තැනින් නැගිට එහාට මෙහාට පැන ගත්හ.

"ඔයා සේරම විනාශ කළා." ඩේල් කෝපයෙන් කෑ ගැසුවාය.

"අපිට විනෝද වෙන්න තිබුණ අවස්ථාව." ඩොලී කීවාය.

"ඔයා ඒක නැති කළා."

"මොනවද මෙතන වෙන්නේ...?" පියා අප වෙත එමින් විමසුවේය. "මොනවද වුණේ තීන්තවලට...?" ඔහුගේ දෑස මා වෙත යොමු විය.

"මට සමාවෙන්න තාත්තා..." මම පැවසුවෙමි. "ඒත්... අර වට්ටක්කා ගෙඩිය... මම ගත්ත වට්ටක්කා ගෙඩිය පොත්ත මෘදු වෙලා මිනිස් මුහුණක් වගේ වුණා. අමුතු සද්දයක් ඇහුණා."

මම හුස්මක් කටක් නොගෙන කියා දැමුවෙමි.

Scanned by CamScanner

''මොන වට්ටක්කා ගෙඩියද...?'' පියා විමසුවේය.

මම එය පෙන්වූයෙමි. වට්ටක්කා ගෙඩිය රතු පැහැ තීන්ත පදාසය අසල කෙළවරක වැටී තිබිණ.

පියා නැමී එය අතට ගත්තේය. ඔහු ඇඟිලිවලින් එය අල්ලා බැලුවේය. මිරිකා බැලුවේය. ''මේක තදයි ඩෙවින්... වට්ටක්කා ගෙඩියක් වගේ තමයි.''

''ඒත් තාත්තා...''

ඔහු නැවතත් වට්ටක්කා ගෙඩිය මිරිකුවේය. ''මේකෙන් කිසිම සද්දයක් ඇහෙන්නේ නැහැ නේද...?''

''නැහැ.'' මම පැවසුවේ හිසද සොලවමිනි. ''මට සමා-වෙන්න. ඒත්...''

''ඩෙවින්... මෙහෙට එන්න.'' පියා මෘදුව පැවසුවේය. ඔහු මගේ උර වටා අත දමා මාව මඩුවේ අනිත් පසට ගෙන ගියේය. ''ඩෙවින්... අපි කතා කරමු.''

''ඔයා හිතන්නේ මම විහිළුවක් කරනවා කියලාද...?''

''ඔව්.'' ඔහු කීවේය. ''අපි කතා කරමු.''

''තීන්ත ගැන මට සමාවෙන්න.'' මම පැවසුවෙමි. ''ඒත් ඒ වට්ටක්කා ගෙඩිය මට ඇත්තටම අතට එහෙම දැනුණා.''

''ඩෙවින්... මම දන්නවා ඔයාට මේ ගොවිපළේ ඉන්න ඕන නැහැ කියලා. ඔයා අසතුටින් ඉන්නේ කියලා මම දන්නවා. ඒත් ඔයාගේ නරක හැසිරීම නිසා අනිත් අයත් කරදරයට පත් වෙනවා. මට ඕනේ ඔයා අපිට උදව් කරනවා දකින්න. ගැහැනු ළමයින්ට ඔයා මඟ පෙන්වන්න ඕන. එයාලාව බලා ගන්න ඕන. එයාලාව බය කරන්න එපා. එයාලාගේ වැඩ විනාශ කරන්න එපා.''

''මම දන්නවා... ඒත්...''

''ඔයා හිතන්නේ ඔයා කළුන්නේ හොඳ දෙයක් කියලාද...? ටික කාලයයි මෙහෙම ඉන්නේ වෙන්නේ.''

''ඔව් තාත්තා.'' මම පැවසුවෙමි. ''ප්‍රශ්නයක් නැහැ. මම මහන්සි වෙලා වැඩ කරන්නම්. මම පොරොන්දු වෙනවා.'' මම දිවුරන්නට මෙන් දකුණු අත එසවූයෙමි.

Scanned by CamScanner

මට දැනෙමින් තිබුණේ ඉතා නරක හැඟීමකි. මේ අත්-දමින් සියල්ල විනාශ කරන්නට මට ඇවසි වූයේ නැත.

"මම මෙහෙ ඉන්න කාලෙ සතුටින් ඉන්න උත්සහ කරනවා."

මම පියා පසුපසින් මඩුවේ අනිත් පසට ගියෙමි. ඒ වනවිට බානස් තෝනා ගැහැනු ළමුන්ට මේසය කෙලින් කර අලුත් තීන්ත බඳුන් ලබා දී තිබිණ.

අපි තිදෙනා නැවතත් කුඩා වට්ටක්කා මත මුහුණු ඇඳීම පටන් ගත්තෙමු. නිවුන්නු එයට දක්ෂයෝ වූහ. ඔවුහු විකාර මුහුණු ඇන්දහ. මා ඇන්දේ කළු සහ සුදු පැහැයෙන් කෝපයට පත් බිහිසුණු මුහුණු පමණි.

අපි තීන්තවලින් මුහුණු අඳින අතර ගැහැනු ළමයි ඔවුන්ගේ ජැක් ලන්තැරුම් ගීය නැවතත් ගායනා කරන්නට පටන් ගත්හ.

"ජැක්... ජැක්... ජැක් ලන්තැරුම
ජැක් ලන්තැරුමට පණ ඇවිල්ලා."

මම ඒ ගීය අප්‍රිය කළෙමි.

ඒ නිසා එය නවතන ලෙස ඉල්ලා සිටියෙමි. එවිට සිදු වූයේ කුමක්ද...? ඔවුහු පෙරටත් වඩා උස් හඬින් ගීය ගයන්නට වූහ.

මව පැමිණ ගැහැනු ළමුන්ව කැඳවා ගෙන ගියේ මාව සතුටට පත් කරමිනි. ඇයට ඔවුන්ව නගරයට ගෙන යාමට අවශ්‍ය විය.

මා ඒ වනවිටත් වට්ටක්කා ගෙඩි දොළහක් පාට කර තිබිණ. මා ඇන්දේ බිහිසුණු මුහුණු ය. මට කෙතරම් හොඳට වර්ණ ගැන්විය හැකිදැයි පෙන්වීමට මට අවශ්‍ය විය.

මා නිතරම ප්‍රිය කළ පන්තියක් වූයේ චිත්‍ර පන්තිය යි. මට මඳ හැකියාවක් ඇති බව මගේ චිත්‍ර ගුරුවරයා මට පවසා ඇත. මට හොඳින් චිත්‍ර ඇඳිය හැකි ය. වයස අවුරුදු පහ වන විට මා ඇඳි දිය සායම් සිතුවම් කිහිපයක්ම පාසලේ ශාලාවේ එල්ලා

තිබිණ.

මම හිස නමාගෙන දුක්බර සුදු පැහැ මුහුණක් අඳින විට මා වටා අන්ධකාරයක් පැතිරිණ.

ඒ සෙවනැල්ලක් මා මත පතිත වූ බැවිනි. එය විශාල සෙවනැල්ලකි.

මම හිස ඔසවා බැලුවෙමි. මා ඉදිරියේ සිටගෙන සිටියේ පිරිමි ළමයෙකි. ඔහු කලිසමක් සහ සුදු පැහැ කමිසයක් ඇඳ සිටියේය. හිස වෙනුවට ඔහුගේ උරහිස් මත වූයේ විශාල, රවුම් වට්ටක්කා ගෙඩියකි.

## 07

"මොනවා...?" මම පුදුමයෙන් පැවසුවෙමි.

මගේ දෑස වට්ටක්කා හිස වෙත යොමු විය. පිරිමි ළමයෙකුට වට්ටක්කා හිසක් ලැබුණේ කෙසේද...?

මට දැනුණේ මා බිහිසුණු චිත්‍රපටයක සිටින බවකි.

නමුත් වට්ටක්කා ගෙඩිය සෙලවෙන්නට විය. පිරිමි ළමයා එය තම මුහුණ ඉදිරියෙන් දෑතින්ම අල්ලාගෙන සිටි බව මට පැහැදිලි විය.

වාව්... මේ ගොවිපළේ සිටියොත් නම් මා උමතු වනවා නියත ය.

ඔහු සුදුමැලි පැහැති ළමයෙකි. ඔහුගේ කලිසම එල්ලා වැටෙන කලිසමකි. ඔහුගේ දුඹුරු පැහැ කෙස් වැටිය ද තළල වැසෙන සේ වැටී තිබිණ. අඳුරු දෑසක් සහිත ඔහු මා දෙස බලා සිනාසුණේය.

Scanned by CamScanner

මම වට්ටක්කා ගෙඩිය සමග නැවත සන්සුන් වූයෙමි. ''හායි...'' මම කතා කළෙමි. ''ඔයා... මාව බය කළා.''

''සමාවෙන්න.'' ඔහු කීවේ කොඳුරන්නාක් වැනි හඬකිනි. ඔහු තමා රැගෙන ආ විශාල වට්ටක්කා ගෙඩිය මට පෙන්නුවේය.

''මේ වට්ටක්කා ගෙඩිය... ගොඩක්ම හොඳ එකක්... ඉතින් මම ඒක අරගෙන ආවා. මට ඕනේ ඒක මගේ අම්මාට දෙන්න.''

මම ඇසිපිය සැලුවෙමි. ''ඔයාගේ අම්මාට...?''

ඔහු හිස වැනුවේය. අනතුරුව නළලට වැටී තිබූ කෙස් රොද පසුපසට කර ගත්තේය. නමුත් නැවතත් එය ඔහුගේ අඳුරු දෑස වැසෙන සේ පතිත විය.

''මම තමයි හේවුඩ් බානස්.'' ඔහු කීවේය. ''ඔයා දන්නවානෙ. බානස් නෝනාගේ පුතා.''

''ඔහ්... හායි...'' මම තෙපලුවෙමි. ''මම... දැනගෙන හිටියේ නැහැ. මම ඩෙවින් ඕ බැනොන්.''

''මම දන්නවා.'' ඔහු පිළිතුරු දුන්නේය. නැවතත් ඔහු මට සිනාසුණේය. ඔහුගේ මුවේ එක් පැත්තකට වඩා අනිත් පස උස්ව පිහිටියේය.

''මගේ අම්මා ඔයාගේ තාත්තා එක්ක කතා කරලා. මම ආවේ වට්ටක්කාවලටයි අනිත් වැඩවලටයි උදව් කරන්න. ඔයා දන්නවානෙ. වට්ටක්කා කඩන්න, ගෙනියන්න වගේම මෙහෙට එන පාරිභෝගිකයන්ට උදව් කරන්න.''

''හොඳයි.'' මම පැවසුවෙමි. ''හේයි... මට උදව්වක් ඕන තමයි. ගොවිපළක හැමදෙයක් ගැනම මම දන්නේ නැහැ.''

ඔහු මා අසලම බංකුවේ වාඩි වූයේය. අපි මඳ වෙලාවක් කතා කරමින් සිටියෙමු. මම ඔහුට මගේ පවුලේ අය ගැනත්, සියලු කතා කරමින් සිටියෙමු. මම ඔහුට මගේ පවුලේ අය ගැනත්, සියලු ශාන්තුවරයින්ගේ සැදෑව වෙනුවෙන් අප වට්ටක්කා ගොවිපළක සේවය කරන්නට හේතුවත් පැවසුවෙමි.

ඔහු කතා කරන අතර කලිසමේ දණහිස් පිරිමදිමින් සිටියේය. ඔහුගේ දෑත ඉතා දිග සහ සුදුමැලි බව මට දැකගත හැකි විය.

Scanned by CamScanner

ඔහු මට කීවේ ඔහුගේ මවගේ වට්ටක්කා කෑම වට්ටෝරු ගැන ය. එය ඔහුට සිනා උපදවන්නකි. ඇයට වට්ටක්කා මදවලින් ඕනම කෑමක් සැකසිය හැකි බව ඔහු පැවසීය. නමුත් ඒ සියල්ලගේම ආවේ එකම රසයකි.

අපි රෝස් කරන ලද වට්ටක්කා ඇට ගැන කතා කරමින් සිටියෙමු. මා ඒවාට කැමති ය.

"ඒවා හරිම රසයි." ඔහු කීවේය. "පොප්කෝන්වලටත් වඩා රසයි. ඇත්තමයි. ඔයා ඒවාට තෙල් ටිකක් දාලා උඳුනේ බදින්න. හරිම රස කෑමක්."

අප ඉදිරියේ සිටි කොළ පැහැ පණුවෙකුට කපුටෝ දෙදෙනෙක් පොර කමින් සිටියහ. එය අපට සිනා ගෙනෙන්නට සමත් විය.

මම පිරිමි ළමයාට ප්‍රිය කළෙමි. ඔහු සමග කතා කිරීම විනෝදයක් විය. මගේ වයසේ පිරිමි ළමයෙකු හමුවීමම සතුටුදායක දෙයකි.

සියුස් උසැති තණකොළ අතරින් එබී බැලුවේය. බළලාගේ දෙනෙත යොමු වී තිබුණේ කපුටන් වෙත ය. ඔහුගේ පිට වක්‍ර විය. ලොම් ඍජු විය. ඔහු සෙමින් සෙමින් කුරුමාණම් අල්ලමින් කපුටන් වෙත ආවේය.

කපුටෝ ඔහුව දැක්කහ. ඔවුහු කෑ ගසමින් බළලා පැමිණෙන්නට පෙර ඉවතට ඉගිල ගියහ.

හේවුඩ් සිනාසුණේය. "ගොවිපළේ බලන්න ගොඩක් දේවල් තියෙනවා."

"ඔයා කොහෙද ඉන්නේ...?" මම ඇසුවෙමි.

ඔහු වත්ත පහළට අත දිගු කළේය. "අර පැත්තේ. ඈත නෙවෙයි."

"ඔයාගේ අම්මා අපිත් එක්ක ගොවි ගෙදර ඉන්නේ." මම පැවසුවෙමි.

"ඔව්... මම තාත්තාත් එක්ක ගෙදරක ඉන්නේ."

මගේ පියා ගරාජයට යන අන්දම මට දක්නට ලැබිණ.

"ඔයාට මගේ තාත්තාව හමුවුණාද...? අර ඉන්නේ එයා." මම පැවසුවෙමි.

හේවුඩ් නැගිට්ටේය. "මම ගිහින් එයාට කතා කරන්නම්... පස්සේ හමුවෙමු." ඔහු දුවන්නට විය.

මම මා තීන්ත තවරමින් සිටි වට්ටක්කා ගෙඩිය අතට ගත්තෙමි. තීන්ත තවරන්නට තව ඉතිරිව තිබුණේ වට්ටක්කා ගෙඩි කිහිපයක් පමණි. මගේ පියා සතුටට පත්වනු ඇත.

බුරුසුව අතට ගත් මම මගේ සොයුරියන් දෙදෙනා ඇඳ තිබූ මුහුණු දෙස බැලුවෙමි. "මොනවා... මේක වෙන්න විදිහක් නැහැ."

මම දෙනෙත් විසල් කර තීන්ත තවරා තිබූ වට්ටක්කා දෙස බලා සිටියෙමි. ඒ සියල්ලම කැත අවතාර මුහුණු ය. ඇතැම් ඒවාට රතු පැහැ යක්ෂ දැස් තිබිණ. ඒවාගේ මුව දෙකෙළවරින් කොළ පැහැ කෙළ වැගිරෙමින් තිබිණ. ඇතැම් ඒවාගේ එක් ඇසක් පිටතට නෙරා තිබිණ. එක් වට්ටක්කා ගෙඩියක නාසයෙන් සහ මුවෙන් තැඹිලි පැහැති වමනය දියරක් වැක්කෙරෙමින් තිබිණ.

"මගේ නංගිලා කවදාවත් මේ වගේ කැත මුහුණු අඳින්නේ නැහැ."

මම දෙපයින් නැගිට ගත්තෙමි. ඉන්පසු එකින් එක වට්ටක්කා අතට ගෙන මුහුණු පරීක්ෂා කළෙමි.

කිසියම් අද්භූත දෙයක් සිදුවන බව මම දැන සිටියෙමි. නමුත් මෙය ඉතා භයානක ය. මේ වතාවේ මා සතුව සාක්ෂියක් ඇත.

මම ඒවා අතට ගත්තෙමි. හැකිතරම් කැත වට්ටක්කා අතට ගත්තෙමි. ඒවා මගේ පපුවට තද කරගෙන මම ගරාජය වෙත දිව ගියෙමි.

"තාත්තා... තාත්තා...." මම කෑ ගැසුවෙමි. "තාත්තා.. මේ බලන්න.. මම කිව්වා නේද ඔයාට මේ ගොවිපළේ අද්භූ දෙයක් සිද්ධ වෙනවා කියලා... තාත්තා... මගේ ගාව සාක්ෂිය තියෙනවා."

Scanned by CamScanner

# 08

"තා ත්තා... මට සාක්ෂියක් ලැබුණා. ඇවිත් මේක බලන්න. මෙතන මොනවාහරි වැරැද්දක් තියෙනවා. තාත්තා..."

පියා සිටියේ නැඹුරු වී කිසියම් වැඩක නිරතව ය. මට හේතුව දක්නට නොලැබිණ. ඔහු නිවසට යන්නට ඇතැයි මම අනුමාන කළෙමි.

පියා හැරී බැලුවේය. "ඩෙවින්... මේ වතාවේ මොකක්ද...? "

"මට සාක්ෂියක් ලැබුණා." මම කෑ ගැසුවෙමි. "මම ඔයාට කිව්වානෙ මෙහේ මොනවාහරි අද්භූත දෙයක් සිද්ධ වෙනවා කියලා. මේ බලන්න මේ වට්ටක්කා දිහා තාත්තා... මේවා දිහා බලන්න."

මම ඒවා ඔහු අතට දෙන්නට උත්සහ කළෙමි. නමුත් ඒවා මගේ අතින් බිම වැටී ගරාජයේ බිම දිගේ රෝල් විය.

"ඔහ්... සමාවෙන්න."

පියා හිස සොලවමින් දණ නමාගෙන වට්ටක්කා ගෙඩි අතට ගෙන බැලුවේය.

"දැක්කද...?" මම ඇසුවෙමි. "බලන්න ඒවා දිහා."

"මොකක්ද තියෙන වැරැද්ද...?" ඔහු ඇසුවේය.

"ඩේල් සහ ඩොලී මේවා පාට කළා වෙන්න බැහැ." මම පැවසුවෙමි.

ඔහු වට්ටක්කා ගෙඩි එකින් එක අතට ගෙන ඒවායේ මුහුණු දෙස බැලුවේය. "ඇයි බැරි...?" ඔහු විමසුවේය.

"මොනවා...?" මම ඇසුවේ ඔහු අසලට ළං වෙමිනි.

ඔහු වට්ටක්කා ගෙඩි දෙකක් මදෙසට හැරවූයේය. ඒවාගේ

Scanned by CamScanner

වූයේ සුන්දර සිනාසෙන මුහුණු ය.

ඔහු තවත් වට්ටක්කා ගෙඩි කිහිපයක් අතට ගත්තේය. ඒවාගේ රතු පැහැති එල්ලෙන දිවවල් සහ සිනාසෙන මුවවල් විය.

"ඒත්... ඒත්..." මම මිමිණුවෙමි.

"මේවා හරිම ලස්සනයි." පියා පැවසුවේය. "ඔයාගේ නංගිලා හොඳට වැඩේ කරලා තියෙනවා." ඔහු මා දෙස බලා දෑස පටු කළේය. "ඔයා මොනවා ගැනද කෑ ගැහුවේ...?"

"හොඳයි."

පියා හිස සොලවමින් රවා බැලුවේය. "ඩෙවින්... ඔයා මට පොරොන්දු වුණා. ඔයා පොරොන්දු වුණා මහත්සි වෙලා වැඩ කරනවා කියලා. දැන් ඔයා මේ ලස්සන පුංචි වට්ටක්කා ගෙඩි අරගෙන මෙතනට දුවගෙන ආවා."

"ඒත් තාත්තා... ඒවා ලස්සන නැහැ. ඒවා..."

තාත්තා සිනාසෙන මුහුණක් සහිත වට්ටක්කා ගෙඩියක් මගේ අතේ තැබුවේය. "මම ඔයාට අනතුරු අඟවනවා කොල්ලෝ." ඔහු කීවේය.

ඔහු 'කොල්ලෝ ' යැයි මා අමතන්නේ ඔහු සැබවින්ම කෝප වී සිටින විට ය.

"තව පාරක් ඔයා ඒ විදිහට හැසිරුණොත් ගෙදරට ගියාට පස්සෙත් ඔයාට ඉන්න වෙන්නේ දුරකතනයවත් නැතිව."

"දුරකතනය නැතිව...? තාත්තා... ඒක හරියට මගේ ඔක්සිජන් කපා හැරියා වගේ වැඩක්."

මා සිතුවේ ඉන් ඔහුට සිනා පහළ වනු ඇතැයි කියාය. නමුත් එය එසේ නොවීය. ඔහු නැගිට ගරාජයෙන් පිටතට ගියේය.

මම නොසෙල්වුණෙමි. මගේ දෑස යොමුව තිබුණේ ලස්සන කුඩා වට්ටක්කා ගෙඩි වෙත ය. මගේ මොළය අවුල් ජාලයක්ව තිබිණ.

මටම මේ දේවල් සිදුවනුයේ කුමක් නිසාදැයි මට සිතාගත නොහැකි විය.

මා ප්‍රවේසම් විය යුතු බව මම දැන සිටියෙමි. ඉදිරියට

පියා මා ගැන විමසිලිමත්ව සිටිනු ඇත. මා නැවත කරදරයක් ඇති කරනතුරු බලා සිටිනු ඇත.

ඔහු නපුරු පියෙකු නොවේ. නමුත් ඔහුගේ නරක පැත්තක් ද ඇත.

මා හුදෙකලාව නොමැති බව එක්වරම මට දැනිණ. මගේ ගෙල පිටුපසට කිසිවෙකුගේ බැල්මක ඉව දැනිණ. කිසිවෙකු මා දෙස බලා සිටින බව මට විශ්වාස ය.

ඒ හේවුඩ් ද...?

නැත.

හැරී බැලූ මට දක්නට ලැබුණේ ගරාජයේ දොර අසල සිට කළු පැහැ බළලා මා දෙස බලා සිටින බව ය. ඔහුගේ රැවුල් ගසක්වත් සෙලවුණේ නැත. සීතල කොළ පැහැ දෙනෙතින් බළලා මා දෙස බලා සිටියේය.

"සියුස්... මොකක්ද ප්‍රශ්නේ...?" මම ඇසුවෙමි.

බළලා සෙලවුණේ නැත.

කිසිවක් මගේ දණහිසේ වදිනු මට දැනිණ.

අනතුරුව යමක් බිම ගැටෙන හඬවල් ඇසෙන්නට විය.

මම බිය බැලුවෙමි. ඒ සමගම මට කෑ ගැස්සිණ.

කුඩා වට්ටක්කා ගෙඩි උඩ පනිමින් සිටියහ. ඒවා ටෙනිස් බෝල මෙන් කොන්ක්‍රීට් පොළොවේ උඩ පනිමින් තිබිණ.

**තඩ්... තඩ්... තඩ්... තඩ්... තඩ්...**

"වෙන්න බැහැ." මම කෑ ගසමින් දෙපයින් නැගිට්ටෙමි.

වට්ටක්කා මා වටා උඩ පනිමින් සිටියහ. ඒවාගේ මුහුණු මදෙස බලා සිනාසෙමින් තිබිණ.

මා බලා සිටියදීම එම මුහුණු අප්‍රසන්න මුහුණු බවට හැරිණ. අඳුරු පැහැ දෑස් රත් පැහැයට හැරිණ. තීන්තෙන් අඳින ලද මුවවල් ඇරෙන්නටත් වැහෙන්නටත් වූයේ **බබ්... බබ්... බබ්...** හඬක් නංවමිනි. එක් වට්ටක්කා ගෙඩියක් වමනය දමන්නට විය. විවර වූ මුවෙන් තැඹිලි පැහැ දියරයක් ගැලීය. ඒ සමගම අනිත් වට්ටක්කා ද වමනය කරන්නට වූහ.

Scanned by CamScanner

''ඒයා...'' මම කෑ ගැසුවෙමි. ''මේවා හරිම ජරාවක්.''

මගේ වදන් ඇසූ වට්ටක්කා ගෙඩි සිනාසුණහ. සීතල ලෙස සිනාසුණහ. ඔවුන් මා වටකරගෙන නගන අප්‍රසන්න සිනාවෙන් මගේ හිස පිරිණ.

බියෙන් වෙව්ලන්නට වූ මම දෑතින් කන් වසාගෙන නිවස වෙත දුවන්නට වීමි.

# 09

සියලු ශාන්තුවරයින්ගේ සැදැවට පෙර දින අළු පැහැති මීදුමෙන් බර සෙනසුරාදා දිනයේ අපි අපේ ගොවිපළ වේලාසනින්ම විවෘත කළෙමු. එදින කාර්යබහුල දිනයක් බව අපි දැන සිටියෙමු.

සිතූ අයුරින්ම විවිධාකාර වාහන ගොවිපළ වෙත ආවේය. කුඩා දරුවන් සහිත පවුල් පිටින් පැමිණ වගා බිමේ ඇවිද යමින් තමන්ට අවශ්‍ය වට්ටක්කා ගෙඩි තෝරා කඩා ගත්හ.

මගේ රාජකාරිය වූයේ පිවිසුම අසල මඩුවේ වාඩි ගෙන පොත්පත්වල රාජකාරි කිරීම ය. සෑම පවුලක්ම ගොවිපළට ඇතුළු වීමට ඩොලර් පහක ගාස්තුවක් ගෙවිය යුතු විය. මම මුදල් එකතු කරගෙන පියා විසින් නගරයෙන් ගෙනා ටිකට් පත් රෝලෙන් ටිකත් පත බැගින් නිකුත් කළෙමි.

මිනිසුන් ඔවුන්ගේ වට්ටක්කා ගෙඩි තෝරාගෙන ලී මඩුව වෙත පැමිණි විට මම ඒවා අලෙවි කළෙමි.

මම ඉතා සතුටින් මගේ කුඩා මඩුවේ රාජකාරි කළෙමි. වගා වට්ටක්කා ගෙඩිවලින් ඈත්ව සිටින්නට ඉඩ ලැබීම නිසා වගා

බිමේ සේවය කිරීමට නොලැබීම මට ප්‍රීතියක් විය.

අනිත් අතට එදින වැහි වලාකුළු ගහන අඳුරු දිනයක් විය. වැස්සක් ඇද හැලීම අත මානයේ ය. එනිසා මඩුව තුළ සිටීම වඩා සුවදායක විය.

මව මඩුවේ දොරකඩ අසල කුඩා තට්ටුවක් සාදාගෙන සිටියාය. එහි අප විසින් වර්ණ ගන්වන ලද වට්ටක්කා ගෙඩි තබා තිබිණ. එමෙන්ම බානස් නෝනා විසින් සකසන ලද වට්ටක්කා බටර් බඳුන් ද එහි විකිණීන. උදුන මතද අලුත්ම අලුත් වට්ටක්කා පුඩින් කිහිපයක් විය.

පුඩින්වල සුවඳ මා තුළ කුසගින්නක් ඇති කළේය. නමුත් කිසිවෙකු මගේ තැන ගන්නා තුරු මට යා නොහැකි බව මම දැන සිටියෙමි.

ඩේල් සහ ඩොලි සිටියේ පැමිණෙන අය හා වගා බිමේ ය. ඔවුහු දෙදෙනාම තැඹිලි පැහැ සායවල් සහ සිනාසෙන ජැක් ලන්තෑරුමක් සිතුවම් කරන ලද කළු පැහැ කමිස ඇඳ සිටියහ.

ඔවුන් 'ඕ බැනොන් ' ගොවිපළට පැමිණෙන්නන් පිළිගන්නා අය බව පියා ඔවුන්ට කියා තිබිණ.ඒ නිසා ඔවුහු වගා බිමේ දෙපස සිටගෙන ඔවුන් පසු කර යන අයට කෑ ගසා මෙසේ කීහ.

"හායි... කොහොමද අද දවස ඔයාලාට...?"

එම රාජකාරියට ප්‍රිය කළ ඔවුහු ඉන් වෙහෙසට පත් නොවූහ. හැමෝම ඔවුන් දෙදෙනාගේ හුරුබුහුටි පෙනුමට කැමති වූහ.

බොහෝ අය නතර වී ඔවුන් හා කතා කළහ. "ඔයාලා ඇත්තටම නිවුන්නුද...?" කුඩා ගැහැනු ළමයෙක් ඇසුවාය. එය මගේ සොයුරියන්ගේ සිනාවට හේතු විය.

ඇතැම් අය ගැහැනු ළමුන් දෙදෙනා සමග ඡායාරූප ගෙන තිබිණ.

එය තමි මගේ කණස්සල්ලට හේතු විය. අදින් පසු ඩොලී සහ ඩේල් තමන් ගැන ඉතා ඉහළින් සිතන බව නිසැක ය.

ඔවුන් තමන් **තාරකාවන්** බව සිතීමට පවා ඉඩ ඇත.

Scanned by CamScanner

වට්ටක්කා වැල් සහ මහත වට්ටක්කා කොළ අතරින් එන අය කැඳවාගෙන ගියහ. එමෙන්ම සුදුසු වට්ටක්කා ගෙඩි තෝරා ගැනීමට ද ඔවුහු ඔවුන්ට උපකාර කළහ.

ඇතැම් අවස්ථාවල ඔවුහු වට්ටක්කා ගෙඩි වැල්වලින් වෙන්කර දුන්හ. එමෙන්ම මගේ මඩුවට ඒවා ගෙන ඒමට ද ඔවුහු මිනිසුන්ට උදව් වූහ.

ඇතැම් පවුල් වට්ටක්කා ගෙඩි රැසක් ගෙන ගියහ. ඇතැම් අය ගෙන ගියේ එකකි. ඒ සියලු දෙනාම ගොවි බිමේ ඇවිද තමාගේ වට්ටක්කා ගෙඩි තමාම කඩා ගැනීමට ප්‍රිය කළහ.

දහවල් වන විට මුදල් රැසක් එකතු වී තිබිණ.

"මේක හොඳ අදහසක් වෙන්න ඕන." මම සිතුවෙමි. "සමහරවිට තාත්තා හරි ඇති."

සියල්ලම වැස්ස ඇද හැලෙන තුරු පමණි. අහස රාත්‍රියේ මෙන් අන්ධකාර විය. මඩුවේ ඉදිරිපස කොටස විවරව තිබූ නිසා මගේ මුහුණට ද සීතල වැහි බිඳු කිහිපයක් විසි විය.

එවිටම මවක් සහ පියෙක් ඔවුන්ගේ කුඩා පිරිමි ළමයා සමග මා ඉදිරියට පැමිණියේය. පියා විශාල වට්ටක්කා ගෙඩියක් මේසය මත තැබුවේය. "මේකේ පැත්තක් තැලිලා." ඔහු කීවේය. "මට මේකට වට්ටමක් දෙනවද...?"

මම වට්ටක්කා ගෙඩිය දෙස බැලුවෙමි. එහි ඇදක් පළුද්දක් මා දුටුවේ නැත.

නමුත් පියා පවසා තිබුණේ මට පාරිභෝගිකයන් සමග වාද නොකරන ලෙස ය.

"ඩොලරයක් අඩු කරන්නම්." මම කීවෙමි.

එය ඔහුගේ සතුටට හේතු විය. මිනිසා පසුම්බිය ගෙන මුදල ගෙව්වේය. ඉන්පසු තිදෙනා ඔවුන්ගේ කාරයේ නැග පිටව ගියහ.

"ඇයි ඔහු පැත්තක් තැලුණ වට්ටක්කා ගෙඩියක් අරගෙන ගියේ...?" මම පුදුම වූයෙමි. "ඒක එයාගේ තේරීමනේ."

Scanned by CamScanner

මට ඒ ගැන වැඩි වෙලාවක් සිත සිතා සිටින්නට නොහැකි විය.

මම එම මුදල් ද ලාච්චුවට දමා වැසුවෙමි. එවිටම මට කෑ ගැසීමක් ඇසිණ.

"උදව් කරන්න... අපිට උදව් කරන්න..."

ඒ ඩොලීගේ කටහඬ බව මට හඳුනාගත හැකි විය.

"කවුරුහරි අපිට උදව් කරන්න... වට්ටක්කාවලට පණ ඇවිල්ලා."

"ඒවාට පණ ඇවිල්ලා..." ඩේල් ද බියෙන් විලාප නැගුවාය.

"උදව් කරන්න... වට්ටක්කාවලට පණ ඇවිල්ලා."

"මම ඒක දැනගෙන හිටියා." මම මිමිණුවෙමි. "මම ඒක දැනගෙන හිටියා."

මම වහා ලාච්චුව වසා දමා මගේ සොහුරියන්ට උදව් කිරීමට දිව ගියෙමි.

# 10

"ඩොලී... ඩේල්..." මම ඔවුන්ගේ නම් කියා කෑ ගැසුවෙමි. "ඔයාලා හොඳින්ද...?"

ඒ වනවිට වැස්ස මඳක් වැඩිවී තිබිණ. මම හති දමමින් ඔවුන්ව සෙව්වෙමි. වට්ටක්කා කොළ මතට වැහි බිඳු වැටෙන හඬ මට ඇසිණ. මඳ මීදුමක් වගා බිමේ පැතිර තිබිණ. මිතිස්සු වහ වහා තම තමන්ගේ වාහන වෙත යමින් සිටියහ.

මට වගා බිමේ කෙළවරක සිටින නිවුන්නුන්ව දැකගත හැකි විය. ඔවුන් සිටියේ පේළියට තබන ලද විශාල වට්ටක්කා ගෙඩි තුනකට පිටුපසිනි. ඔවුන් වටා වූ විශාල වට්ටක්කා කොළ

Scanned by CamScanner

සුළඟට සෙලවෙමින් තිබිණ.

"මොකක්ද ප්‍රශ්නේ...?" මම කෑ ගසා ඇසුවෙමි. ඔවුන් අසලට දිව ගිය මගේ දෑස වට්ටක්කා ගෙඩි වෙත යොමු විය. "මොකද වුණේ...?"

ගැහැනු ළමයි දෙදෙනා සිනාසෙන්නට වූහ.

"වට්ටක්කා..." මම කීවෙමි. "මොකද වුණේ...? මොනවද ඔයාලා දැක්කේ...?"

"ඒක විහිළුවක්." ඩේල් කීවාය. ඇය සහ ඩොලී සිනාසෙන්නට වූහ.

"අපි දැනගෙන හිටියා ඔයා අපිව විශ්වාස කරනවා කියලා." ඩොලී තෙපලුවාය. "ඔයාට පිස්සු තමයි."

එය විහිළුවකි. මා රැවටී ඇත.

මට තරහා ගියේය. ඔවුන් ඉදිරියේ මා මෝඩයෙකු වී ඇත.

"කවුද කිව්වේ මට පිස්සු කියලා...?" මම ඇසුවෙමි.

"තාත්තා කිව්වේ." ඩේල් පිළිතුරු දුන්නාය. ඔවුන් දෙදෙනාගේම මුහුණුවල විසල් සිනාවන් විය.

"තාත්තා කිව්වද මට පිස්සු කියලා...? මම ඔයාලාව විශ්වාස කරන්නේ නැහැ."

"ඒක ඇත්ත." ඩොලී කීවාය. "එයා කිව්වා ඔයා මේ ගොවිපළට ආව දවසේ ඉඳලා ඔයා කරදරයක් කියලා."

"මොකක්ද මම කිව්වේ...?" පියා අප වෙත ආවේය. "කවුද කරදරේ...?"

"මුකුත් නැහැ." ඩොලී කීවාය. "කවුරුවත් නැහැ."

"අපි ඩෙවින්ට විහිළුවක් කළා." ඩේල් පැවසුවාය.

"හොඳයි... ඇයි ඔයාලා එයාට මේ වැස්සේ එළියට වෙලා විහිළු කළේ...?" පියා ඇසුවේය. "වැස්ස වැඩි වෙලා. යන්න... යන්න ඔයාලාගේ අම්මා එක්ක."

ඔහු තට්ටුව මත වූ දේවල් එක් කර රතු පැහැ කරත්තයකට පටවන මව පෙන්වා කීවේය.

ඉන්පසු පියා මා වෙත හැරුණේය. ඔහු මගේ උරහිසට

Scanned by CamScanner

පහරක් ගැසුවේය. ''අපිට අද හොඳ දවසක්. ඔයා හොඳට වැඩ කළා ඩෙවින්.''

මම ඔහු සමග මගේ මඩුව වෙත ගියෙමි. ඔහු ලාච්චුවේ වූ මුදල් රැගෙන නිවස වෙත යන්නට පිටත් විය. ''ඔයත් එනවද...?''

''ටිකකින් එන්නම්.'' මම කීවෙමි. මට ගසක් යටට වී සිටින හේවුඩ් දැකිය හැකි විය. ඔහු කළු පැහැති කුඩයක් ඉසලාගෙන සිටියේය. ඔහු බලා සිටියේ මා දෙස ය.

මව , පියා සහ නිවුන්නු කඩිනමින් ගොවි ගෙදර වෙත යන අන්දම මට පෙනිණ. මට පිටුපසින් වූ වට්ටක්කා කොළ මතට වැස්ස තදින් ඇද හැලෙමින් තිබිණ.

වට්ටක්කා ගෙඩිවල වූයේ කහ සහ අළු පැහැති එළියකි. වගා බිමෙන් පිටත වූ උසැති ගස් එහා මෙහා වැනෙමින් පැවතිණ.

මෙහේ හැම දෙයක්ම අමුතුයි. කිසිම දෙයක් සාමාන්‍ය විදිහට නැහැ.

මම හේවුඩ් වෙත ගියෙමි. ඔහු මට ද කුඩය ඇල්ලුවේය.

''මේ වැස්ස කොහෙන් එනවද දන්නේ නැහැ.'' ඔහු පැවසුවේය. ''අද දවස හරි හොඳට පටන් ගත්තා.'' ඔහුගේ මුහුණේ එක් පසෙක දුහුවිලි විය. ඔහුගේ කෙස් රොද එක් ඇසක් වැසෙන සේ මුහුණට වැටී තිබිණ.

''ඔයා මහන්සි වෙලා වැඩ කරලා.'' මම පැවසුවෙමි. ''මට නම් තිබුණේ ලේසි වැඩක්.''

ඔහු සිනාසුණේය. ''සමහරවිට ඔයාට ඕන ඇති වෙළෙන්දෙක් වෙන්න...?''

''නැහැ... මට එහෙම හිතෙන්නේ නැහැ.'' මම කීවේ සිනාසෙමිනි.

ඔහු ගොවිබිමට අත දිගු කළේය. ''හෙට සියලු ශාන්තුවරයින්ගේ සැඳෑවටත් තව වට්ටක්කා ගෙඩි ගොඩක් ඉතුරුයි. ඔයාගේ තාත්තා කිව්වා අදට වැඩිය මිනිස්සු හෙට එයි කියලා.''

සුළඟ විලාප නගමින් ගස් අතරින් හමා ගියේය.

වට්ටක්කා කොළ සෙලවුණේ අත්පුඩි ගසන ශබ්දය වැඩි කරමිනි.

"මට ඇහුණා ඔයාගේ නංගිලා කියනවා වට්ටක්කා ගෙඩිවලට පණ ඇවිත් කියලා." හේවුඩ් කීවේ එක්වරම බරපතල පෙනුමක් ආරූඪ කර ගනිමිනි. "සමහරවිට ඒක විහිළුවක් නොවෙන්නත් පුළුවන්."

"මොකක්ද කිව්වේ...?" මම ඇසුවෙමි. "මොනවා ගැනද ඔයා කතා කරන්නේ...?"

මගේ හදවත වේගයෙන් ගැහෙන්නට විය. ඇතැම් විට මට ගොවිපළේදී සිදුවන දේවල් ගැන ඔහු පැහැදිලි කරනු ඇත.

"ඔයා දන්නේ නැද්ද මේ තැන ගැන...?" ඔහු පවසන දේ වැස්සේ ශබ්දය නිසාම මට ඇසුණේ ඉතා සෙමිනි. එමෙන්ම ඔහුගේ කටහඬ කෙඳිරිල්ලකට හැරී තිබිණ.

මම හිස සෙලෙව්වෙමි. "මොනවා ගැනද...?"

ඔහු බොහෝ වෙලාවක් මා අධ්‍යනය කරන්නට මෙන් මා දෙස බලා සිටියේය. "සමහරවිට ඔයා ඒ ගැන අහන්න ඕන නැහැ ඩෙවින්... ඒක බය හිතෙන කතාවක්."

"මට කියන්න..." මම ඉල්ලා සිටියෙමි. "මට ඒක අහන්න ඕන. මම දැනගන්න ඕන මෙතන වෙන දේවල් ගැන."

"මාත් එක්ක එන්න." ඔහු මාව එදින මා දවස ගත කළ කුඩා මඩුව වෙත ගෙන ගියේය. එහි අප දෙදෙනාටම ඇති තරම් ඉඩ තිබිණ.

"හිතන්න පුළුවන්ද මෙතන කලින් තිබුණේ මොකක්ද කියලා...?" හේවුඩ් ඇසීය. ඒ වට්ටක්කා වගා බිම වෙත අත දිගු කරමිනි. "සොහොන් බිමක්."

මම කෙළ ගිල්ලෙමි. "ඇත්තටමද...?"

"ගොඩක් පරණ සොහොන් බිමක්..." ඔහු පැවසුවේය. "මගේ තාත්තා මට කිව්වා ඒක ඇති වුණේ යුද්දෙකට පස්සේ කියලා."

"වාව්..." මට කියැවිණ. "ඔයා කියන්නේ මේ පොළොව යට මැරුණ මිනිස්සු වළලලා ඉන්නවා කියලද...?"

Scanned by CamScanner

ඔහු හිස වැනුවේය. "ඔව්... දැක්කනෙ ඒක තමයි ප්‍රශ්නෙ. මේක අවුරුදු සිය ගණනකට කලින් තිබුණ සොහොන් බිමක්. ඊට පස්සේ ගොවියෙක් ඒක මිලදී ගෙන ගොවි බිමක් හදලා තියෙනවා."

මගේ මොළය කැරකෙන්නාක් මෙන් විය. මට එය වටහා ගත නොහැකි විය. "ඔයා කියන්නේ එයා සොහොන් බිම වගා බිමක් කළා කියලද...? මළ මිනී අයින් කරන්නේ නැතිව...?"

"ඔව්... එයා ඒවා අයින් කරලා නැහැ." හේවුඩ් මෘදු ලෙස පැවසුවේය.

අපි දෙදෙනාම ගොවි බිම දෙස මඳ වෙලාවක් බලා සිටියෙමු. මීදුම පොළොව මට්ටමින් ගලමින් තිබිණ. එය වට්ටක්කා ගෙඩි අතර කැරකෙමින් ගලා ගියේ පාවෙන අවතාර මෙනි.

"එයා මළ මිනී පොළොවෙම තියෙන්න ඇරලා." හේවුඩ් කියන්නට වූයේය. "ඊට උඩින් වගා කරලා."

මම කෙළ ගිල්ලෙමි. මගේ මුව නැවතත් වියළි විය. "එතකොට අපි මේ ඇවිදින්නේ මැරුණු අය උඩින්ද...?" මගේ කටහඬ වෙව්ලමින් තිබිණ.

හේවුඩ් හිස වැනුවේය. "ඒක නිසා තමයි මේ ගොවිපළ පටන් ගත්ත විදිහ ගැන කතන්දර තියෙන්නේ." ඔහු පැවසුවේය.

"කතන්දර...?"

"සමහරු කියනවා මෙහේ වළලපු අය ඉන්නේ අසතුටින් කියලා... මේකේ වළලපු අසරණ මිනිස්සුන්ට සොහොන් කොතක්වත් නැහැනෙ. ඒ නිසා එයාලා ඉන්නේ තරහෙන්."

මම ඔහු දෙස හොඳින් බැලුවෙමි. මම මේ කතාවට කොහෙත්ම කැමති නොවුණෙමි. නමුත් ඔහුව නතර කිරීමට ද මට අවශ්‍ය නොවීය.

"සමහර වෙලාවට මේ ගොවිපළේ අද්භූත දේවල් සිද්ධ වෙනවා." ඔහු දිගටම කියන්නට වූයේය. "බය හිතෙන දේවල්. පැහැදිලි කරලා කාටවත් කියන්න බැරි විදිහේ දේවල්."

"මම... මම දන්නේ නැහැ ඔයා කතා කරන්නේ මොනවා

Scanned by CamScanner

ගැනද කියලා.'' මම මිමිණුවෙමි.

''සමහරු කියනවා ඒ මැරුණු මිනිස්සු කියලා. එයාලා මොන තරම් අසතුටින්ද ඉන්නේ කියලා ඒ පෙන්නන විදිහලු.''

''මැරුණු මිනිස්සු...?'' මම එය පුනරුච්චාරණය කළෙමි. මගේ පිට හිරි වැටී යනු මට දැනිණ.

''මාත් එක්ක එන්න.'' හේවුඩ් පැවසුවේය. ''මම ඔයාට දෙයක් පෙන්නන්නම්.''

මම ඔහු සමග කුඩා මඩුවෙන් පිටතට ගියෙමි. ඒ වන විට වැස්ස තුරන් වෙමින් පැවතිණ. නමුත් මීදුම අප වටා සැරිසරමින් තිබිණ. එබැවින් අපට දැනුණේ වලාකුළක් තුළින් ගමන් කරන බවකි.

ඔහු මාව වට්ටක්කා වැල් අතරින් වගා බිමේ කෙළවරට කැඳවාගෙන ගියේය. මීයෙක් මගේ පාවහන් ඉදිරියෙන් පැන සෙලවෙන පත්‍ර අතර සැඟව ගියේය.

අපි නතර වූයෙමු. හේවුඩ් බිමට නැමුරු වූයේය. ඔහු මහත වට්ටක්කා වැලක තිබූ කොළ පැහැ පත්‍ර ඇද ගත්තේය. ''ඩේවිත්... මේ බලන්න.'' ඔහු පැවසුවේය.

ඔහු පත්‍ර එහා මෙහා කළ විට මට හොඳින් වට්ටක්කා වැල දැකගත හැකි විය. එම වැල මුල් ඇද තිබුණේ එතනිනි. එය වැල්ලේ මුල් ඇඳ තිබෙන අයුරු ද මට දැකිය හැකි විය.

''දැක්කද...? මේ වැල කෙළින්ම යටට මුල් ඇදලා තියෙන්නේ.'' හේවුඩ් පැවසුවේය. ''වැල කෙළින්ම ගිහින් තියෙන්නේ මළ මිනියකට. ඒක මුල් ඇදලා තියෙන්නේ මළ මිනිය උඩ.''

''මොනවා...?'' පුදුමය මගේ උගුරෙන් පිට විය.

''වැල මුල් ඇදලා තියෙන්නේ ඒ විදිහට.'' හේවුඩ් කීවේ වට්ටක්කා කොළ අල්ලාගත් ගමන්ම ය. ''සමහර මිනිස්සු කියනවා... සමහර මිනිස්සු කියනවා මැරුණු අයගේ කෝපය ඒ මුල් දිගේ... ඇවිත් වැල දිගේ උඩට එනවා කියලා. එයාලා වළලපු තැන්වල ඉඳන් එයාලාගේ කෝපය... වැල් දිගේ ඇවිත් ඇවිත්...

මෙ වට්ටක්කා ගෙඩිවලට එනවා කියලා.''

මම නිහඬව ඔහු දෙස බලා සිටියෙමි. නැවතත් මගේ පිට දිගේ හිරියක් පැතිර ගියේය.

මේ කතාව විකාරයක් ද...?

නැත්නම් එහි ගත යුත්තක් තිබේද...?

''ඔයා කියන්නේ මේ වට්ටක්කාවලට පණ තියෙනවා කියලද...?'' මම ඇසුවෙමි.

ඔහු නිහඬව හිස වැනුවේය. ''මෙ වට්ටක්කාවලට පණ තියෙනවා. මැරුණු මිනිස්සුන්ගේ කෝපයෙන් ඒවා පණ ලබලා තියෙන්නේ.''

''ඒත්... මෙක පිස්සුවක්.'' මම කීවෙමි.

හේවුඩ් උරහිස් හැකිලුවේය. ''ඔයාට ඕන නැත්නම් ඔයා ඒක විශ්වාස කරන්න එපා.''

''ඒත්... සමහර අද්භූත දේවල් මටත් වෙලා තියෙනවා.'' මම පැවසුවෙමි. ''ඔයා හිතන්නේ සමහරවිට...?''

''වෙන්න ඇති.'' ඔහු තෙපලුවේය. ''ඔයා කැමතිද මට ඒවා ගැන කියන්න...?''

මම ඔහු දෙස හොඳින් බැලුවෙමි. ''මම හිතන්නේ...?'' එවිටම මට දක්නට ලැබුණේ වට්ටක්කා ගෙඩියක් සෙලවෙන බව ය. එය අප දෙසට රෝල් වෙමින් පැමිණෙමින් තිබිණ. සත මිදුමේ පවා මට එය හොඳින් පෙනිණ.

මම හේවුඩ්ගේ උරහිසින් අල්ලා ගතිමි. ''ඔයාට අරක පේනවද...?'' මම ඇසුවෙමි. ''ඔයාට අර ඇවිදින වට්ටක්කා ගෙඩිය පේනවද...?''

ඔහු හිස සෙලවූයේය. ''මීදුම තද වැඩියි. ඔයාට විශ්වාසද...?''

මම මගේ දෑස වගා බිම වෙත යොමු කළෙමි. වට්ටක්කා ගෙඩි ගමන් කරන්නේ කොහේටද...? ඒවා ඔවුන්ගේ වැල්වලින් ගැලවී රෝල් වෙනවාද...?

Scanned by CamScanner

"දැන් මට විශ්වාස නැහැ." මම පැවසුවෙමි. "වැල්වල මුල් ඇදලා තියෙන මැරුණු මිනිස්සුන්ට වට්ටක්කා ගෙඩි එහා මෙහා ගෙනියන්න පුළුවන්ද...?"

"මම දන්නේ නැහැ." හේවුඩ් පිළිතුරු දුන්නේය. "මම කිවේ මම අහලා තියෙන කතාව. ඒ එක කතාවක් විතරයි. තව කතාවක් තියෙනවා එයාලා කියන්නේ ඒකට සොහොන් ස්වාමියාගේ කතාව කියලා."

ඔහු එය පවසන විට මුළු වගා බිමම ගසා ගෙන යන තරම් වේගවත් සුළඟක් හමා ගියේය. මීදුම වැල් අතර ඇඩිව පැටලිණ. වට්ටක්කා ගෙඩි මිහිදුමේ නොපෙනී ගියේය.

"එයාලා කියනවා මැරුණු අය අතර ඉන්න වැඩියෙන්ම කෝපයෙන් ඉන්න කෙනාලු ඒ." හේවුඩ් කෙඳිරුවේය. "එයාගේ කෝපය වැල් දිගේ ඇවිත් වට්ටක්කා ගෙඩිවලට එකතු වෙලාලු. ටික කාලයක් ගියාම එයා එයාගේ හැඩය මාරු කර ගන්න විදිහ ඉගෙන ගත්තාලු."

"මට... මට තේරෙන්නේ නැහැ." මම කිවෙමි. "එයාගේ හැඩය මාරු කරගත්තා....?"

"වට්ටක්කා ගෙඩියක් ඇතුළට රිංගා ගත්තාම එයාට පුළුවන්ලු වෙන හැඩයක් ගන්න. වෙන සිරුරක් ගන්න. එයාට පුළුවන්ලු මිනිහෙක් හරි සතෙක් හරි වගේ වෙන්න. ඊට පස්සේ එයා ආපසු වට්ටක්කා ගෙඩියක හැඩයම ගන්නවා. එතකොට එයාව හොයා ගන්න බැහැ. එයාට තියෙන්නේ බලගතු ශක්තියක්. ඒක සියලු ශාන්තුවරයින්ගේ සැදෑව ළං වෙද්දි වැඩි වෙනවා."

"උත්... වාව්." මම ඒ ගැන සිතන්නට විමි. මේ සියල්ල මගේ මොළයට දරා ගැනීම අපහසු ය.

"එයාට කියන්නේ සොහොන් ස්වාමියා කියලා." හේවුඩ් නැවතත් පැවසුවේය. "ඒත් එයා එයාගේ කෝපය අරගෙන යන ඕනතැනකට යනවා. එයාට ඕන එකම එක දෙයක් විතරයි. එයාට ඕන මිනිස්සු බය කරලා එලවලා දාන්න..."

හේවුඩ් කතාව නතර කළේය. ඔහු එම වාක්‍යය අවසන්

කළේ නැත. ඔහුගේ මුව විවර වූයේ ඕ අකුර පවසන්නට මෙනි.

මම ඔහු ගේ දෙනෙත යොමු ව ඇති දෙසට දෑස් හෙළුවෙමි. ඔහු බලා සිටියේ ගොවි බිම දෙස ය. ගොවි බිම ඝන මීදුමෙන් වැසී තිබිණ.

මීදුම වලාකුළු අතරින් මට කළු පැහැති යමක් දැකිය හැකි විය.

මීදුම කැරලි කැරලි ලෙස පාව ගියේ අළු සහ සුදු පැහැති සර්පයින් මෙනි. හේවුඩ් දෑස් විදා බලා සිටි අන්ධකාර දෙය අපට හොඳින් පෙනෙන්නට විය.

ඒ කළු පැහැති බළලෙකි. එනම් සීයුස් ය.

සීයුස් ගොවි බිමේ කෙළවරක වාඩි වී සිටියේය. උගේ ඇස් දිදුලමින් තිබිණ. ඒ අපව අධ්‍යනය කරන්නට මෙනි.

හේවුඩ් මගේ අතින් අල්ලා ගත්තේය. ඔහුගේ මුහුණේ ඇති බිය මට දැකගත හැකි විය.

''අර... අර... බළලා...'' ඔහු මිමිණුවේය. ''එයා කොච්චර වෙලාවක ඉඳන්ද එතන ඉඳගෙන ඉන්නේ...? එයාට අපි කතා කරන ඒවා ඇහුණද...?''

ප්‍රශ්නයට පිළිතුරක් දෙන්නට මෙන් බළලා කෑ ගැසුවේය.

මාව පුදුමයට පත් කරමින් හේවුඩ් කුඩය බිම දමා මීදුම අතරින් දුවන්නට වූයේය. මොහොතක් ගත වෙන්නට පෙර ඔහු නොපෙනී ගියේය.

## 11

රාත්‍රී ආහාර වෙලාවෙහි පියා සිටියේ උද්දයෝගයෙනි. ඔහු ගැරප්පුව සහ පිහිය ගෙන මේසයට තට්ටු කරමින් මෙසේ කීවේය. ''අපූරු දවසක්... මොන තරම් අපූරු දවසක්ද...?''

මව ඔහුගේ අත අල්ලා ගත්තාය. "සන්සුන් වෙන්න ඇලන්... ඔයාගේ මූණ රතු වෙලා."

"මට සන්සුන් වෙන්න බැහැ. දැක්කා නේද ඒ මිනිස්සු...? අපි අද දවසට ඩොලර් දාහක් හොයා ගත්තා."

"ඒ කියන්නේ මට අලුත් ඇමරිකානු බෝනික්කෙක් ගන්න පුළුවන් කියන එකද...?" ඩේල් විමසුවාය.

"මටත්...?" ඩොලී ඇසුවාය.

මව සහ පියා සිනාසුණහ.

"ආත්මාර්ථකාමී වෙන්න එපා." මව දොස් කීවාය. "මේ සල්ලි අපේ පවුලට ලැබුණු ඒවා."

"ඩේල් සහ මම ඉන්නෙත් ඒ පවුලෙම තමා." ඩොලී තෙපලුවාය.

"අපූරු දවසක්." පියා දහවන වතාවටත් කීවේය. "වැස්සත් නතර වෙලා. හෙට දවස මීට වඩා හොඳ වෙයි. අපි හැම වට්ටක්කා ගෙඩියක්ම විකුණන්න ඕන. වැල් සේරම වට්ටක්කා ගෙඩිවලින් හිස් කරන්න ඕන."

සර්පයන් මෙන් එහා මෙහා විහිදුණු, වට්ටක්කා ගෙඩි රහිත වැල් සහිත වගා බිම මගේ සිතෙහි සිතුවම් විය. මම වෙව්ලා ගියෙමි.

"ඔය ගැහැනු ළමයි අපූරුයි." පියා පැවසුවේය. ඔහු රෝස් කරන ලද අර්තාපල් හැන්දක් බෙදාගෙන බඳුන මවට දුන්නේය. "ඔයාලා හොඳ පිළිගන්නියෝ."

"යේ..." නිවුන්නු ප්‍රීතිඝෝෂා කළහ.

"හරි විනෝදයි." ඩොලී කීවාය. "පුංචි බලු පැටියෙක් අතුරුදහන් වුණා ඇරෙන්න."

මව සහ පියා පුදුම වූහ. පියා ආහාර ගැනීම නතර කළේය. "පුංචි බලු පැටියෙක්...?"

ගැහැනු ළමයි හිස් වැනූහ. "ඔයාලා ඒක දැක්කේ නැද්ද...?" ඩේල් ඇසුවාය. "මිනිස්සු වගයක් එයාලාගේ කළු පාට පුංචි බලු පැටියා අරගෙන ආවා... එයා අතුරුදහන් වුණා."

Scanned by CamScanner

''එයා පැනලා ගිහින්.'' ඩොලි තෙපලුවාය. ''එයා පැනලා ගිහින් වට්ටක්කා කොළ අස්සේ හැංගිලා.''

''මට ඒක මඟ ඇරුණා.'' මව කීවාය.

''ඔයාලාට ඇහුණේ නැද්ද මිනිස්සු කෑ ගැහුවා චිචි... චිචි කියලා...?'' ඩොලි විමසුවාය. ''ඒක තමයි ඒ බල්ලාගේ නම. චිචී...''

''ඊට පස්සේ මොකද වුණේ...?'' පියා විමසුවාය. ''එයාලා එයාව හොයා ගත්තාද...?''

''ඩේල් හොයා ගත්තා.'' ඩොලී කීවාය. ''එයා අපිට පිටිපස්සේ ඉඳලා තියෙන්නේ. එයා වට්ටක්කා කෑල්ලක් වගේ දෙයක් හපා හපා හිටියේ.''

''එහෙනම් ඒ කතාව සතුටුදායක විදිහට ඉවර වුණා.'' පියා කිවේය. නැවතත් ඔහු ආහාර ගන්නට පටන් ගත්තේය.

''ඒ මනුස්සයා ඩොලීටයි, මටයි ඩොලරය ගාණෙ දුන්නා බලු පැටියා හොයලා දුන්නට.'' ඩේල් පැවසුවේ ආඩම්බරයෙනි.

''ඩොලරය ගාණෙ...? ඔයාලා මොනවද ඒ සල්ලිවලට කරන්නේ...?'' මව විමසුවාය.

''ඔයාලාට ඒක දෙන්නේ නැහැ. අපි ඒ සල්ලි ඉතුරු කරගන්නවා.'' ඩොලී තෙපලුවාය.

''හොඳ වැඩක්.'' මම පැවසුවෙමි.

පියා මා වෙත හැරුණේය. ''ඔයත් හොඳට වැඩ කළා ඔයාගේ පුංචි මඩුවට වෙලා. ඔයා විනෝද වුණාද...?''

''ඇත්තටම නැහැ.'' මම පැවසුවෙමි.

ඔහු සුසුම් හෙලුවේය.

''මම දන්නවා... මම දන්නවා... මම එහෙම කිව්ව එක වැරදියි කියලා. ඒත් මට තියෙනවා ඔයාට කියන්න මට අහන්න ලැබුණු දෙයක් ගැන.''

හේවුඩ් විසින් මට පවසන ලද ගොවිපලේ සොහොන් බිම ගැනත්, මළ ගිය කෝපාන්විත මිනිසුන් ගැනත් කතාව මවට සහ පියාට පවසන්නට මම සිතුවෙමි. නමුත් එය කෑම මේසයක පැවසිය යුතු කතාවක්දැයි මට නිශ්චය කරගත නොහැකි විය.

Scanned by CamScanner

නමුත් මට වැඩි වෙලාවක් එය සිතෙහි සිර කර තබා ගත නොහැකි විය.

පියා බෝංචි කන්නට පටන් ගත්තේය. ඔහු මගේ හිස් පිඟාන දුටුවේය. ''ඩෙවින්... කොහොමද ඔයා නොකා ඉන්නේ...?''

''මට කියන්න ඕන ඔයාලාට මට අහන්න ලැබුණු දෙයක් ගැන. ඒක මේ ගොවිපළ ගැන දෙයක්.'' මම තෙපලුවෙමි. ''ඔයා දන්නවාද කලින් මේක සොහොන් පිටියක් කියලා...?''

මව පුදුමයට පත් හඬක් නැගුවේය. ''මොකක්ද...? සො-හොන් පිටියක්...?''

ඩොලී මා දෙස හොඳින් බැලුවාය. ''ඔයා කිව්වේ මළමිනී තිබුණු තැනක් කියලද...?''

''ඔව්.'' මම කීවෙමි. ''මෙතන පරණ සොහොන් පිටියක් තිබ්බිලා තියෙනවා. හරියටම වට්ටක්කා වගා බිම තිබුණ තරියේ.''

''ඒක පිස්සු කතාවක්. කොහෙන්ද ඔයාට ඒක අහන්න ලැබුණේ...?'' පියා විමසුවේය. මා පිළිතුරක් දෙන්නට පෙර බානස් නෝනා මුළුතැන්ගෙහි දොර අසලට ළඟා වූවාය. ඇය අතේ බඩු මලු දෙකක් විය. පියා නැගිට බඩු මලු ඇය අතින් ගෙන මේසයක් මත තැබුවේය.

''මේ ගොවිපළ ඉස්සර සොහොන් බිමක්ද...?'' ඔහු ඇය ගෙන් විමසුවේය.

බානස් නෝනා කිහිප වතාවක්ම නොනවත්වා ඇසි පිය සැලුවාය. ඇය තම ෆැනල් කමිසය පිරිමැද ගත්තාය. ''ඒ ගැන එක එක විදිහේ කතන්දර තියෙනවා.'' ඇය තෙපලුවාය. ''ඔයාලා ඒවා විශ්වාස කරන එකක් නැහැ.''

''හේවුඩ් මට ඒ ගැන කිව්වා.'' මම පැවසුවෙමි.

ඇය සිනාසුණාය. ''මම කිව්වා වගේම ඔයාලාට ඒ කතා විශ්වාස කරන්න බැහැ. මගේ කොල්ලා අද්භූත වගේම පුදුමාකාර විදිහට හිතන්නේ. එයා හොඳ දරුවෙක්. ඒත් එයා ජීවත් වෙන්නේ මවාගත්ත ලෝකෙක. අපි දන්න කියන ලෝකෙ නෙවෙයි.''

පියා නැවතත් මුළුතැන්ගෙහි මේසයට වාඩි වූයේය.

බානස් නෝනා බඩු මලු අස් කරන්නට වූවාය.

"කියන්න..." මම කීවාය. "මොකක්ද ඒ කතාව...? ගැහැනු ළමයි බය වෙන විදිහේ කතාවක්ද...?"

"අපිව බය කරන්න කාටවත් බැහැ." ඩොලී කියා සිටිය-ාය.

මම මේසය වටා නෙත් යොමු කළෙමි. සියලු දෙනාම මා දෙස බලා සිටියහ. නමුත් ඒ කිසිවෙකුත් මාව විශ්වාස නොකරන බව මම දැන සිටියෙමි.

බානස් නෝනා නිවැරදි ය. එය කිසියම් විදිහක විකාර මවාගත් කතාවකි.

මළ මිනිසුන්ට ඔවුන්ගේ කෝපය වට්ටක්කා වැල් දිගේ යැවිය නොහැක. වසර සිය ගණනකට පෙර මළ මිනිසුන්ගේ සිරුරුවල මුල් ඇද වට්ටක්කා ගෙඩිවලට පණ ලබා ගත නොහැක. එමෙන්ම මළ පුද්ගලයෙකුට තම හැඩය වෙනස් කරමින් වෙන අයෙකුගේ රූපය ලබා ගත නොහැක.

කළු බළලා...?

මම දෑස බිමට යොමු කළෙමි. සීයූස් මා සිතූ පරිද්දෙන්ම මගේ පුටුව අසල විය. බළලා මා දෙස බලා සිටියේ මගේ කතන්දරය අවසන් කරන තුරු මෙනි.

නැත. එය එසේ විය නොහැක. මේ සියල්ලම පිස්සුවකි.

නමුත් සීයූම් වගා බිමේ සිට අප දෙස බලා සිටින විට හේවුඩ් බිය වූයේ කුමක් නිසාද...? ඔහු ඒ අයුරින් පලා ගියේ කුමක් නිසාද...?

එය ඔහුගේ රඟපෑමක්ද...?

"මම ඔයාලාට පස්සේ ඒ කතාව කියන්නම්." මම තෙපලුවෙමි. "ඒක විකාර කතාවක්."

නමුත් ඉදිරියට සිදු වන දේ තව තවත් විකාර දේවල් වනු ඇතැයි මා දැන සිටියේ නැත.

Scanned by CamScanner

# 12

රැකෑමෙන් පසු මම ගැහැනු ළමුන් සමග රූපවාහිනිය නැරඹුයෙමි. එහි විකාශනය වූයේ තම පියා සමග සිරුරු මාරු වන පිරිමි ළමයෙකු ගැන විහිළු චිත්‍රපටියකි. ගැහැනු ළමයි එයට කැමති වූහ.

ගොවි ගෙදරට අන්තර්ජාල පහසුකම් තිබුණේ නැත. ඒ නිසා මගේ ලැප් ටොප් පරිගණකයෙන් ප්‍රයෝජනයක් නොවිණ. මගේ මිතුරන් සමග අන්තර්ජා සම්බන්ධතා පවත්වා ගැනීමටද මට හැකි වූයේ නැත.

"දැන් ඔයාලා ඇඳන්වලට යන්න." මම පැවසුවාය. "හෙට වැඩ ගොඩක් තියෙන දවසක්. හෙට තමයි සියලු ශාන්තුවරයින්ගේ දවස."

නිවුන්නු ඔවුන්ගේ කාමර වෙත ගියහ. මට වෙනෙසක් නොදැනුණද මම ද මගේ කාමරයට ගියෙමි. ඉන්පසු නවකතා පොතක් කියවන්නට වීමි. ඒ පොත පොළොවේ වූ සියලුම නගර විනාශ වීම ගැන කතාවකි.

සියල්ල විනාශ වූ පසු පොළොවේ ඉතිරි වන්නේ එකම එක පවුලක් පමණි. ඒ බව දැනගන්නා එම පවුලේ උදවිය බොහෝ අසතුටට පත් වෙති.

පොළොවේ ඉතිරි වන එකම පවුල මගේ පවුලේ අය යැයි සිතා බැලුවහොත්...? එය ඉතා බිහිසුණු කතාවකි.

පොත කියවමින් සිටි මට වෙලාව ගත වෙනු දැනුණේ නැත. මගේ කාමරයේ ඔරලෝසුවක් නොවීය. පුස් ගඳ සහිත ඇඳක්, අල්මාරියක් හැර අන් කිසිවක් මගේ කාමරයේ තිබුණේ නැත.

නමුත් මගේ ඇස් පිහාටු ගල් එල්ලූ කලෙක මෙන් බර

Scanned by CamScanner

විය. මට ඇනුම් පිට ඇනුම් යන්නට විය. එවිට මට නිදාගන්නට වෙලාව බව සිහිපත් වේ.

මම පසුදිනය ගැන කල්පනා කළෙමි. පියා නැවතත් මට මුදල් සම්බන්ධ කටයුතු භාරදෙනු ඇතැයි මම සිතුවෙමි. කුඩා මඩුව තුළ මා ආරක්ෂාකාරී ය.

මම පිජාමා ඇඳුම මාරු කර ගත්තෙමි. එය මකුළු මිනිසා සිතුවම් කරන ලද පිජාමා ඇඳුමකි. මගේ තාත්තාගේ අදහස් විටෙක විකාර ය. මා සුපරි වීරයෙකු නොවන බව ඔහු දනී. නමුත් එම ඇඳුම උණුසුම් ය.

මම සිවිලිමේ වූ විදුලි පහන නිවා ඇඳට නැග පොරවනය නිකට දක්වාම පොරවා ගතිමි. කොට්ටය මෘදු වුවද එහි ඇති පිහාටු මගේ හිසට දැනිණ.

රිදී සඳ කිරණ ජනේලයෙන් කාමරයට ගලා විත් මගේ යහන මත පතිත විය. ජනේලය විවරව ඇති බව මට වැටහිණ. ජනෙල් තිර රෙදි සෙමින් දෙපසට වැනෙමින් තිබිණ.

වැස්ස ඒ වනවිටත් නතරව තිබිණ. නමුත් ගස්වලින් වැටෙන වැහි බිඳුවල ශබ්දය මට ඇසිණ. සුළඟ දිවා කාලයේ හැමුවාට වඩා උණුසුම් සහගතව කාමරය තුළට හමා ආවේය.

මම නින්ද එන තුරා ජනේලය දෙස බලා සිටියෙමි.

කිසිවක් සෙලවෙන අන්දම මට පෙනිණ. පිටත කිසිවක් සෙලවෙමින් තිබිණ.

රිදී සඳ එළියෙන් මට ජනේලය අසල සෙවනැලි දැකිය හැකි විය. කිසිවක් ඉහළ නැග යළි පහත වැටිණ.

මම ඇසිපිය සලමින් වහා වාඩි වූයෙමි. ඉන්පසු ජනේලය දෙස හොඳින් බලා සිටියෙමි.

නැවතත් සෙවනැල්ලක් තිර රෙදි අතරින් ඉහළ නගින අන්දම මට පෙනිණ. එය කෙලින්ම ඉහළ නැංගේය. දඟරයක් මෙන් ඉහළ නැගිණ.

එහි එක් කෙළවරක් උල් ය. ඒ සර්පයෙකු නොවේ. නැත. සර්පයෙකු නොවේ. සර්පයෙකුට වඩා එය විශාල ය.

Scanned by CamScanner

එය ජනේලය අසල දෙපසට වැනෙමින් තිබිණ. කෙමෙන් කෙමෙන් එය දෙපසට වැනෙමින් ජනේලයට ළඟා විය.

අනතුරුව එය ජනෙල් පඩිය මත රැඳිණ.

මම එය හඳුනා ගත්තෙමි. එය කුමක්දැයි මම දැන සිටියෙමි.

මට එය විශ්වාස කළ නොහැකි විය. නමුත් මට එය පැහැදිලිව දැකගත හැකි විය.

ඒ වට්ටක්කා වැලකි.

එය මගේ කාමරයට ඇතුළු වෙමින් තිබිණ.

ඔව්. එය මා වෙත තිහඬව ඇදෙමින් තිබිණ.

මම කතා කර ගත නොහැකිව විස්මයෙන් මෙන්ම භීතියෙන් ඒ දෙස බලා සිටියෙමි. ඔව්. දෙවන වට්ටක්කා වැලත් පැමිණෙන්නට විය. එය මහත, ඝනකම් වැලකි.

එය ද පළමු වැල මෙන්ම ඉහළ නැග්ගේය. ඒ දඟර ගැසෙමින් එතෙමින් ඉහළ නැගුණේය.

ඉන්පසු ඒවා යොමු වන්නට වූයේ එකම දිශාවකට ය. ඒ මගේ කාමරයට ය.

සුදුමැලි සඳ එළියේ මඳ ආලෝකයෙන් මට ඒවා ජනෙල් පඩිය මතින් ලිස්සා මගේ ඇඳ වෙත... මා වෙත පැමිණෙන අන්දම දැකගත හැකි විය.

# 13

මම උදව් ඉල්ලා කෑ ගසන්නට මුව විවර කළෙමි. නමුත් ඉන් කිසිම හඬක් පිට වූයේ නැත.

අනිත් අතට මගේ දෙමව්පියන්ගේ කාමරය ඇත්තේ සාලයේ එහා කෙළවර ය. මා කෑ ගැසුවද ඔවුන්ට මගේ කෑ ගැසීම ඇසෙන්නේ නැත.

Scanned by CamScanner

ඔවුන් මාව විශ්වාස කරන්නේද නැත. ඔවුන්ගේ කාමරයට දිව ගොස් මා ඔවුන්ව මෙහි කැඳවාගෙන ආවොත් සිදුවන දේ මම දැන සිටියෙමි. වට්ටක්කා වැල් අතුරුදහන්ව තිබෙනු ඇත.

එවිට මා පියාගේ කෝපයට ලක් වේ. මා මෙම ගොවිපළේ වාසය කිරීමට අකැමති නිසා මා එසේ කරන්නට ඇතැයි ඔහු සිතනු ඇත.

මව සහ පියා මෙය විශ්වාස කිරීමට කිසිදු විදිහක් නැත.

මම ඇඳේ කෙළවරක් තදින් අල්ලා ගතිමි. ඉන්පසු වට්ටක්කා වැල් දෙක එනෙමින් දඟර ගැසෙමින් මගේ කාමරයට පිවිසෙන අන්දම බලා සිටියෙමි.

තිර රෙදි වේගයෙන් සැලුණේ අනවසරයෙන් පිවිසෙන්නන් පලවා හරින්නට මෙනි. සඳ එළිය විදුලි පහනක ආලෝකයක් මෙන් දීප්තිමත් විය.

මම ඇඳෙන් බිමට බැස්සෙමි. සීතල ලෑලි පොළොවේ පහස මගේ දෙපයට හොඳින් දැනිණ. මගේ මුළු සිරුරම තිබුණේ වෙව්ලමිනි.

මෙය බිහිසුණු චිත්‍රපටයක මෙනි. වෙනසකට තිබුණේ එය සැබවින්ම සිදුවීම ය. මටම සිදුවීම ය.

මා කිසිවක් කළ යුතු බව මම දැන සිටියෙමි. මා සිටිංය් තනිවම ය. මගේ උදව්වට කිසිවෙකුත් නොවිය. ඩෙවින් ඕ බැනොන් වට්ටක්කා වැල් සතුන්ට පහර දිය යුතු ය.

''යන්න ඩෙවින්... යන්න ඩෙවින්...''

මම දිගු හුස්මක් ගත්තෙමි.

ඉන්පසු මම ඉදිරියට යන්නට වීමි. ජනේලය වෙත ගමන් කරන්නට වීමි. මගේ හදවත මගේ පපුව තුළ වේගයෙන් ගැහෙමින් තිබිණ.

මම හුස්ම අල්ලාගෙන ජනේලය වෙත ළඟා වීමි. ඉන්පසු දෑතින්ම ජනෙල් පියන්වල උඩ කෙළවරවල් අල්ලා ගත්තෙමි. අනතුරුව හැකි තරම් වෙර යොදා පියන් වැසුවෙමි.

ජනෙල් පියන් වේගයෙන් වැල්වල වැදී වැසිණ.

ඒවා කෙඳිරි ගාන්නට විය. එය අප්‍රසන්න ශබ්දයකි.

ලී රාමුවේ ගැටුණු වැල් ලිස්සා යන හඬ අනතුරුව නැගිණ. **ස්ලිලිලිලිලිලිලිලිෂ්.**

ජනෙල් රාමුවට අසු වූ කොටස දෙකට කැඩී ගොසිනි.

මගේ නිදන කාමරයේ පොළොව මතට කාමරය තුළ වූ වැල් කැබලි දෙක වැටිණ. ඒවා බිම වැටුණු පසු යළි සෙලවුණේ නැත.

අවසානයේදී මම නැවතත් සැනසීමෙන් ආශ්වාස කළෙමි. මම දෙපා අසල වැටී ඇති වැල් කැබලි දෙක දෙස බලා සිටියෙමි. නැවත නැවතත් හොඳින් ආශ්වාස කළෙමි.

එවිටම ජනෙල් වීදුරුවට තට්ටු කරන හඬක් නැගුණු නිසා මම හිස ඔසවා බැලුවෙමි.

මට දක්නට ලැබුණේ මා බියපත් කරන දසුනකි. කැපුණු වැල් දෙක ඔවුන්ගේ කැපී ගිය විවරයන් ගෙන් අඳුරු පැහැ දියරයක් වගුරමින් සිටියහ. එම විවරයන් ගෙන් වැගිරුණේ අඳුරු, ඝනකම දියරයකි. එය රුධිරයට සමාන විය.

මා බලා සිටින විට ඒ වැල් වීදුරුවට පහර දෙන්නට වූහ. පසුපසට වෙමින් ඉදිරියට පනිමින් වීදුරුවට පහර දුන්හ. නැවත නැවතත් නොනවත්වාම පහර දීම සිදු විය. ජනෙල් වීදුරුව බිඳෙනතුරු එම පහරදීම නොනවතිනු ඇත.

**"එපාාාාාාාා."** මම විලාප නැගුවෙමි.

මම ජනේලය අසලට දිව්වෙමි.

"යනවා යන්න... දැන්ම යනවා යන්න." මම කෑ ගැසුවෙමි. "යනවා ඒ අතරම ජනෙල් වීදුරුවට දැතින්ම පහර දුන්නෙමි. "යනවා යන්න... යනවා... යනවා..."

මම හති දමමින්, කෑ ගසමින් ජනෙල් වීදුරුවට පහර දෙන අතර එහා පස සිටි වැල් ද ජනේලයට පහර දීම නොනවත්වාම කළහ. "මෙතනින් යනවා යන්න... යනවා යන්න."

උමතුවෙන් මෙන් සිදු කරන පහර දීම අතරම විලාප නැගීම ද මම නතර නොකළෙමි.

Scanned by CamScanner

''යනවා යන්න.'' මම කෑ ගැසුවෙමි.

# 14

වැඩි වෙලාවක් ගත වෙන්නට පෙර මගේ නිදන කාමරයේ දොර වහා විවර විය. මගේ පියා කාමරයට කඩා වැදුණේය.

''ඩෙවින්...? මොනවද මෙතන වෙන්නේ...? මට ඇහුණා ඔයා කෑ ගහනවා. ඇයි ඔයා ජනේලය ළඟ ඉන්නේ...?''

''තාත්තා... අර... අර වැල්.'' මම කෑ ගැසුවෙමි. ''මෙහෙ එන්න... ඉක්මනින් එන්න. මේ බලන්න.'' මම ජනේලයෙන් පිටත පෙන්නුවෙමි. ''අර වැල්...''

ඔහු මා බලන දෙස බැලුවේය. නමුත් ඒ වනවිටත් ජනේලය අසල හිස් ය. ජනෙල් විදුරුව සුදු පැහැ සුදුමැලි සඳ එළියෙන් ආලෝකමත්ව තිබිණ.

අන් කිසිවක් එහි නොවිය.

''වැල්...?'' පියා ඇසුවේ දෑස් පටු කර මා දෙස බලමිනි. ''ඩෙවින්... ඔයා රෑ හීනයක් දැක්කද...?''

''නැහැ තාත්තා...'' මම කීවෙමි. ''මම නිදාගෙන නෙවෙයි හිටියේ. වට්ටක්කා වැල් දඟර ගැහි ගැහී මගේ කාමරයට ආවා. මම හොඳටම බය වුණා. මම...''

තාත්තා ජනේලය අසල බිම ට නෙත් යොමු කළේය. ඔහු සිවිලිමේ විදුලි පහන දැල්වූයේය. ඉන්පසු බරට අඩි තබමින් ජනේලය අසලට ආවේය.

ඉන්පසු නැමී බිම තිබූ වට්ටක්කා වැල් කැබලි දෙක අතට ගත්තේය. ඒ මා ජනේලය වහන විට කැඩී ගිය කෙළවරවල් ය. ඔහු ඒවා ඔසවා හොඳින් පරීක්ෂා කළේය.

''දැක්කද...?'' මම කෑ ගැසුවෙමි. ''සාක්ෂි තාත්තා... මේ

වැල් තමයි මගේ ජනේලයෙන් ඇතුළට ආවේ... දැක්කද...? මම කියන්නේ ඇත්ත."

පියා මා දෙසට හැරුණේ වැල් කැබලි අතින් රැගෙනම ය. "කොහොමද මේවා මෙහෙට ආවේ ඩෙවින්...?"

"මම ඒවා කපලා දැම්මා...? මම ඒවා කපලා දැම්මා ජනෙල් පියන වහලා."

"ඒත් කොහොමද ඒවා ඔයාගේ කාමරයට ආවේ...? මේක ඔයාගේ නංගිලා ඔයාට කරපු තවත් විහිළුවක් නේද...?"

"නැහැ... තාත්තා. විහිළුවක් නෙවෙයි. ඔයාට මාව විශ්වාස නැද්ද...? මේක සාක්ෂියක්. වට්ටක්කා වැල් දෙකක් පහත ඉඳන් උඩට ඇවිත් ජනේලයෙන් ඇතුළට එන්න හැදුවා."

"ඒත් ඩෙවින්..." පියා පැවසුවේය. "මෙහෙ එන්න."

මම ජනේලය අසලට ගමන් කළෙමි. ඔහු ඔහුගේ අත මගේ උරහිස මත තැබුවේය. "බලන්න අර එළිය." ඔහු මාව ජනේලය වෙත හරවමින් කීවේය. "බලන්න අර තණගොල්ල දිහා. ඒවාට හඳ එළිය වැටිලා දවල් කාලේ වගේම එළියයි. ඔයාට වට්ටක්කා වැල් පේනවද ඒ හරියේ...?"

මම ගෙවත්ත දෙස බැලුවෙමි. වට්ටක්කා වැල් පෙනෙන තෙක් මානයක නොවීය.

මට තණගොල්ලේ වැටී ඇති සවලක් දැකිය හැකි විය. ගරාජය අසලම තිවුන්තුන්ගේ බයිසිකල් තබා තිබිණ. එවිටම මට දක්නට ලැබුණේ බළලා ය.

සීයුස් තණගොල්ලේ වාඩි වී මගේ ජනේලය දෙස බලා සිටියේ ය. කළු බළලා වටා රිදී පැහැ සඳ එළිය පතිතව තිබූ අතර උගේ කොළ පැහැ දෑස දිදුලමින් තිබිණ. ඌ සිටියේ ජනේලය දෙස බලාගෙන ය. මා දෙස බලාගෙන ය.

"තාත්තා." මම කෙඳිරුවෙමි. "අර බළලා අද්භූතයි."

පියා වීදුරුවට මුහුණ තද කර පහත බැලුවේය. "ඔව්... ඔයා හරි... ඒ බළලා කවදාවත් නිදාගන්නේ නැහැ. හරි අද්භූත බළලෙක්."

''තාත්තා... ඔයා විශ්වාස කරන්නේ නැද්ද මැරුණු මිනිස්සු මැරුණට පස්සේ වෙන කෙනෙක්ගේ ස්වරූපයක් ගන්නවා කියලා...? මම කියන්නේ බළලෙක්ගේ වගේ...?''

ඔහු සිනාසෙමින් හිස සෙලෙව්වේය. ''කොහෙන්ද ඔයා මේ විකාර කතා ඇහුවේ ඩෙවින්... ඇත්තටම මට හිතෙනවා වෙලාවකට ඔයා ආවේ වෙන ග්‍රහලෝකෙකින් ද කියලා...?''

ඔහු වැල් කැබලි දෙක බිමට විසි කළේය. ඉන්පසු මාව ආපසු ඇඳට කැඳවාගෙන ගියේය.

''එතකොට ඔයා විශ්වාස කරන්නේ නැද්ද වට්ටක්කා වැල් දෙකක් ජනේලයෙන් මගේ කාමරය ඇතුළට එන්න හැදුවා කියලා...?''

''කොහෙත්ම නැහැ.'' ඔහු පැවසුවේය. ඔහු මට පොරවනය ද පෙරවූයේය. ''ඊළඟට ඔයා කියයි ගොවි බිමේ තියෙන වට්ටක්කා ගෙඩි උඩ පැන පැන පෙරලි පෙරලි ඇවිත් ඔයාව අල්ලා ගන්න හැදුවා කියලා.''

''හොඳ විහිළුව.'' මම මිමිණුවෙමි.

''නිදාගන්න.'' ඔහු කීවේය. ඉන්පසු මගේ කම්මුල්වලට තට්ටු කළේය. ''හැමදේම හරි යයි. ඩෙවින්... අපි හොඳට වැඩ ටික කරන්න ඕන. ඔයා විනෝදයෙන් ඉන්න.''

විනෝදයෙන් ඉන්න...?

ඔහු විදුලි පහන නිවා දමා කාමරයෙන් පිටව ගියේය.

''මම තනිවුණා.'' මම සිතුවෙමි.

''මේ ගොවිපළේ භයානක දෙයක් සිද්ධ වෙනවා කිලා දන්න එකම කෙනා මම විතරයි. ඒ නිසා ඒ වෙනුවෙන් මොනවාහරි දෙයක් කරන්න පුළුවන් එකම කෙනාත් මමයි.''

මට හේවුඩ් සමග කතා කළ හැකිය. මෙහි සිදුවන දේ විශ්වාස කරන අනිත් එකම පුද්ගලයා ඔහු විය. සමහරවිට ඔහු මට උදව් කරනු ඇත.

සොහොන් ස්වාමියා ගැන හේවුඩ් දැන සිටියේය. ඔහු සීයුස් ට ද බිය ය. ඇතැම් විට සොහොන් ස්වාමියා, කළු බළලා

Scanned by CamScanner

විය හැකි ය.

අද්භූත යමක් සිදුවන හැම අවස්ථාවකම එහි සීයුස් සිටියේය. බළලා නිතරම සිදුවන හැමදෙයක්ම බලාගෙන සිටි යේය.

ඔහු වට්ටක්කා වගාවේ කෝපාන්විත ශක්තිය පාලනය කරනවා විය හැකි ය. ඔහු වට්ටක්කා වැල්, වට්ටක්කා ගෙඩි සහ සෑම දෙයක්ම පාලනය කරනවා විය හැකි ය.

ඔහුට අවශ්‍ය කුමක්ද...? අපව බිය කර පලවා හැර සාම-දානයෙන් සැතපීම ද...?

හෙට දිනයට එනම් සියලු ශාන්තුවරයින්ගේ දිනයට ද ඔහු කිසියම් බියකරු යමක් සැලසුම් කරනවා විය හැකිද...?

මට සිහින් ශබ්දයක් ඇසිණ. තවත් එවැනිම ශබ්දයක් ඇසිණ.

මම ඇඳ මත වාඩි වූයෙමි. වාඩි වී ජනේලය දෙස බැලුවෙමි. ජනෙල් වීදුරුව හිස් ය.

මම දෑස බිමට යොමු කළෙමි. දුටු දෙයින් මට කෑ ගැස-'සිණ.

වට්ටක්කා වැල් කැබලි දෙක විශ්වාස කළ නොහැකි අන්දමින් මගේ ඇඳ වෙත ළඟා වෙමින් සිටියහ.

ඒවා විශාල පණුවන් මෙන් මා වෙත ඇදිණ. නිහඬවම කාමරය හරහා ඇදී ආවේය.

**"නෑෑෑෑෑෑෑෑෑෑෑෑෑෑෑෑ."** කෝපාන්විත හඬක් මගේ මුවින් නිකුත් විය.

වැඩිදුර නොසිතාම මම වට්ටක්කා වැල් කැබලි වෙත දිව ගියෙමි.

ඉන්පසු දෙපයින් ඒවා පාගන්නට වීමි.

"මැරෙන්න... මැරෙන්න... මැරෙන්න..." ඒ අතරම මම කෑ ගැසුවෙමි.

වට්ටක්කා වැල් මගේ දෙපාවලට පෑගී මිරිකිණ. ඒවාගේ උණුසුම සහ තෙත මගේ පාදවලට දැනිණ.

Scanned by CamScanner

''මැරෙන්න... මැරෙන්න... මැරෙන්න...''

මම කෑ ගසමින් ඒවා පෑගුවෙමි. පල්පයක් වන තුරුම පාගා පොඩි කර දැමුවෙමි.

හුස්ම ගැනීමට හැකි වූ සැනින් මා කළේ මගේ නිදන කාමරයේ බිම ඇති කොළ සහ කහ පැහැති පල්පය දෙස බැලීම ය.

මම නැඹුරු වී දණහිස් මත දෑත් තබාගෙන ආශ්වාස කළෙමි.

අද මට එය පරාජය කිරීමට හැකි විය.

නමුත් හෙට දිනය කෙසේ වේවිද...?

# 15

''හේවුඩ්... මට ඔයා එක්ක කතා කරන්න ඕන...'' මම ඔහුව මඩුවේ කෙළවරකට කැඳවාගෙන ගියෙමි.

මව වට්ටක්කා පුඩින් තබා ගත් මේසය අසල සිටියාය. නිවුන්නුන් සිටියේ ගොවිපළ විවෘත කළ පසු මිනිසුන්ව පිළිග න්නා ආකාරය ගැන තර්ක කරමිනි. පියා ගොවි බිමේ ඇවිද යමින් මිනිසුන්ට ගෙන යාමට ඇති තරම් වට්ටක්කා ගෙඩි තිබේදැයි පිරික්සමින් සිටියේය.

එය වලාකුළු පිරි උදෑසනක් විය. පෙර දින රැයේ වට මීදුම නිසා පොළව තෙතබරිත විය.

''මේක බරපතල දෙයක්.'' මම හේවුඩ්ට පැවසීමි. ''මට ඇත්තටම උදව් ඕන.''

ඔහු වටපිට බැලුවේය. ඔහුගේ දෑසට මගේ පියාව හසු

විය. "මට දැන් මේ ගැන කතා කරන්න බැහැ. මම අද දවසම මෙතන වැඩ කරන්න ඕන. මට ඕන නැහැ ප්‍රශ්නයක් ඇති කර ගන්න."

"මම මගේ තාත්තා ගෙන් ඉල්ලුවා අද මට මඩුවේ වැඩ කරන්න දෙන්න කියලා." මම කීවෙමි. මට කොහෙත්ම ඕන නැහැ අද වගා බිමේ වැඩ කරන්න. අර වැල්..."

"ඩෙවින්... ඇවිත් මට උදව් කරන්න." පියා කෑ ගසා කතා කළේය. ඔහු මා වෙත අත වනන අන්දම මම දුටුවෙමි.

මම දිගු හුස්මක් ගත්තෙමි. මා පෙර දින රැයේ පවා සිතමින් සිටියේ වට්ටක්කා වැල් ගැන ය. මා ඒවා ගැන නොසිතා සිටින්නේ කෙසේද...?

"ඩෙවින්... ඉක්මන් කරන්න." පියා කෑ ගැසීය.

"මේ එනවා." මම වගා බිමට දුවන්නට වීමි. ඒ අතර මහත වට්ටක්කා වැලකට උඩින් පැන්නෙමි. මා දුවන අතර මගේ පාදවල මහත වට්ටක්කා කොළ ගැවිණ.

එවිටම වගා බිමේ කෙළවරක සිටින දෙයක් වෙත මගේ ඇස යොමු විය. ඒ කළු බළලා ය. සියුස් නිතරම සියලුම දේ ගැන බලා සිටියේය.

බලාගෙන.... බලාගෙන සිටියේය.

මගේ පිට දිගේ හිරියක් පැතිරිණ. මේ බළලා නම් යක්ෂයෙකි. නමුත් එය සහතික කළ හැකි සාක්ෂියක් මට නැත.

"තාත්තා... අද මට මඩුවේ වැඩ කරන්න බැරිද...?" මම ඇසුවෙමි.

"බැහැ." පියා කීවේය. "මේ හේවුඩ්ගේ වාරේ... අර වට්ටක්කා ගෙඩි ළඟට යන්න... ඒවා වටේ තියෙන කොළ අයින් කරලා මිනිස්සුන්ට පේන විදිහට තියන්න."

"හොඳයි..." මම මිමිණුවෙමි.

"මේ සියලු ශාන්තුවරයින්ගේ දවස කියලා ඔයාට අමතක වුණාද...?" පියා ඇසුවේය. "අපේ වැදගත්ම දවස. මට අද ඔයා ගෙන් ලොකු උදව්වක් ඕන ඩෙවින්."

Scanned by CamScanner

''කිසි ප්‍රශ්නයක් නැහැ.'' බළලා වෙතම දෑස යොමාගෙන මම පිළිතුරු දුන්නෙමි.

පියා ඉක්මන් ගමනින් තවත් වට්ටක්කා පේළියක් වෙත ගියේය. මම නැමී ඝනකම් පත්‍ර අතර සැඟව තිබූ වට්ටක්කා ගෙඩිය පිටතට ගත්තෙමි. පෙර දින රැයේ ශීතකරණයේ තැබූ කලෙක මෙන් වට්ටක්කා ගෙඩිය සීතල ය.

මම නැවතත් වෙව්ලන්නට වීමි.

එවිටම මට කෙඳිරීමක් ඇසිණ. එය මෘදු කෙඳිරියකි. එය සුළඟේ හඬ නොවීය.

මම නැගිට සවන් දුන්නෙමි. කොළ පැහැති මහත වට්ටක්කා කොළ සෙලවෙමින් තිබිණ. නැවතත් කෙඳිරිය නැගිණ.

ඒ කෙඳිරියෙන් කියැවුණේ මගේ නම ය.

එය මා මවා ගත්තක් නොවේ. මට මගේ නම පවසනු පැහැදිලිව ඇසිණ. එය නැගුණේ අත්පුඩි ගසන සහ සෙලවෙන පත්‍ර අතර ඇති වට්ටක්කා වැල්වලිනි.

**''ඩෙව්විවිවිවිවිවිවින්........ ඩෙව්විවිවිවිවිවින්..........''**

''කවුද කොඳුරන්නේ...?'' මම කෑ ගැසුවෙමි. ''කවුද මෙතන ඉන්නේ...?''

**''ඩෙව්විවිවිවිවිවිවින්........ ඩෙව්විවිවිවිවිවින්..........''**

කටහඬවල් මා වටා පැතිර ගියේය. මා වටකර පැතිරිණ. කොඳුරන හඬ වඩා පැහැදිලිව ඇසිණ. ද

''තාත්තා... ඔයාට ඒක ඇහෙනවද...?'' මම කෑ ගැසුවෙමි. ''ඔයාට ඒ කොඳුරන ශබ්දේ ඇහෙනවද...? තාත්තා...?''

ඒ වනවිටත් ඔහු සිටියේ බොහෝ ඈත ය. ඔහු ආපසු හැරී බැලුවේ නැත.

මම බියෙන් ගල් ගැසී බලා සිටියෙමි. මා වටා වූයේ අප්‍රසන්න දිග වැල්වල දැවටුණු සීතලම සීතල වට්ටක්කා ගෙඩි ය.

**''ඩෙව්විවිවිවිවිවිවින්........ ඩෙව්විවිවිවිවිවින්..........''**

Scanned by CamScanner

# 16

වාහන බොහෝ ප්‍රමාණයක් ගොවිපළට පැමිණියේය. පවුල් පිටින් පැමිණ අවසාන මිනිත්තුවේත් වට්ටක්කා ගෙඩි මිලට ගත්හ.

මට තෝරා ගැනීමක් නොවිණ. කෙඳිරිලි හඬ ඇසෙද්දී මට අපේ පාරිභෝගිකයන්ට උදව් කිරීමට සිදු විය. අපට විශාල පාරිභෝගිකයන් සංඛ්‍යාවක් සිටි බැවින් මට හුස්ම ගැනීමටවත් වෙලාවක් නැති විය.

මම මවගේ මේසය වෙත ගියෙමි. ඇය ඒ වනවිටත් පාට කරන ලද මුහුණු සහිත කුඩා වට්ටක්කා ගෙඩි සියල්ලම විකුණා තිබිණ. වට්ටක්කා පුඩිත් බඳුන් ද අවසන් විය. තවත් ඉතිරිව තිබුණේ වට්ටක්කා බටර් බෝතල් කිහිපයක් පමණි.

තිවුන්නු ද පැමිණෙන අය හා කතා කරමින්, ඔවුන්ව පිළිග නිමින්, හිනස්සමින් විනෝදමත් කාලයක් ගත කරමින් සිටියහ.

පියා පැමිණෙන අය වට්ටක්කා වැල් අතරින් ඉතිරිව තිබූ වට්ටක්කා ගෙඩි වෙත කැඳවාගෙන ගියේය.

මා හැර හැමෝම හොඳින් විනෝද වූහ. මට පමණක් සැනසුමක් නොවීය. මගේ සිරුරේ සෑම මස් පිඩුවක්ම ආතතියෙන් පිරී තිබිණ.

මා බලා සිටියේ ඊළඟට කුමක් සිදුවනු ඇතිද කියා ය. කෙඳිරිලි හඬවල් නතර වී තිබිණ. එහි තේරුම කෝපයට පත් වැල් සහ වට්ටක්කා ගෙඩි ඔවුන්ගේ ඊළඟ බිහිසුණු ක්‍රියාදාමයට සූදානම් වන බව ද...?

මම පාරිභෝගිකයන්ගේ වට්ටක්කා ගෙඩි ඔසවාගෙන ගොවි බිම පුරා ඇවිද ගියෙමි. මගේ දෙපා යට මළ මිනිසුන් සිටින බව මට අමතක නැත. ඔවුන්ගේ සොහොන් මතින් මිනිසුන් ඇවිද යන බව ඔවුන්ට දැනෙන බවත්, ඒ අඩි ශබ්ද ඔවුන්ට ඇසෙන

බවත් මට විශ්වාස ය.

ඉන් ඔවුන් කෝපයට පත්වන බව මම දැන සිටියෙමි.

"එයාට පුළුවන්ද මේක මගේ කාරයට ගෙනියන්න...?" තරුණ කාන්තාවක් මගෙන් ඇසුවාය. ඇය මට පත්‍ර අතර අඩක් සැඟව තිබූ විශාල වට්ටක්කා ගෙඩියක් පෙන්වූවාය.

"පුළුවන්." මම කීවෙමි. මම දෑතින්ම වැලේ තිබූ වට්ටක්කා ගෙඩිය කඩා ගන්නට වීමි. එය ටොන් එකක් පමණ බර වට්ටක්කා ගෙඩියකි. මම වයස අවුරුදු දොළහක ළමයෙක් මි.

නමුත් එය මගේ රාජකාරිය විය. මම දෑතින්ම ලොකු වට්ටක්කා ගෙඩිය අල්ලා ගත්ම...

මම තිගැස්සුණෙමි. ඒ එහි වූ සීතල බව වෙනස් වූ බැවිනි. එය මෘදු වෙන්නට විය. තම්බන ලද අර්තාපල් ගෙඩියක් මෙන් මෘදු විය.

මගේ දෑත වට්ටක්කා ගෙඩිය තුළට ගියේය.

එහි මෘදු වට්ටක්කා මදය දක්වාම මගේ දෑත ගිලිණ.

කාන්තාව කෑ ගැසුවාය. "මොනවද ඔයා ඒ කරේ...? ඇයි මගේ වට්ටක්කා ගෙඩියට එහෙම කරේ...?"

"මම... මම එහෙම කළේ නැහැ." මම කීවෙමි.

මගේ දෑතම වට්ටක්කා ගෙඩිය තුළ ගිලී තිබිණ. මම දෑත පිටතට ගන්නට උත්සහ කළද දෑත පිටතට ආවේ නැත.

"හේයි... මගේ අත් ඇලවිලා." මම කෑ ගැසුවෙමි.

"ඔයාට පිස්සුද...? ඇයි ඔයා එහෙම කරන්නේ...?" කාන්තාව විමසුවාය.

"නැහැ... මම ... මම ඇලිලා." මම කීවෙමි. "මට අත් එළියට ගන්න බැහැ. මේ වට්ටක්කා ගෙඩිය... ගම් එකක් වගේ."

ඇය හිස සෙලවූවාය. "ඔයා විහිළු කරනවා නේද...?"

මගේ පියා ඉක්මනින් අප වෙත ආවේය. "මොකක්ද මෙතන ප්‍රශ්නෙ...?" ඔහුගේ දෑස මගේ අතේ වූ වට්ටක්කා ගෙඩිය වෙත යොමු විය. "වට්ටක්කා ගෙඩිය බිම දාන්න ඩෙවින්..." ඔහු කීවේය. "ඇයි ඔයා ඒක විනාශ කළේ...?"

ඔහු වට්ටක්කා ගෙඩිය ගලවා ගත්තේය. සනකම් තැඹිලි පැහැ වට්ටක්කා යුෂ මගේ ඩෙනිම් කමිසයේ තැවරිණ.

ඔහු කාන්තාව වෙත හැරුණේය. "ඔයා කැමති වෙන වට්ටක්කා ගෙඩියක් තියෙනවද...?"

කාන්තාව තවත් ලොකු වට්ටක්කා ගෙඩියක් පේනවූවාය. "අරක හොඳයි."

"ඩෙවින් ඒක අරගෙන යයි." පියා කීවේය. ඔහු මාව ඇය පෙන්වූ වට්ටක්කා ගෙඩිය වෙත යොමු කළේය.

මා අසලින් හමමින් තිබුණේ දුර්ගන්ධයකි. වට්ටක්කා යුෂ තෙතබරිත මෙන්ම ඇලෙන සුළු විය.

මම පහත් වූයෙමි. ඉන්පසු වට්ටක්කා ගෙඩිය වැලෙන් වෙන් කර ගතිමි. අනතුරුව එය පපුවට තද කර ගතිමි.

**"ඕහ්හ්හ්හ්."** වට්ටක්කා ගෙඩිය මෙලෙක් වී එයට මගේ අත් ගිලා බසින විට මට කෑ ගැසිණ.

පියාගේ මුහුණ රත් පැහැ විය. ඔහු වේගයෙන් ඇසිපිය සැලුවේය. ඔහු එසේ කරන්නේ කෝප වූ විට ය.

"ඩෙවින්..." ඔහු කතා කළේ දත්මිටි කමිනි. "ඔයාගේ රාජකාරිය ඉවරයි. ගෙදර යන්න."

තාත්තා මම..." මම තර්ක කරන්නට වීමි. නමුත් වට්ටක්කා සම්බන්ධයෙන් මගේ වරදක් නැති බව මට ඔප්පු කළ නොහැක.

"සමාවෙන්න." මම මිමිණුවෙමි.

කාන්තාව අපහසුතාවයට පත් වී සිටියාය. මගේ පියාගේ මුහුණ තක්කාලි ගෙඩියක් මෙන් රතු වී තිබිණ. මම වට්ටක්කා වගා බිමෙන් පිටව යන්නට වීමි.

මගේ කමිසය වට්ටක්කා යුෂවලින් වැසී තිබිණ. මම හිස බිමට නමාගෙන ඇවිද යන විට කෙඳිරීම නැවත ඇසෙන්නට විය.

**"ඩෙව්ව්ව්ව්ව්ව්ව්ව්න්........ ඩෙව්ව්ව්ව්ව්ව්ව්න්..........."**

මගේ සිරුර වෙව්ලන්නට විය. මා කිසිදු දිනක මෙතරම් බිය වී නැත. හුදෙකලා වී නැත.

නේවුඩ් මිනිසෙකු ගෙන් මුදල් ගන්නා අන්දම මට දැකිය

හැකි විය. මම මඩුව වෙත දිව ගියෙමි. මගේ හිස තුළ කෙඳිරිලි හඬ දෝංකාර දෙමින් තිබිණ.

මම කෙලින්ම ඔහු වෙත ගියෙමි. "මට උදව් කරන්න. එයාලා මාව අල්ලා ගන්න යන්නේ..."

"කවුද...? කවුද ඔයාව අල්ලා ගන්න යන්නේ...?"

"මම... මම දන්නේ නැහැ." මම කීවෙමි. "වට්ටක්කා ගෙඩි... අර වැල්... හැමදෙයක්ම... ඔයා මට උදව් කරනවද...? ඔයා දන්නවානේ මේ ගොවිපළ ගැන හැමදේම. හේවුඩ්... මොනවද ඔයාට කරන්න පුළුවන්...?"

ඔහු බිම බැලුවේය. ඔහු බලා සිටින දෙස මම බැලුවෙමි. ඒ මඩුව ඉදිරිපස සිට අප දෙස බලා සිටින කළු බළලා දෙස ය.

"නැහැ... මට බැහැ." හේවුඩ් පැවසුවේ බළලා දෙස බලාගෙනම ය. "මට ඔයාට උදව් කරන්න බැහැ ඩෙවින්... සමාවෙන්න."

"ඔයා උදව් කරන්නම ඕන." මම කීවෙමි. මම ඔහුගේ ඇඳුමෙන් තදින් අල්ලා ගතිමි. "ඔයා මට උදව් කරන්න ඕන. රෑ කෑමෙන් පස්සෙ මාව හමුවෙන්න. අපි කතා කරමු."

ඔහුගේ බැල්ම තවමත් කළු බළලා වෙත යොමුව තිබිණ. "මට... මට ඒක කරන්න බැහැ."

"ඔයා එන්නම ඕන." මම ඔහුගේ කමිසය අත හරිමින් කීවෙමි. "රෑ කෑමෙන් පස්සේ... ගොවි ගෙදරට එන්න. මම ඔයාව ගෙදර පිටිපස්සෙදි හමුවෙන්නම්. අනේ..."

කෙඳිරිලි හඬ වේගවත් විය. වට්ටක්කා ගෙඩි ගොවි බිමේ සිට මා දෙසට රෝල් වෙන බව මට දැකිය හැකි විය.

**"ඩෙවිවිවිවිවිවිවිවින්........ ඩෙවිවිවිවිවිවිවින්.........."**

මගේ සවන් තුළ එය දෝංකාර දුනි.

Scanned by CamScanner

# 17

මට මගේ රෑ කෑම වේල කන්නට නොහැකි විය. රෑ කෑමට තිබුණේ ස්පැගටි සහ මස් බෝල ය. මස් බෝල මට පෙනුණේ කුඩා රවුම් වට්ටක්කා ගෙඩි මෙනි. ස්පැගටි දඟර ගැසුණු වට්ටක්කා වැල් මෙන් විය.

බානස් තෝනා අතුරුපසට වට්ටක්කා පුඩිමක් සාදා තිබුණාය. එය දුටු මට වමනය යන්නට ආසන්න විය.

කිසිවෙකුත් එය දුටුවේ නැත. හැමෝම මා ගැන අවධානය යොමු කළ නොහැකි තරම් සතුටින් සිටියහ.

ඔවුහු සියලු දෙනාම එකවර කතා කරමින් සහ සිනාසෙමින් සිටියහ. පියා සිටියේ සතුටුදායක මුහුණිනි. ඔහුගේ වට්ටක්කා ගොවිපළක අදහස හොඳ ප්‍රතිඵල අත්කර දී තිබිණ.

කෑම මේසයේ සිටි නිශ්ශබ්දම පුද්ගලයා මම වීමි. අපගේ නිවසට පිටුපසින් වූ අද්භූත ක්‍රියාදාමය දැන සිටි එකම පුද්ගලයා ද මා ය.

රෑ කෑමෙන් පැය කිහිපයකට පසු මම නිවසින් පිටතට ගොස් හේවුඩ් පැමිණෙනතුරු බලා සිටියෙමි. එය සීතල රාත්‍රියකි. පුරා හඳ අහසේ පහතින් පායා තිබිණ.

මම නිවසට පිටුපා සිටගතිමි. මගේ දෑත සීතලව තිබිණ. මා සිටියේ දෑත් කලිසම් සාක්කුවල දමාගෙන එහා මෙහා ඇවිදිමිනි.

ඔහු කොහේද...?

එක්වරම මට වට්ටක්කා වැල් දක්නට ලැබිණ. වට්ටක්කා වැල් ගොවි බිමෙන් ඉහළට එසවෙමින් තිබිණ. ඒවා සර්පයින් මෙන් තණගොල්ල දිගේ නිවස වෙත ඇදෙන්නට විය.

සඳ එළිය ඉතා දීප්තිමත් ය. මට හැමදෙයක්ම වඩා

Scanned by CamScanner

හොඳින් දැකිය හැකි විය. ඒ නිසාම මා දෙසට බඩගාමින් ඇදෙන වට්ටක්කා වැල් මට හොඳින් දිස් විය.

ඒවා දඟර ගැසෙමින් එකිනෙක පැටලෙමින් දඟලමින් මා කරා ඇදෙන්නට විය. ඒවාගේ ගමන ඉතා වේගවත් විය.

හේවුඩ් කොහේද...? මට ඔහු අවශ්‍ය විය.

බියෙන් වට්ටක්කා වැල් දෙස බලා සිටින මට පස මත සෙලවෙන යමක් දැකිය හැකි විය. ගෙවත්තේ කෙළවරින් වට්ටක්-කා වගා බිම ආරම්භ වන ස්ථානයෙන් කිසිවක් ඉහළ නැගෙන අන්දම මට දැකිය හැකි විය.

ඒ කුඩා සතෙක්ද...? නැත.

එය අතකි. සඳ එළියට මට එය මිනිස් අතක් බව හඳුනාගත හැකි විය. එය පස් තුළින් පිටතට එමින් තිබිණ.

මට වඩාත් හොඳින් එය දැකිය හැකි විය. මා බලා සිටියදී අතේ ඇඟිලි සෙලවී පොළොව අල්ලා ගත්තේය. ඉන්පසු පස් තැවරුණු අත ඉදිරියට දිගු විය.

මට අතේ කබා කෙළවර දැකිය හැකි විය. ඉන්පසු අනිත් අතද පස් යටින් පිටතට දිගු විය. අත් දෙකකි.

ඉන්පසු පොළොවෙන් මතු වූයේ හිසකි. හිස පොළොවෙන් මතු වූ පසු උරහිස් පිටතට එන්නට විය.

අනතුරුව අත් දෙක තණගොල්ලට තද කර සිරුර පිටතට ගන්නට විය. කෙමෙන් කෙමෙන් පොළොව යටින් සිරුර පිටතට ඇදෙන්නට විය. ඒ නැගිටින්නේ මිනී වළකින්ද...?

කිසිවෙක් මිනී වළකින් පිටතට පැමිණෙමින් සිටින්නේද...?

මට සෙලවිය නොහැකි විය. හුස්ම ගත නොහැකි විය.

මා බලා සිටියදී ඔහු මුහුණේ වූ පස් පිස දමා ගත්තේය. ඉන්පසු කබාය පිස දා ගත්තේය. කලිසම් කකුල් පිසදා ගත්තේය.

අනතුරුව ඉදිරියට එන්නට විය. සඳ එළිය පතිත ව ඇති පෙදෙසට පැමිණෙන විට මම ඔහු හඳුනා ගත්තෙමි.

ඒ හේවුඩ් ය.

Scanned by CamScanner

# 18

මගේ සිරුර බියෙන් සීතල විය. මම දෙනෙත් කුහර තුළින් පිටතට පනිනතුරු සඳ එළියේ පැමිණෙන පුද්ගලයා දෙස බලා සිටියෙමි.

හේවුඩ් මිය ගිය අයෙක්ද...? ඔහුත් වට්ටක්කා ගොවි බිමේ වළලන ලද අය අතරින් එක් අයෙක්ද...?

මම අවතාර චිත්‍රපටවලට අකැමති අයෙක්මි. මා සිතුවේ ඒවා විකාර කියා ය. නමුත් දැන් මා ඉදිරියේ සජීවී අවතාරයක් ඇත.

එක්වරම මට කිසිවක් සිහිපත් විය. මම හේවුඩ්ගෙන් ඔහු ජීවත් වෙන තැන ගැන වරක් විමසුවෙමි. ඔහු අත දිගු කර පෙන්වූයේ වට්ටක්කා වගා බිම ය. ඔහු කීවේ ඔහු පියා සමග එහි වාසය කරන බව ය.

දැන් ඔහු තම මිනී වළෙන් නැගිට ගෙවත්ත හරහා මා වෙතට පැමිණෙමින් සිටියි. මා ඔහුට පැමිණෙන ලෙස දැන්වූ තැනට පැමිණෙමින් සිටියි. ඔහුට මෙහි පැමිණෙන ලෙස ආරාධනා කළේ මා ය. ඉල්ලා සිටියේ මා ය. මම ඔහු ගෙන් උදව් ඉල්ලූයෙමි.

නමුත් ඔහු පැමිණෙන්නේ මට උදව් කිරීමට නොවේ. එසේ නම් ඔහුගේ සැලසුම කුමක්ද...?

මම සැඟවීමට තැත් කළෙමි. එතනින් පලා යාමට කාලය ප්‍රමාණවත් නොවිණි. මම අඳුරේම බිත්තියට තද වූයෙමි. මගේ හදවත වේගයෙන් ගැහෙමින් තිබුණේ මගේ පපුව පවා රිද්දමිනි.

''ඩෙවිත්...? මට ඔයාව පේනවා.'' හේවුඩ් කීවේය. ''ඔයා ඔතන හැංගිලා නේද ඉන්නේ...? මම ආවේ ඔයාට උදව් කරන්න.''

Scanned by CamScanner

මම බිත්තිය අසලින් ඉවත් නොවුණෙමි. "නැහැ... එපා." මම මිමිණුවෙමි. "මට තවත් ඔයාගේ උදව් ඕන නැහැ. ස්තූතියි."

"ඔව්... ඔයාට ඕන." ඔහු පැවසුවේය. "ඔයාට මගේ උදව් ඕන."

"එපා." මම කීවෙමි. එය විලාපයක් බඳු විය. මට මගේ සිතුවිලි සඟවාගත නොහැකි විය.

"මම ආවේ ඔයාට උදව් කරන්න." ඔහු නැවතත් කීවේය. "ඔයා මගේ යාළුවෙක්... මම මේ ගොවිපළ ගැන ඕරම දන්නවා ඩෙවින්... මම දන්නවා මිනිස්සු ආරක්ෂා කරන්න ඕන විදිහ."

ඔහු සෙවනැලි අතරට අඩිය තැබුවේය. මම වෙව්ලීම නවතා ගන්නට උත්සහ කළෙමි. "මම... මම දැන් ගේ ඇතුළට යනවා." මම කීවෙමි. "දවස තිස්සෙම් අර වට්ටක්කා ගෙඩි උස්සලා මට හරිම මහන්සියි."

"මාත් එන්නම් ඔයත් එක්ක." ඔහු කෙඳිරුවේය. "මට තියෙනවා ඔයාට කියන්න දෙයක්. වැදගත් දෙයක් ඩෙවින්."

"එපා... මට හරිම මහන්සියි... හෙට කියනවද ඒක...?"

මට ඔහුගේ මුහුණ පෙනුණේ නැත. නිවසේ සෙවනැල්ල අප මත පැතිර තිබිණ.

"මේ සියලු ශාන්තුවරයින්ගේ රාත්‍රිය." ඔහු පැවසුවේය. "මට ඒ ගැනයි ඔයාට කියන්න ඕන. මේ ගොවිපළේ ආරක්ෂා වෙන්න."

මගේ මොළය විකාර වී තිබිණ. මා ඔහු ගෙන් ගැලවී පලා යන්නේ කෙසේද...?

ඔහු පොළොවෙන් මතු වන අන්දම මම දුටුවෙමි. ඔහු කිසියම් ආකාරයක අවතාරයක් බව මම දැන සිටියෙමි.

ඔහු මා වෙත ආවේය. මට ඔහුගේ සිනාව ඇසිණ. "ඩෙවින්... ඔයා බය වෙලා වගේ පේන්නේ."

"මොනවා...? මම...? වෙන්න බැහැ."මම කීවෙමි. නමුත් මගේ වෙව්ලන කටහඬින් මා බියවී ඇති බව පෙනිණ.

Scanned by CamScanner

"ඇයි ඔයා වෙව්ලන්නේ...?" ඔහු ඇසුවේය.

"මෙතන... මෙතන... හරි සීතලයි." මම තෙපලුවෙමි.

ඔහු ඒළඟට පැවසූ දෙයින් මගේ මුළු සිරුරම හිරිගැස්සිණ. "මිනී වළ ඇතුළෙත් සීතලයි ඩෙවින්."

ඔහු මගේ අතේ වළලුකර අසලින් අල්ලා ගත්තේය. ඉන්පසු ඉදිරියට ඇද්දේය.

මා වැටෙන්නට ආසන්න විය.

මගේ වළලුකර ඔහුගේ අතට හිර වී තිබිණ. එය සීතල ලෝහ අඬුවක් මෙන් විය.

මම අත නිදහස් කර ගන්නට උත්සහ කළෙමි. නමුත් ඔහුට වූයේ පුදුමාකාර ශක්තියකි.

"මිනී වළත් සීතලයි." ඔහු නැවතත් කීවේය.

"මට යන්න දෙනවා... මො... මොනවද ඔයාට ඕන...?" මගේ කටහඬ වෙව්ලමින් නැගිණ.

"මට ඕන ඔයා මාත් එක්ක එක්ක යන්න." ඔහු මෘදු ලෙස පැවසුවේය. ඔහුගේ ඇටකෝටු ඇඟිලිවලට මගේ වළලුකර සිරවී තිබිණ. "මට ඕනේ ඔයාට මගේ මිනී වළ පෙන්නන්න."

"එපා... යන්න දෙනවා... යන්න දෙනවා..."

මගේ සිරුර පුරා විදුලියක් විහිදිණ. මම දැඟලුවෙමි. "යන්න දෙනවා..."

නමුත් ඔහුගේ අතින් නිදහස් වෙන්නට තරම් මා ශක්තිමත් නොවීය.

ඔහු මාව තෙත තණකොළ්ල දිගේ ඇදගෙන ගියේය. මා දැඟලුවද ඔහු මට වඩා බලවත් විය.

"නවතින්න." මම කෑ ගැසුවෙමි. "මට ඕන නැහැ ඔයාගේ මිනී වළ බලන්න. මට යන්න දෙන්න."

ඔහු හැරුණේය. ඔහුගේ දෑසේ වූයේ හිස් බැල්මකි. එය බෝනික්කි දෑසක් මෙන් විය. "ඒක රිදෙන්නේ නැහැ." ඔහු කොඳුරමින් පැවසුවේය.

"රිදෙන්නේ නැහැ...? මොකක්ද රිදෙන්නේ නැත්තේ...?"

Scanned by CamScanner

මම කෑ ගැසුවෙමි.

"මැරෙන එක රිදෙන්නේ නැහැ ඩෙවින්... ඔයාටම බලා ගන්න පුළුවන්."

"එපා... අනේ එපා."

ඔහු නැවතත් මාව ඇද ගෙන යන්නට වූයේය. ඒ තණකොළ්ලේ සිට වගා බිම වෙත ය.

ඔහු මාව ඔහුගේ මිනී වළට ගෙන යනු ඇත.

මම දෙවරක්ම නිවස දෙස හැරී බැලුවෙමි. මගේ දෙමව්පියන්ට කෑ ගසා කතා කරන්නට උත්සහ කළෙමි. නමුත් සීතල නිසා නිවසේ ජනෙල් සියල්ලම වසා තිබිණ. විදුලි පහන් නිවා දමා තිබිණ. සියලු දෙනාම සිටියේ නින්දේ ය.

ඔවුන්ට මගේ කෑ ගැසීම නොඇසෙනු ඇත.

හේවුඩ් මාව දඟලන, සෙලවෙන වට්ටක්කා වැල් මතින් ඇදගෙන ගියේය. මා ඒවා පසුකර යන විට ඒවා ඇදුණේ මාව අල්ලා ගන්නට මෙනි. නමුත් ඔහු මාව ඒවාට මා අල්ලා ගත නොහැකි ලෙස ඇදගෙන ගියේය.

කිසිවෙකුටවත් මා බේරා ගත නොහැක. ඔහු වඩා ශක්තිමත් අයෙකි.

මම නැවතත් කෑ ගැසීමට මුව විවර කළෙමි. නමුත් කිසිවෙකුත් පෙනෙන තෙක් මානයක නැත. මට උදව් කිරීමට කිසිවෙකුත් නැත.

එවිටම මගේ දෑස ගොවි බිමේ කෙළවරක සිටින රූපයක් වෙත යොමු විය. ඒ සමගම මා තුළ මඳ බලාපොරොත්තුවක සේයාවක් ඇති වූයේ නිතැතිනි.

"සීයුස්..." මම කෑ ගැසුවෙමි. "සීයුස්... ඔයා තමයි සොහොන් ස්වාමියා... ඔයාට පුළුවන් මට උදව් කරන්න."

මගේ වදන් ඇසුණු බළලා හිස ඔසවා මදෙස බැලුවේය. ඔහුගේ කොළ පැහැ දෑස සඳ එළිය පතිත වී දිලිසෙමින් තිබිණ.

"සීයුස්... මම දන්නවා ඔයා කවුද කියලා. මම දන්නවා ඔයාට මෙහෙ ඉන්න හැමෝම පාලනය කරන්න පුළුවන් කියලා...

Scanned by CamScanner

සියුස් අනේ... මට උදව් කරන්න. හේවුඩ්ව නවත්තන්න... නවත්තන්න එයාව.''

බළලා තම හිස පහත් කළේය. ඔහු අප දෙසට අඩියක් තැබුවේය. තවත් අඩියක් තැබුවේය.

හේවුඩ් බළලා දෙසට හැරුණේය.

''ඔව්.'' මම කෑ ගැසුවෙමි. ''එයාව නවත්තන්න. ඔයා තමයි සොහොන් ස්වාමියා... ඔයාට පුළුවන් ඒක කරන්න... මට උදව් කරන්න... උදව් කරන්න සියුස්.''

බළලා වගා බිම මැදින් අප වෙත එන්නට විය. ඔහු හිස එසවූ අතර ඔහුගේ බබළන දෑස හේවුඩ් වෙත යොමුව තිබිණ.

''එයාව නතර කරන්න සියුස්.'' මම විලාප නැගුවෙමි.

# 19

බළලා හේවුඩ් දෙස බලන විට මම හුස්ම අල්ලා ගතිමි. අප වටා වූ මහත වට්ටක්කා කොළ සීතල ඔක්තෝබර් සුළඟට හසු වී වැනෙමින් තිබිණ. බළලා දෙස බලා සිටින මගේ මුහුණට සඳ එළිය පතිත විය.

හේවුඩ් මගේ අතේ ග්‍රහණය තද කළේය.

බළලා හිස ඔසවා ඤාව් කීවේය. එය මෘදු කෑ ගැසීමකි.

හේවුඩ් හිස පසුපසට කර සිනාසුණේය. ඔහු පහත් වී නිදහස්ව තිබූ අතින් බළලාගේ නිකට යට පිරිමැද්දේ ය.

බළලා නැවතත් ඤාව් හඬ නැගීය.

හේවුඩ් මා දෙස බලා සිනාසුණේය. ''එයා බළලෙක්

Scanned by CamScanner

ඩෙවින්.''

මගේ මුව විවර විය. ''ඒත් ඔයා කිව්වේ...?''

''මම ඔයාව රැවැට්ටුවා.'' හේවුඩ් පැවසුවේය. ''ඔයාව හරි පාරෙන් අයින් කරන්න එහෙම කළේ. බළලා තමයි සොහොන් ස්වාමියා කියලා ඔයා හිතුවාම ඔයා ඒක විශ්වාස කරනවා. හරිම කණගාටුයි... මට පේනවා ඔයාගේ බලාපොරොත්තු සුන් වුණා කියලා. ඒත් සීයුස් කියන්නේ බළලෙක්. ලොකු, කම්මැලි බළලෙක්.''

''හෑඍඍඍඍඍඍඍඍඍඍඍඍඍඍඍඍඍඍ'' මම කෑ ගසද්දී හේවුඩ් නැවතත් මා ඇදගෙන යන්නට වූයේය. මම දෙපා පොළොවට බර කර තබා ගන්නට උත්සහ කළෙමි. නමුත් ඔහු මට වඩා ශක්තිමත් විය.

මගේ මනස අවුල්ජාලයක් වී තිබිණ. බිය නිසාම මට කිසිවක් කල්පනා වූයේ නැත.

''එහෙනම්... එහෙනම් ඔයාද සොහොන් ස්වාමියා...?'' මම ඇසුවෙමි.

ඔහු නැවතත් සිනාසුණේය. ''වැරදියි.'' ඔහු කීවේය. ''ඔයා හැමදේකදිම වැරදියි ඩෙවින්.''

ඔහු මාව වගා බිමේ වූ වළ වෙත ඇදගෙන ගියේය. එය වට්ටක්කා වැල් අතර සැඟුණකි.

මම වළ තුළට එබී බැලුවෙමි. වළ තුළ වූයේ දැඩි අඳුරකි. එය කෙතරම් ගැඹුරුද කියාවත් මට දැකිය හැකි නොවන තරම් අඳුරක් එහි විය.

නමුත් මම එය හඳුනා ගත්තෙමි. එය මිනී වළකි. ඒ මගේ මිනී වළ ය.

එක්වරම විවරව තිබූ මිනී වළට අඩි කිහිපයක් එහායින් වූ පස් සෙලවෙන්නට විය. එතන සිදුරක් සෑදී අතක් පිටතට ආවේය. එම අත සනකම් වට්ටක්කා වැලක් සොයා එහි එල්ලුණේය.

මා බියෙන් බලා සිටියදී අතේ ඇඟිලි වට්ටක්කා වැලේ දැවටිණ. සිදුවන්නට යන දේ මම දැන ගතිමි. තවත් අවතාරයක් තම මිනී වළෙන් නැගිටිමින් සිටියේය.

"ඔයාට ඕනද සොහොන් ස්වාමියාව හමුවෙන්න...?" හේවුඩ් ඇසුවේ මා බලා සිටින දෙස බලාගෙනම ය. "මෙන්න සොහොන් ස්වාමියා."

අපි දෙදෙනාම නිහඬවම දෙවන අතද පිටතට පැමිණෙන තුරු බලා සිටියෙමු. දෑතම වට්ටක්කා වැල් දෙකක එල්ලුණු පසු සිරුර පොළොවෙන් ඉහළට මතු වූයේය.

ඒ බානස් නෝනා ය.

ඇය නැගිටින විට පස් කැට එහා මෙහා විසි විය. මොහොතකට පසු තරබාරු කාන්තාව මා දෙස බලා සිනාසුණාය. ඇයගේ එක් අතක කිසිවක් විය.

ඒ වට්ටක්කා ගෙඩියකි.

"හොඳයි... හොඳයි... මෙන්න අපි ආවා." ඇය පැවසුවාය. "ඔයා දන්නවාද ඩෙවින් අද රෑ මොකක්ද කියලා...? අද රෑ තමයි ජැක් ලන්තෑරුම් රෑ."

ඇය වට්ටක්කා ගෙඩිය ඉහළට එසවූවාය. ඒ සමගම එය ආලෝකමත් විය. වට්ටක්කා ගෙඩිය තුළ තැඹිලි පැහැ ගිනි දළු දැල්වෙන්නට විය. වට්ටක්කා ගෙඩියේ විශාල දෑසක් සහ මුවක් සහිත රවාගත් මුහුණක් මට දක්නට ලැබිණ.

බානස් නෝනා බිහිසුණු ජැක් ලන්තෑරුම මගේ මුහුණට ළං කළාය.

"මේ තමයි ජැක් ලන්තෑරුම් රෑ ඩෙවින්... ජැක් ලන්තෑරුමේ මරණය තෙක් සිනාසීම... ඔයා ලෑස්තිද හිනාවෙලා මැරෙන්න."

"එපා... අනේ..." මම පසුපසට පනින්නට උත්සහ කරමින් කෑ ගැසීමි. නමුත් හේවුඩ් මාව තදින් අල්ලාගෙන සිටියේය.

"ජැක් ලන්තෑරුමේ හිනාව දිහා බලාගෙන ඉන්න." බානස් නෝනා පහ නොවූ සිනාවෙන් යුතුව කීවාය. ඇයගේ මහත කම්මුල්වල තවමත් පස් තැවරී තිබිණ. ඇය නාසයේ රැඳී සිටි පණුවෙකු ඇද බිමට දැමුවාය.

"ඒත් ඇයි මාවම...?" මම බියපත් හඬින් කෑ ගසා ඇසුවෙමි. "මට තේරෙන්නේ නැහැ."

Scanned by CamScanner

"ඒක ලේසියෙන්ම පැහැදිලි කරන්න පුළුවන්. මගේ පුතා හේවුඩ්ට යාළුවෙක් ඕන." බානස් නෝනා කිවාය. "මේ පොළොව යට හරිම පාළුයි. මැරෙන්න තරම් පාළුයි. හේවුඩ්ට ඕන එයාගේ වයසේ යාළුවෙක්."

මම ඇය දෙස දෑස විසල් කර බැලුවෙමි. "මම...? යාළුවෙක්...?"

"මේ වට්ටක්කා වැල්..." මම කීවෙමි. "ඒවා මගේ කාමරයට ආවා. අර වට්ටක්කා ගෙඩි.. කෙඳිරිලි ගබ්ද... ඒ සේරම දේවල් මට විතරයි වුණේ... මගේ පවුලේ කාටවත්ම කරදරයක් වුණේ නැහැ."

"ඒ මම ඔයාව තෝර ගත්ත නිසා." බානස් නෝනා පැවසුවාය. "ඔයා හේවුඩ්ගේ වයසේ. අවුරුදු එකසිය විස්සකට කලින් හේවුඩ් මැරෙනකොට එයාට වයස අවුරුදු දොළහයි. ඒ නිසා මම ඔයාව එයාගේ යාළුවා විදිහට තෝරා ගත්තා."

"ඒත්... ඒත්... මට තේරෙන්නේ නැහැ." කිව යුත්තේ කුමක්දැයි මා දැන සිටියේ නැත. ඇයව කතාවට අල්ලාගෙන සිටින්නට මම සිතුවෙමි. සමහරවිට...

"වෙලාව යනවා." බානස් නෝනා කිවාය. ඇය රවාගත් ජැක් ලන්තෑරුම තම හිසට ඉහළින් ඇල්ලුවාය. ඉන්පසු ඇය හේ-වුඩ්ට හිසින් සංඥාවක් කළාය.

හේවුඩ් මාව මිනී වළ වෙත තල්ලු කරගෙන යන්නට විය.

මගේ පාවහන් තෙතබරිත පොළොවේ ලිස්සා ගියේය.මම අන්ධකාර ගැඹුරු වළ වෙත ඇදී යන්නට විමි.

"ඔයාට ඕන ඒකට පනින්නද...?" හේවුඩ් මගේ කනට කෙඳිරුවේය. "නැතිනම් මම ඔයාව වළට තල්ලු කරන්නද...?"

Scanned by CamScanner

# 20

ඔහු පිටුපසින් සිට මගේ උරහිස් අල්ලා ගත්තේය. මගේ පාවහන් ලිස්සා ගොස් මීනී වළේ ගැටිය අසල නැවතිණ. එක තල්ලුවකින්... එකම එක තල්ලුවකින් මා නොපෙනී යනු ඇත.

ඔහුගේ ඇඟිලි මගේ උරහිසට තද වන අන්දම මට දැනිණ. ඔහු සිටියේ මා මීනී වළට තල්ලු කර දමන්නට සූදානමිනි.

එවිටම කැලෑ සතෙකුගේ බඳු කෑ ගැමක් ගොවි බිම පුරා පැතිර ගියේය.

මුලින්ම මා සිතුවේ එය මගේ මුවින් නැගුණු විලාපයක් කියා ය. නමුත් මොහොතක් වෙලා ගත වූ පසු එය වෙන කිසිවෙකු නගන විලාපයක් බව මට පැහැදිලි විය.

හේවුඩ්ගේ අත් මගේ උරහිස් මතින් ලිස්සා යනු මට දැනිණ. මම පිටුපස හැරුණෙමි. අපි දෙදෙනාම පිටුපස හැරුණෙමු. අප තිදෙනාට දක්නට ලැබුණේ ගොවි බිම හරහා අප වෙත දිව එන අයෙකි.

පැමිණෙන පුද්ගලයා කොළ පැහැති ඇඳුමක් ඇඳ සිටින බව සඳ එළියට මට දැකගත හැකි විය. එය දීප්තිමත් කොළ පැහැති ඇඳුමකි. සියලු ශාන්තුවරයින්ගේ සැදැවට අඳින ලද ඇඳුමකි. එමෙන්ම ඒ විලාපය ද කැලෑ මෘගයෙකුගේ බිහිසුණු විලාපයක් බඳු විය. එය නැගුණේ අප්‍රසන්න පෙනුමැති වෙස් මුහුණකට පිටුපසිනි.

වෙස් මුහුණද ඉරි තැලුණු කොළ පැහැති එකකි. එහි විවරව තිබූ මුව තුළ කැත උල් දත් දෙපළක් විය. වෙස් මුහුණේ වූ දිග කන් දෙක ඉහළට විහිද තිබිණ. එහි දෑස රතු පැහැ උමතු දෙනෙතකි.

Scanned by CamScanner

විලාපය කෝපාන්විත මෙන්ම උස් හඬින් කෙරුණකි. එය නොඇසෙන්නට දෙසවන් වසා ගැනීමට මට අවශ්‍ය විය.

හේවුඩ්ගේ සහ ඔහුගේ මවගේ තිගැස්සුණු මුහුණු මට දැකිය හැකි විය. ඔවුහු සඳ එළියේ ප්‍රතිමා මෙන් ගල් ගැසී සිටියහ. ජැක් ලන්තෑරුම ඇය අතින් ගිලිහී බිම පතිතව තිබිණ.

පැමිණෙන කෙනා දැත් විහිදාගෙන අප වෙත පැමිණියේය. ඔහුගේ විවර ව තිබූ මුවෙන් කෙළ වැස්සෙමින් තිබිණ.

ඔහු හැරුණේ මා දෙසට ය. ඒ රතු දෑස හැරී තිබුණේ මා වෙතට ය. මගේ මුළු සිරුරම වෙව්ලන්නට විය.

**"මේ මමමමමමමමමමමමමමම."** ඇය සතෙකු මෙන් කෑ ගැසුවාය. **"මේ මමමමමම... ලූලූලූලූ.......... ඇෑෑෑෑෑෑෑෑෑෑෑන්..."**

නැත. එය විය නොහැක. ඒ නම් මගේ මිතුරිය ලූ ඈන් විය නොහැක.

මේ කැලෑ සතෙකි. භයානක කැලෑ සතෙකි. අවතාරයකි.

**"මේමමමමමම...ලූලූලූලූ..........ඇෑෑෑෑෑෑෑෑෑෑෑෑන්..."** සතා නැවතත් කීවාය.

"කැහැ... වෙන්න බැහැ. වෙන්න බැහැ..." මම කෑ ගැසුවෙමි.

ඉන්පසු ඇය හේවුඩ් සහ බාතස් නෝනා වෙත හැරුණාය. ඇය පොළොව දෙදරා යන අන්දමේ, ගස් සෙලවී යන අන්දමේ විලාපයක් නැගුවාය.

**"යනවාාාාාාාාාා යන්න..."**

වෙස් මුහුණක් පැළඳි කෙනා ඔවුන් වෙත කඩා පැන්නේ බිහිසුණු ලෙස ගොරවමිනි. හේවුඩ් බිම ඇද වැටිණ. දෙනොම බිම පෙරලී ගියහ.

බියෙන් විසල් කරගත් දෑසින් යුතුව බාතස් නෝනා පසුපසට වූවාය.

ගොරවමින් හේවුඩ් සහ වෙස් මුහුණු සතා බිම පොර බැන්දහ. අවතාරය ගස් දෙදරුම් කන සේ නැවත වතාවක් ගෙරවූයේය.

Scanned by CamScanner

හේවුඩ් අවතාරයේ වෙස් මුහුණ ගලවා ගන්නට උත්සහ කළේය. නමුත් එය වෙස් මුහුණක් නොවන බව මට පැහැදිලි ය.

මම ගල් ගැසී සිටින බානස් නෝනා ද සමග කිසිවක් කර කියා ගත නොහැකිව සටන දෙස බලා සිටියෙමි. අවතාරය තම ඇඟිලිවලින් හේවුඩ්ගේ දෑස්වලට ඇන්නාය. හේවුඩ් වේදනාවෙන් කෑ ගැසීය.

ඔහු අවතාරයේ කන්වලින් අල්ලා ගෙන එයට පහර දුන්නේය.

අවතාරයේ මුවෙන් වැගිරෙන කොළ පැහැති සෙවල හේවුඩ් මත පතිත විය. අවතාරය ඔහුට පහර පිට පහර ගසමින් ඔහුගේ දෑස උගුල්ලා ගන්නට තැත් දැරිය.

බිහිසුණු සටන දෙස බලා සිටින විට මගේ ඔළුව කැරකෙන්නාක් සේ විය. අවතාරය දිනුවහොත් එය මා සමග සටන් කරාවිද...? හේවුඩ් දිනුවහොත් වන දේ මම දැන සිටියෙමි. ඔහු මාව ඔහුගේ මිනී වළ කරා රැගෙන යනු ඇත. නමුත් අවතාරය දිනුවහොත්...?

දෙදෙනාම තම දෙපාවලින් නැගිට තල්ලු කරමින්, ගහගහමින් විවරව ඇති මිනී වළ වෙත ළඟා වූහ.

එක්වරම හේවුඩ් අවතාරය ඔසවා ගත්තේය. ඔහු දෑතින් අවතාරයේ ඉණ අල්ලාගෙන එය ඔහුගේ හිසට ඉහළින් ඔසවා ගත්තේය. ඉන්පසු ගොරවමින් සිටින අවතාරය මිනී වළේ සිදුර වෙත ගෙන ආවේය.

අවතාරය දඟලමින් පයින් ගැසුවේය. නමුත් හේවුඩ් ශක්තිමත් අයෙකි. ඔහු අවතාරය මිනී වළට දමන්නට සැරසිණ.

ඒ සැබවින්ම ලූ ඇන් වුවහොත්...?

මම අවතාරයේ භයානක මුහුණ දෙස බැලුවෙමි.

ඒ ලූ ඇන් විය හැකිද...? එසේ වුවහොත් කුමක් වේවිද...?

මම පෙරට පැන්නෙමි. මගේ උරහිස් ඉදිරියට නමා හේ-වුඩ්ට තද පහරක් දුන්නෙමි.

ඔහු පසුපසට විසිවී වැටිණ.

Scanned by CamScanner

අවතාරය ඔහු අතින් ලිස්සා ගියේය. අවතාරය කෙමෙන් කෙමෙන් මිනී වළ තුළට වැටෙන්නට විය.

මම වහා හැරී අවතාරය අල්ලා ගත්තෙමි. ඉන්පසු ප්‍රවේසමෙන් ඇගෙන බිමින් තැබුවෙමි.

හේවුඩ් කෝපයෙන් ගොරවමින් මට පහර දෙන්නට පෙරට ආවේය. මම පසුපසට පැන ගතිමි. ඔහු මිනී වළ තුළට ඇද වැටිණ. පහතට ඇදී යන ඔහුගේ බියකරු විලාපය මට ඇසිණ.

''යක්ෂයා...'' බානස් නෝනා අවතාරයට කෑ ගැසුවාය. ''යක්ෂයා...'' ඉන්පසු ඇය ද තම පුතුයා පසුපසම මිනී වළට පැන අතුරුදහන් වූවා ය.

මම හති දමමින් ඔවුන් ආපසු පැමිණෙනතුරු බලා සිටිංයෙමි. නමුත් මිනී වළ අන්ධකාර මෙන්ම නිශ්ශබ්ද විය.

මම අවතාරය වෙත හැරුණෙමි. එය ශබ්ද නැගෙන සේ ආශ්වාස කරමින් දෑත පපුව හරහා බැඳගෙන බලා සිටියාය. එහි රතු දෑස මා වෙත යොමුව තිබිණ. ''ඔයා මගේ ජීවිතය බේරුවා.'' එය ගෙරවීමක් හා නැගුණු කෙඳිරියකි.එක්වරම එහි මුහුණ බුරුල් වෙන බවක් පෙනිණ. රතු දෑස බොඳව ගියේය. උල් දත් පේළි එල්ලා වැටිණ. පුදුමයට පත්ව මා බලා සිටියදී එය හිසෙන් අල්ලා මුහුණ ගලවා ගත්තේය.

එය වෙස් මුහුණකි.

''ලූ ඈන්...'' මම කෑ ගැසුවෙමි. ''ඒක වෙන්න බැහැ.''

ඇය පිළිතුරක් දුන්නේ නැත. ඇය විශ්වාස කළ නොහැකි ලෙසින් ඇය අත වූ වෙස් මුහුණ දෙස බලා සිටියාය. ''ඒක ගැලවුණා.'' ඇය කොඳුරන හඬින් තෙපලුවාය. අනතුරුව තවමත් එය අදහාගත නොහැකි ලෙසින් හිස සෙලවූවාය.

''ඩෙවින්... ඔයා... ඔයා මගේ ජීවිතය බේරුවා.'' ඇය කීවාය. ''කරුණාවන්ත විදිහට රඟපෑවා. ඔයා හිතුවේ මම අවතාරයක් කියලා නේද...? ඒත් ඔයා මගේ ජීවිතය බේර ගත්තා. විශ්වාස කරන්න බැරි විදිහට ඔයා කරුණාවන්ත වුණා.''

මම ඇය වෙත ගියෙමි. ''ලූ ඈන්... මම දන්නේ නැහැ

ඔයා කතා කරන්නේ මොනවා ගැනද කියලා...''

ඇය අත වූ වෙස් මුහුණ පෙන්වූවාය. ''මේ වෙස් මුහුණ ගැලවෙන්න නම් කරුණාවන්තව රඟපාන්න ඕන. එහෙම තමයි මාර්කස්ගේ තාත්තා කිව්වේ. කරුණාවන්ත රඟපෑමක්... ඒත් ඒක කරන්න ඕන මම නෙවෙයි. ඔයා දැක්කා නේද ඩේන්...? ඒක වෙන කවුරුහරි කරන්න ඕන කරුණාවන්ත රඟපෑමක්.''

''ලූ ඈන්... මට තවම තේරෙන්නේ නැහැ.''

ඇය සිනාසුණාය. ඉන්පසු ඇය වෙස් මුහුණ ගොවි බිම හරහා ඈතට විසි කර නටන්නට වූවාය. ''මම නිදහස්... මම හොඳින්... මම නිදහස්... ඩේවිත්... මේ මම.''

ලූ ඈන් හිසට අතින් ගසා ගත්තාය. අනතුරුව මාව වැළඳ ගත්තාය.

''ඒ වෙස් මුහුණ මගේ මුහුණට ඇලිලා තිබුණේ. ඒකෙන් මාව යක්ෂයෙක් වුණා. මම දිව්වා දිව්වා.'' ඇය තෙපලුවාය. ''මම දැනගෙන හිටියෙ නැහැ යන්න ඕන කොහෙද කියලා... මට මතක් වුණා ඔයාගේ ගොවිපළ.''

''ඔයා හොඳින්.'' මම කීවෙමි. ''මමත් හොඳින්... අපි දෙන්නාම හොඳින්.''

ඇය හිස පසුපසට කර සිනාසුණාය. ''සුබ සියලු ශාන්තුවරයින්ගේ දිනයක් ඩේවිත්...''

''ඔයාටත් එසේම වේවා.'' මම කීවෙමි. ''කොහොමද පොලීගේ සාදය...?''

Scanned by CamScanner

# අවසන් කොටස

# පොලීගේ සාදය

## පසු දිනය...

පොලී අට්ටාලයට ඇති පඩිපෙළ මුදුනේ සිට පඩිපෙළ දිගේ පේළි සෑදී සිටින ළමුන් දෙස බැලුවාය. "හරි...හැමෝම ලෑස්ති වෙන්න." ඇය කීවාය. "ඔයාලාගේ සල්ලිත් ලෑස්ති කර ගන්න."

ළමයි සිනාසෙමින් උද්යෝගිමත්ව කෑ කෝ ගසමින් සිටියහ. එක් පිරිමි ළමයෙක් අවතාරයක් මෙන් කෑ ගැසුවේය. **"ඕඕව්ඕඕඕඕඕඕඕඕඕ...."** අනිත් ළමයි එය අසා සිනාසුණහ.

පොලී ඔවුන්ගේ මුහුණු දෙස බලා සිටියාය. ඇයට ඔවුන් තුළ ඇති උද්යෝගය දැකිය හැකි විය.

"හරි... එක වතාවයි." ඇය කීවාය. "එයාලා බය වුනොත් ආපහු හැරිලා පහළ මාලයට දුවන්න."

ඇය වසා ඇති දොර අසලට ගියාය. නමුත් මාර්කස් සහ බ්‍රැඩ් ඉක්මනින් ඇය වෙත ළඟා වූහ. "පොලී... මොනවද මෙතන වෙන්නේ...?" මාර්කස් ඇසුවේය.

"ඔයාට ලූ ඇන් ගැන දැනගන්න ලැබුණද...?" බ්‍රැඩ් විමසීය. "එයා ඊයේ රෑ ඩෙවින්ගේ වට්ටක්කා ගොවිපළට ගිහින්."

පොලී තම හිස සෙලවූයේය. "මම ඒ ගැන දන්නේ නැහැ. ඒත්.... වාව්... ලූ ඇන්ට ස්තුතිවන්ත වෙන්න මගේ සාදය අවුරුද-'දේ හොඳම සාදය වුණා. හැමෝම දැන් කතා කරන්නේ ඒක ගැන."

"මොනවද එයාලා කියන්නේ...?" මාර්කස් ඇසුවේය.

"මාර්කස්... මගේ සාදය තමයි ඩේටොන් නගර

Scanned by CamScanner

ඉතිහාසයේම තිබුණු භයානකම සියලු ශාන්තුවරයින්ගේ සෑදෑ සාදය."

මාර්කස් සහ බ්‍රැඩ් සුසුම් හෙලූහ.

"අපි දැන්ම පටන් ගත්තේ නැද්ද...? අපිට අවතාරය බලන්න ඕන." පඩිපෙළේ සිටි පිරිමි ළමයෙක් කෑ ගැසීය.

"අවතාරය... අවතාරය... අවතාරය..." ළමයි උද්ඝෝෂණය කළහ. ඔවුන්ගේ කටහඬවල් අට්ටාලයේ පඩිපෙළෙහි දෝංකාර දුන්නේය.

"මොනවද ඔයා මේ කරන්නේ...?" බ්‍රැඩ් ඇසුවේය. "ඇයි මේ ළමයි පේළියක් හැදිලා...?"

පොලී තම වරලස ගෙල පිටුපසට දමා ගත්තාය. "එයාලාට ඕන කාමරයේ ඉන්න අවතාරය බලන්න. ලූ ඇන් ඊයේ රෑ එයාට පහර දුන්නා. එයා දැන් ඉන්නේ බය වෙලා. හැමෝටම එයාව බලන්න පුළුවන්."

"ඔයා... ඔයා එයාව පෙන්නන්න සල්ලි ගන්නවද...?"

බ්‍රැඩ් ඇසුවේය.

"ඩොලර් පහක්." පොලී කීවාය. "ඩොලර් පහක් ගෙවලා ඕන කෙනෙකුට ඇත්ත අවතාරයක් බලා ගන්න පුළුවන්."

"ඒත් පොලී..." මාර්කස් පැවසුවේය.

පොලී ඔහුව පඩිපෙළ වෙත තල්ලු කළාය. "යන්න පේළියට ළමයි... ඔයාලාට මෙතන ඉන්න බැහැ. දැන් පටන් ගන්න වෙලාව හරි."

බ්‍රැඩ් සහ මාර්කස් පඩිපෙළ වෙත ගමන් කරන්නට වූහ.

නමුත් පොලී ඔවුන්ට කතා කළාය. "හේයි... මේ බලන්න... මම හොයාගත්ත දේ." ඇය ඔවුන්ට පෙන්වූයේ අඳුරු නිල් පැහැ වෙස් මුහුණකි.

පිරිමි ළමයි දෙදෙනා ඒ දෙස හොඳින් බැලූහ. "ඒක හරියට ලූ ඇන් ඊයේ රෑ දාගෙන හිටිය වෙස් මුහුණ වගේමයි. ඔයා කොහෙන්ද ඒක හොයා ගත්තේ...?"

පොලී බිම තිබූ විවර කරන ලද පෙට්ටිය පෙන්නුවාය.

Scanned by CamScanner

''මම ඒක හොයාගත්තේ මේ පෙට්ටියේ තිබිලා. ඒකේ පෙනුම හරිම කැතයි නේද...? ඒක ලූ ඇත්ගේ වෙස් මුහුණ වගේමයි. මම දැන් ඒක දාගන්න යන්නේ...''

''මොනවා...?'' මාර්කස් කෑ ගැසුවේය.

''මම හදන්නේ ඒක දාගෙන මේ පේළියට ඉන්න ළමයි තවත් පුදුම කරන්න...''

''එපා...'' මාර්කස් කෑ ගැසුවේය. නමුත් පොලි ඔවුන්ට ඉවත්ව යන්නට සංඥා කළාය. ''ඔයාලා ළඟ ඩොලර් පහක් තියෙනවද...? යන්න පේළියට.''

''අපි නොමිලේම අවතාරය දැක්කානෙ.'' මාර්කස් කිවේය. ඔහු බ්‍රැඩ් ද සමග පඩිපෙල වෙත ගමන් කරන්නට විය. ඔවුන් පඩිපෙළ බසින්නට පෙර ඔහු නැවත වරක් හැරී බැලුවේය.

අවසන් වතාවට ඔහු දුටුවේ පොලි තිල් පැහැ අප්‍රසන්න වෙස් මුහුණ පැළඳ ගන්නා අන්දම ය.

- අවසානයි -

Scanned by CamScanner